
සැඟවුණු බොදු මග යළි පුබුදන

# හෙළ බොදු පියුම

ශ්‍රී බු. ව. 2556කේ වූ බක් මස (ව්‍යවහාරික වර්ෂ 2013 අප්‍රේල්)

18 වෙනි කලාපය

## ආදි පැරැණ්නන් දහමට අනුව
## පෙරදිග ධාන්‍යාගාරය
## ගොඩ නැගූ හැටි...



සැඟව ගිය බොදු මග යළි රැගෙන සෑම පුන් පොහෝ දිනකම එළිදකින දහම් සංග්‍රහය

# උපකාරයට
# කෘතෝපකාරයද මේ...?

සිතකට එන පහන් හැඟුමන් ඉටු වීම
නැති විට කබරගොයි තලගොයි කර කෑම
සතෙකුට වගේ මවු පියනට සැලකීම
පුතෙකුට වටිනවද මේ ගුටි බැට දීම

නොමැතිව පිළිසරණ දෑගලුව දරු කාලේ
විමතිව ලබන්නට රිසි දේ කළ ආලේ
පෙමැතිව දරු දුකින් සැනසුම දුන් තාලේ
කැමතිව දුකක් දෙද වයසට ගිය වේලේ

කෑදර කමින් මිල මුදලට යටව ගුණේ
ගේ දොර මිල මුදල් ලබනට කරන විනේ
ආදර වදන් දුන් මවු පියනට ද අනේ
ගී සර හඬින් බිය වැද්දුව පුතෙකු වුනේ

බුදුන් ළඟට දෙවු වූ මවු පිය දෙන්නා
පිදුම් ලබන්නට ලොව ගුණයෙන් ඉන්නා
හොඳුන් නිසා හිතු හිතු දේ පිනවන්නා
රිදුම් දෙවයි අදහස ගෙන පළි ගන්නා

මතක නැති නමුත් පෙර කල විඳපු දුක
නොතක ඉඳ හැකිද මවු පිය ගුණය දැක
සිතක තිබේ නම් කළ ගුණ කියන එක
අතක හයිය පෙන්නාවිද නැතිව සැක

බස් දුන් මවු පියන්ටත් නොමැතිව මියුරු
දොස් දී කිපී කැළඹුණු ලෙස මහ සයුරු
හිස් ලූ අතේ දුවමින් වැටිලා වියරු
ඇස් නැති එවුන් සේ නිරයට යන අයුරු

සලකනු නොහැකි විට ගුණයට දරුවන්නේ
වළකට වැටුණු විට නැත පිහිටක් එන්නේ
කළ ගුණය දෝ මේ වළ පල්ලට යන්නේ
මළගිය දිනක මේ පව් පටිසන් දෙන්නේ

කර දඬු මහත් වී එන විට මැකෙන ගුණේ
දරදඬු කමින් සලකන විට මතුව පෙනේ
මරණය ළඟදී සිහි වෙන විට කරපු විනේ
කරනට දෙයක් නැත දැන් එල දෙනව හෙණේ

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන



# බොදුනුවන්ට පහළ වන සද්ධා මහා නිධානය

(පසුගිය කලාපයෙන් - අපි නොදත් සසර ගනුදෙනුවල හැටි)



බෞද්ධයාගේ පරමාර්ථ සතර මහ නිධානය සෝවාන් ඵලය, සකෘදාගාමී ඵලය, අනාගාමී ඵලය, අරිහත් ඵලයයි කියල පසුගිය කලාපයෙන් පෙන්වා දුන්නා. නිධන් කරන්න නම් ධන සම්පත් තියෙන්න ඕන. පෙර යම් පැතුමක් හේතුවෙන් මෙබඳු ජීවිතයක් ලැබිල තියෙන නිසා, ඒ ජීවිතේ ගත කරන්න වෙනවා. රජුන්ගෙන්, සොරුන්ගෙන්, ණය ගත්තොත් ණය හිමියන්ගෙන්, (මේ අත් බැව්දී ණය නොගත්තත් පෙර සසරදී ආපසු නොගෙවූ ණය හිමියනුත් ඉන්න පුළුවන්) රෝග පීඩාවලින්, දුර්භික්ෂ වගේ ස්වභාවික විපත්වලින් මේ ජීවිතයට එල්ල වන විවිධ භයවලින් අඩුවක් නෑ. ඒ වගේ වෙලාවට ඒවායින් මිදෙන්න, සහනයක් ලබාගන්න, උපයන මුදල්වලින් කොටසක් පොළව යට තැන්පත් කරන එක ඈත අතීතයේ පැවතිච්ච සිරිතක්. ඛු.නි. (1), 17 පිටුවේ එන <u>නිධිකණ්ඩ සූත්‍රයේ</u> මේ ගැන විස්තර කරල තියෙනවා. ඒ විදියට තැන්පත් කරන මුදල්, රන් රිදී ආදිය කාලයක් ගතවෙන කොට තැන්පත් කරපු තැන අමතකවීම, සොරුන් හෝ තමන් අකමැති උරුමකරුවන් පොළොව හාරා ඉවත් කර ගැනීම, යක්ෂ නාග ආදීන් විසින් තිබූ තැන වෙනස් කිරීම වගේ විවිධ ක්‍රමවලින් තමන්ට අහිමි වෙන්න පුළුවන් බවත් පෙන්වා දීල තියෙනවා. හැම තිස්සෙම, හැමෝටම එහෙම නොවෙන්න පුළුවන්. නමුත් ඒ ධනයෙන් ලැබෙන ප්‍රයෝජනය නම් මේ ජීවිතේට විතරයි.

''..... චෛත්‍යය කෙරෙහි ද, සංඝයා කෙරෙහි ද, යම් පුද්ගලයෙකු කෙරෙහි ද, ආගන්තුකයෙකු කෙරෙහි ද, පියා කෙරෙහිද, මව කෙරෙහිද, නැවත වැඩිමහලු සහෝදරයා (හෝ සහෝදරිය) කෙරෙහි ද දානාදී විදියෙන් මනා සේ තැන්පත් කරන ලද මේ නිධානය අන්‍යයන් විසින් දිනාගන්නට නොහැකිය. පරලොව යන කල්හිද විපාක දීම් වශයෙන් තමා අනුව යන්නේ වෙයි. මරණාවස්ථාවෙහි හැර දමා යා යුතු වස්තූන් ඇති කල්හි මේ පුණ්‍ය නිධානය රැගෙන පරලොව යෙයි....'' (නිධිකණ්ඩ සූත්‍රය)

මේ වගේ **රජුන්ට, සොරුන්ට පැහැර ගන්න බැරි, ගින්නෙන් ජලයෙන් ස්වභාවික ආපදාවලින් විනාශ නොවන, අනේක විධ ණය ගෙවා දැමිය හැකි, දුර්භික්ෂ උදා නොවන, සම්පත් ලැබිය හැකි මහා පුණ්‍ය නිධානය පිළිබඳව බුදුපියාණන් වහන්සේ** දේශනා කරල තියෙද්දිත්, අද අපට නිතර අහන්න ලැබෙන්නෙ, වස්තු සම්පත් (ජාති ධර්ම) රැස් කරන, ස්ථාවර නිධාන, ජංගම නිධාන ගැනයි. නමුත් ඇත්තටම මේවා තණ්හා නිධාන යි.

වස්තු සම්පත් රැස් කිරීම, ජීවත්වීම උදෙසා නොකර බැරිකමට කළ යුතු කටයුත්තක්. ඒවා නිධාන හැටියට සැළකීම සුදුසු නෑ. තණ්හාවට සිත පෙළඹවීමක් වෙනවා. මේ නිධාන කොච්චර රැස් කළත් සොහොනට යන දාට ඒ ඔක්කොම මෙලොව දමල යනවා. තනියම යන ඒ අන්තිම ගමනට (මරණයට) උපකාර වෙන්නෙ මේ පුණ්‍ය නිධානයයි කියල දේශනා කරල තියෙනවා.

''පටිසම්භිදා විමොක්ඛාච යාච සාවක පාරමී
පච්චේක බෝධි බුද්ධ භූමි සබ්බ මේතෙන ලබ්භති ...''

පටිසම්භිදා ඥාන, විමෝක්ෂ ඥාන, ශ්‍රාවක පාරමිතා පිරීම, පසේ බුදු බව හා සම්මා සම්බුද්ධ බව කියන මේවා සියල්ල ලබාගන්න මේ පුණ්‍ය නිධානය උපකාර වෙන බවයි බුද්ධ දේශනාවෙන් පෙන්වා තියෙන්නේ. ඉතින් ලෞකික ලැබීම් ගැන කවර කථාද?

අර විදියට බැංකුවල මුදල් තැන්පත් කිරීම, වතුපිටි ඉඩකඩම් රැස් කිරීම හොඳ නිධානයක් හැටියට මතු කරල පෙන්නුවම, ඒ වගේ භෞතික සම්පත් අඩු වුනත් බොහොම හොඳට පින් දහම් කරගෙන, සීලාදී ගුණ දියුණු කරගෙන යම් තරමකට හරි ලෝකය අසාර බව වටහාගෙන ඉන්න පිරිස ''.... අනේ අපි දුප්පත් නෙ.....'' කියන දුක් සහගත මානසිකත්වයට පත් වෙනවා. ඒක ඒ අයට නිවන් මගට බාධාවක්. කරන ලද පින් දහම් සිහි කරල, තමන්ගෙ සුචරිත ජීවිතය ගැන සිහි කරල සතුටු වෙලා වැඩෙන්න තියෙන මානසික සැහැල්ලු බව (ප්‍රීති සම්බොජ්ජංගය) නැති වෙනවා. ඇත්ත වශයෙන්ම **බොහෝ වස්තු සම්පත් තිබුණත්, කිසිම මානසික සුවයක් නොලබන අන්ත දිලින්දන් මේ සමාජයේ ඕනෑ තරම් ඉන්නවා. ජාති ධර්ම කියන ඒවා නිධාන නම්, ඒ අය කොච්චර සතුටෙන් ඉන්න ඕනද?**

මේ සූත්‍ර දේශනාව මුල් කරගත් ☞

ධර්ම දේශනා බොහෝ වාරයක් අහල තියෙනවා. නමුත් මේ පුණ්‍ය නිධානය ගැන ගාථා 11 කින් කරපු විස්තරයට වඩා මුල් තැන ලැබෙන්නෙ, ගාථා 5 කින් දේශනා කරපු තණ්හා නිධාන වෙන වස්තු තැන්පත් නිධාන ගැනයි. මෙන්න මේ නිසයි බොදු මග සැඟවිලයි කියල විශ්වාස කරන්න වෙන්නෙ. මේ, ඒ බොදු මග අළුතින් හදනව නෙවෙයි, අමුතු අමුතු ධර්ම දේශනා කරනව නෙවෙයි. මතු කරල පෙන්විය යුතු වුණත්, මතුකර පෙන්නන්නෙ නැති වැදගත් දහම් කරුණු මතුකර පෙන්වා දෙන එකයි සැඟවුන බොදු මග කලඑළි දකිනවයි කියන්නෙ. මේ ලිපි පෙළ ලියන්න මූලික කරගත්, මනෝ පුබ්බංගමා ධම්මා..... කියන ගාථාවේ තේරුමත් අපට අහන්න, කියවන්න ලැබිල තියෙන්නෙ චිත්ත පුබ්බංගමා චෛතසිකා කියලයි. මනෝ මොකක්ද, ධම්ම මොනවද, චිත්ත කියන්නෙ මොකක්ද කියල මතු කරල පෙන්නල දෙනතුරු ඒ බව හරියට අවබෝධ වෙන්නෙ නෑ. තේරුම සැඟවිලා තියෙන්නෙ නිරුක්ති මතුවෙලා නැති නිසයි. දැන් ඉතින් මේ පුණ්‍ය නිධානය සඳහා ධනය උපයා ගන්න ඕන.

''සද්ධා ධනං, සීල ධනං,
හිරි ඔත්තප්පියං ධනං
සුත ධනංච චාගෝ ච
පඤ්ඤා මේ සත්තමං ධනං ...''

මේ මහා ධන සම්පත් තමයි බෞද්ධයාගේ පුණ්‍ය නිධාන වෙන්නෙ. **බුදුන්, දහම්, සඟුන් කෙරෙහි සද්ධාව ඇත්තා සද්ධා ධනය ඇති කෙනෙක්.** තථාගත බුදුපියාණන් වහන්සේ ඒකාන්තයෙන්ම ''අරහං, සම්මා සම්බුද්ධෝ, විජ්ජාචරණ සම්පන්නෝ, සුගතෝ, ලෝකවිදූ, අනුත්තරෝ පුරිසධම්ම සාරථී, සත්ථා දේව මනුස්සානං, බුද්ධෝ, භගවා කියන ගුණවලින් යුක්තයි කියල විශ්වාසයෙන් සම්මා සම්බුද්ධ බව පිළිගැනීමටයි, බුදුන් වහන්සේ කෙරෙහි සද්ධා සම්පන්න වෙනවයි කියන්නෙ. දැන් තමන්ගෙ ළමයෙක් උපකාරක පංතියකට ඇතුලත් කරන කොට ගුරුවරයගෙ උපාධි සහතික බලනවද, එහෙම නැත්නම් ඒ ගුරුවරයගෙන් ඉගෙන ගෙන, බලාපොරොත්තු වුන විභාගයෙන් අනිත් ළමයි අරගෙන තියෙන ප්‍රතිඵල ගැන හොයල බලනවද? බලන්නෙ ප්‍රතිඵල ගැන. එතැන හැසිරෙන ළමයින්ගෙ විනය සංවරකම ගැන. ඒ ළමයින්ගෙ ප්‍රතිඵල, විනය සංවරකම දිහා බලල ගුරුවරයා කෙරෙහි විස්වාසයක් ඇති කරගන්නවා. බුදුගුණ විස්වාසයෙන් පිළිගැනීම ඇති වෙන්නෙත්, මේ වගේ ඒ ගුණ ඇසුරු කළ මහා සංසරත්නය ගැන, උපාසක උපාසිකා පිරිස ගැන, ධර්ම ශ්‍රවණය කිරීමෙන් දැනුවත් වීමෙන්. ඒ වගේ හොඳ ප්‍රතිඵල ගත්ත අයට තමයි ඒ බුදුමග හරියට වැටහෙන විදියට තව කෙනෙකුට කියා දෙන්න පුළුවන් වෙන්නෙ. ඒක හරියට අර විභාගෙ සමත් වෙච්ච ළමයි, ඊළඟට ගුරුවරු වෙලා, එයිට වඩා වයසින් බාල පරපුරේ ළමයින්ට උගන්වනව වගෙයි.

ධර්මය ඇසුරු කරගෙන ඒ මග අනුගමනය කරන කොට මේ වගේ අනිත් බුදුගුණ ගැනත් වැටහීමක් එනවා. මේ වැටහීම සෝවාන් මට්ටමට වඩා සකෘදාගාමී මට්ටමට එනකොට වැඩියි. අනාගාමී වෙනකොට ඊට වැඩියි. අරිහත් වෙනකොට ඊටත් වැඩියි.

මුලුමනින්ම සම්මා සම්බුද්ධ ගුණය දකින්නෙ තවත් සම්මා සම්බුදු කෙනෙක් විතරයි. සම්මා සම්බුද්ධ කියන වචනය හැදිල තියෙන්නෙ සං+මා+සං+බව+උද්ධ කියන වචන එකතු වීමෙන්. ''සං'' කියන වචනෙ තේරුම ගොඩනගනවා, එකතු කර සකස් කරනවා කියන එකයි. උදාහරණයක් ගත්තොත් ගීතයකට තනුවක්, රාගයක්, ඒවාට ගැලපෙන නාද තියෙන වාදන භාණ්ඩ ආදිය එකතු වුනාම, ගීතය සංගීතයක් වෙනවා. ''මා'' කියන්නෙ මිදෙනවා කියන එකයි. ''බව'' කියන සසර ගමනේ සැරිසරන, විවිධ රූපකායන් ඇති අත්බැව් ගොඩනගන සසර ගමනෙන් මිදිල, භව ගමන උදුරා දැමීමයි සම්මා සම්බුද්ධ කියන්නෙ. සම්මා සම්බුද්ධ කියන වචනෙ තේරුම තමයි මේ. ඒ අනුව ගුණය තේරුම් ගන්න ඕන. සම්මා සම්බුද්ධ ගුණය අනන්තයි. බුදු කෙනෙක් මුළු ජීවමාන කාලයේම ඒ ගුණයම විතරක් විස්තර කළත්, කාලය ඉවර වෙනව මිසක් දේශනා කරල ඉවර වෙන්නෙ නෑ කියලයි දේශනාවෙ තියෙන්නෙ. නමුත් අටුවා පොත්වල තියෙන පුංචි තේරුම් පොඩ්ඩකට මේ ගුණය සීමා කරන සමහර උගත්තු, මේ විදියට විවිධාකාරයෙන් ගැඹුරින් ගුණ විග්‍රහ කරන කොට ඒකට තරහෙන් බැණ වදිනවා.

**ආස්වාද දෙන රූප, ශබ්ද වගේ බාහිර අරමුණු ගෙනෙන ලෝකය අපි කැමති විදියට පවත්වන්න බෑ.** සසර ගමනත් අපි කැමති විදියට සිද්ධ වෙන්නෙ නෑ. ආස්වාද මාත්‍රය හඹා යන සත්වයා බැරි දෙයක් කරන්න, නැති දෙයක් ලබන්න වෙහෙස වෙවී දුක් විඳිනවා. නැති දෙයක් ඇති හැටියට පෙන්වන මායාකාරී ලෝකය හා සත්වයා දුකට පත් කරන මුලා සහගත මග සොයාගෙන, අපට ඒකෙන් මිදෙන හැටි හෙළිකර දුන් උත්තමයන් වහන්සේ බුදුපියාණන් වහන්සේය කියල දැනගෙන, ගරු සිතින් ගුණ දැක ඇතිකර ගත් පැහැදීමකින් කරන අවංක පිළිගැනීමයි බුදුන් කෙරේ සද්ධාව කියන්නෙ. දේවදත්ත භික්ෂුව බුද්ධ ශාසනයේ පැවිදි වුනත්, මේ ගුණ දැකල පැහැදීම තිබුණෙ නෑ. සද්ධා ධනය නොතිබුණ නිසා පිරිහීමට පත්වුනා.

ධර්මය කෙරෙහි සද්ධා සම්පන්න වෙනවයි කියන්නෙ, ඒ සම්මා සම්බුදුරජාණන් වහන්සේලා දේශනා කළ ධර්මය, ඒකාන්තයෙන්ම ''ස්වාක්ඛාතෝ, සංදිට්ඨිකෝ, අකාලිකෝ, ඒහිපස්සිකෝ, ඕපනයිකෝ, පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහී....'' කියන ගුණවලින් යුක්තයි කියල විස්වාසයෙන් පිළිගැනීමයි. මේ පිළිගැනීමත් නිකන්ම එන්නෙ නෑ. ධර්මය ඇසුරු කළොත් තමයි ධර්මය සංදිට්ඨිකයි කියල දකින්නෙ. සං+දිට්ඨික කියන පද දෙක එකතුවෙලයි මේ පදය හැදෙන්නෙ. ''සං'' කියන්නෙ යම් එකතුවක් ගොඩනගල, සකස්වෙලා තියෙනවයි කියන එක. මොකක්ද සකස් වෙලා තියෙන්නෙ? මේ ඇස, කන, නාසය, දිව, කය, මන කියන අභ්‍යන්තර ලෝකයයි, ඒ ලෝකයට ගෝචර වෙන රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම කියන බාහිර ලෝකයයි. එකතු වෙලා තියෙන්නෙ මොනවද? මනස පූර්වංගමව අවිද්‍යාවයි තණ්හාවයි එකතු වෙලා තමයි මේ ලෝක ගොඩනැගුනෙ. මේ ලෝක කාගෙවත් මැවීමක් හෝ ඉබේ පහළවීමක් හෝ නෙවෙයි. දිට්ඨි කියන්නෙ දකිනවා, 'ක' කියන්නෙ ක්ෂය වෙනවා. යම් කෙනෙක් මේ ඇස, කන... ආදී ඉන්ද්‍රියනුත් රූප, ශබ්ද වගේ බාහිර අරමුණුත් මනස පූර්වාංගමව අවිද්‍යාවෙන් තණ්හාවෙන් ගොඩනැගිල සකස්වෙලා තියෙනවයි කියන එක ප්‍රඥාවෙන් දැකල, ඒ ගොඩනගන වැඩපිළිවෙල ක්ෂය කිරීමයි සංදිට්ඨිකයි කියන්නෙ. මේ ගුණ අනන්ත නිසා තම තමන්ගේ අවබෝධය අනුව විවිධ විදියට විග්‍රහ කරන්න පුළුවන්. **සමහර උගතුන් අටුවාවක වචන කිහිපයකට මේ ගුණ සීමා කරගෙන ධර්මය විකෘති කරනවයි කියමින් බැණ වදින්නේ පොතට සීමා වෙච්ච උගත්කම නිසයි.**

ආර්ය පුද්ගලයෙක් දේශනා කරන ශ්‍රී සද්ධර්මය යෝනිසෝ මනසිකාරයෙන් ශ්‍රවණය කරන කෙනෙකුටයි මේ ටික අවබෝධ වෙන්නෙ. සමහර කෙනෙකුට හිතෙන්න පුළුවන් දිව්‍ය, බ්‍රහ්ම, ප්‍රේත, අසුර, නිරය වැනි තැනක ඕපපාතිකව පහළ වෙනව නම් ඒ ශරීර ඉබේ පහළ වුනා නේද කියල. ඒ ලෝකයේ ඒ රූපය මැවෙන්නෙ හේතු ඵලයක් හැටියට. පව් කරපු හේතුවෙන් දුක් විපාක විඳින්න ඔරොත්තු දෙන කයක් පාප ඵලය ලෙස හැදුනා. ඒක වෙනත් කිසිවෙක් කරපු මැවීමක් නෙවෙයි. තමන්ම කළ පාපයේ ඵලයක්. ධර්මය සංදිට්ඨිකයි කියල බර කරල, ලස්සන කරල කිව්වම ඒකෙ නිරුක්තිය, අදහස එහෙම් පිටින්ම වැහිල යනවා. මේ වචනයේ අර්ථයෙන් යම් තරමකට හරි සංදිට්ඨිකයි කියන ගුණය අවබෝධ වුනා නම්, මේ තරම් දීර්ඝ කාලයක් තිස්සේ ජාති, ජරා, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස, රාග, ද්වේශ, මෝහ කියන මහා දුක් කඳක් විඳගෙන, ගිනි කඳක් දරාගෙන ආවෙ නිසරු ගමනක් නේද කියන කාරණය දකිනවා. සසර භය

දකිනවා, ආස්වාද මාත්‍රයේ ආදීනව කඳ දකිනවා. ඒ දුක් කඳෙන් නිදහස් වෙන්න ඕන, ඒ වෙනුවෙන් කරන්න තියෙන දේ අප්‍රමාදවම කරගන්න ඕන කියල ඒ මගට බහිනවා. එහෙම අදහසක් ඇවිත්, ඒ මග යන කොට ධර්මයේ අනෙක් ගුණත් දකිනවා. ගුණ දැකල පැහැදෙනවා.

සද්ධා කියන්නෙ ස්ව+අද්දා කියන පදවල එකතුවයි. **බුදුගුණ තමන් තුළත් ගොඩනගා ගන්න, ඒවා කෙරෙහි ඇදී සිටිනවා කියන එකයි බුදුන් කෙරෙහි සද්ධාව ඇති වෙනව කියන්නෙ. ධර්මය කෙරෙහි සද්ධාව කියන්නෙ, ධර්ම මාර්ගය අනුගමනය කරමින් ඒ දහම් ගුණ කෙරෙහි තමනුත් ඇදී සිටිනවා කියන එකයි.** එතකොට ස්ව කියන්නේ මමත්වයෙන් නොඳුවෙන බව තමන්ටම අත්දකින්න පුළුවන්. මේ විදියට ස්ව+අද්දා =සද්ධා වෙනවා. මේ වගේ විවිධ ක්‍රමවලින් විස්තර කරන්න පුළුවන් පදයක් තමයි සද්ධා කියන්නේ.

මේ දහම් ගුණ විස්තර කරන කොට මෙහෙමත් අහන්න ලැබෙනවා. ''.... අබාලිකෝ කියන්නෙ සෝවාන් ආදී මාර්ගයන්ට පත්වෙනවත් එක්කම කල් නොයවා සෝවාන් ආදී ඵලයන්ට පත්වෙන නිසයි. සමහර අය මේවාට අලුත් අලුත් අර්ථ කථන දෙනවා. අබාලිකයි කියන්නෙ හැම කාලයටම වෙනස් නොවන ධර්මයක් නිසයි කියනවා.'' නමුත් ඒ විදියට හැම කල් වෙනස් නොවන්නේ මාර්ගය හා ඵලය විතරක් නෙවෙයි. මවුපියන් මැරීම ආදී ආනන්තරීය පාප කර්ම කරපු උදවිය ඒකාන්තයෙන් අපා ගතවීමත් හැම කාලයටම පොදුයි. ඒ නිසා මේ විදියටත් අර්ථය තෝරා ගැනීම වැදගත්.

ඇත්තටම සමහර අය බුදුගුණ, දහම් ගුණ, සඟ ගුණ අනන්තයි කියලත් කියනවා. එක ගුණයක් විස්තර කරන්න එක අර්ථයමයි තියෙන්නෙ කියලත් කියනවා. දැන් ශ්‍රාවකයො පිළිගන්නෙ මොකක්ද? අඩු තරමෙ මාර්ගය පිරෙන්නයි, ඵලය ලබන්නයි චිත්තක්ෂණ දෙකක්වත් අවශ්‍යයි. චිත්තක්ෂණ දෙකක් අතර කාලය කොච්චර පුංචි වුනත් ඒකත් කාලයක්. ගඟකට බහින්න බොහෝ තොටුපළවල් තියෙනව වගේ, අසූහාර දහසක් ධර්මස්කන්ධය, අසූහාරදහසක් තැන්වලදි දකින්නත් පුළුවන් වෙන්න ඕන. සෝවාන් පුද්ගලයා කවුද කියල දැනගන්න උවමනා කරපු, එක භික්ෂුවක් තවත් භික්ෂූන්වහන්සේලාගෙන් විස්තර ඇහුවා. එතකොට එක් එක් භික්ෂූන් වහන්සේලා දුන්න උත්තර එක එක විදියයි. අන්තිමේදී බුදුන් වහන්සේගෙන් මේ ගැන දැනගන්න ගියා. උන්වහන්සේ උපමාවකින් කාරණය පැහැදිලි කළා.

මල් පිරිච්ච, කරල් තියෙන කැල ගහක් ළඟින් ගිය කීප දෙනෙක් ඉන්නවා. අපි ඒ අයගෙන් මෙහෙම අහනවා. ඔබ ආව පාරෙ තිබුණ කැල ගහ දැක්කද? ඔව් මම දැක්ක.... මොන වගේද? ඔහු ගහ ළඟ නැවතිලා බලා ගෙන හිටියෙ නැහැනෙ. යන ගමන් දැක්කෙ මල් විතරයි. ඒ ගහේ මල් මේ වගෙයි කියල මල් ගැන විස්තර කරනවා. තවත් කෙනෙක්ගෙන් අහනවා, ඔහු දැක්කෙ ගහේ කරල් විතරයි. ඒ නිසා ඔහු කරල් ගැන විස්තර කරනවා. තවත් කෙනෙක්-ගෙනුත් අහනවා. ඔහු යන ගමනෙදි දැක්කෙ ගහේ කඳ. ඔහු කඳ ගැන විස්තර කරනවා. දැන් මේ තුන්දෙනා කාරණා තුනක් කිව්වා. කඳ දැක්ක පුද්ගලයා මල් දැක්ක පුද්ගලයාටයි කරල් දැක්ක පුද්ගලයාටයි කිව්වොත්, ඔය කියන්නෙ බොරු, මම විතරයි ඇත්ත කියන්නෙ කියල ඒක හරිද? දැන් ඒ තුන්දෙනාම කැල ගහ දැකල නැද්ද?

ධර්මය අහල අවබෝධයෙන් ඒ දහම් මග අනුගමනය කරන කොට දකිනවා, මහා සංඝයා වහන්සේලා ඇත්තටම ''සුපටිපන්නෝ, උජුපටිපන්නෝ, ඤායපටිපන්නෝ, සාමීචි පටිපන්නෝ, ආහුනෙය්‍යයෝ, පාහුනෙය්‍යයෝ, දක්ඛිනෙය්‍යයෝ, අංජලිකරණීයයෝ, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස.....'' කියන ගුණවලින් යුක්තයි කියල. ගුණ දැක සංඝයා කෙරෙහි පැහැදෙනවා. ගුණ දැක පැහැදෙනව කියන එකත් හොඳින් තේරුම් ගත යුතු කාරණයක්. **දේවදත්ත භික්ෂුව අෂ්ට සමාපත්ති උපදවාගෙන හිටපු කෙනෙක්. විවිධ ප්‍රාතිහාර්ය පෑමේ දක්ෂතාවයත් තිබුණා. ඒ දක්ෂතාවය ගුණයක් හැටියට පිළිගත් පිරිසක් ඒ භික්ෂුව වටාත් රුස්වුනා. නමුත් ඒ සද්ධාව නිවනට උපකාර වෙන එකක් නම්, බුදුන් වහන්සේ සැරියුත් හිමියන් යවල ඒ භික්ෂූන් වහන්සේලා ධර්මයෙහි පහදවාගෙන ආපහු එක්කගෙන එන්නෙ නෑ.** වර්තමානයෙත් අටවිසි බෝධි පූජා පැවැත්වීම, විචිත්‍ර ධර්ම දේශනා පැවැත්වීම, පිරිත් දේශනා පැවැත්වීම, භාවනා වැඩ සටහන් කිරීම... ආදී ගිහි පින්වතුන්ගේ විවිධ ආගමික අවශ්‍යතා ඉටුකර දීම වගේ ගුණත් සංඝයා වහන්සේලා ළඟ තියෙනවා. නමුත් ගුණ දැකල පැහැදීමේදී මුල්තැන දෙන්න ඕන සුපටිපන්නෝ.... ආදී ගුණ නවයටයි. ඒ ගුණ නවය පෙර විසූ ආර්ය මහා සංඝරත්නයටත්, වත්මන් ආර්ය මහා සංඝරත්නයටත්, අනාගතයේ පහළ වන සියලුම ආර්ය මහා සංඝරත්නයටත් පොදු ගුණ සමූහයක්.

ඉහත කී විවිධ ආගමික සේවයන් ආර්ය ගුණය මුල් කරගෙන කරන උතුමන් වගේම විවිධ ලාභ, කීර්ති, ප්‍රශංසා මුල් කරගෙනත් කරන උදවිය ඉන්න නිසා ගුණවතුන් තේරීම ඉතා අමාරු කාරණයක්. ඒ නිසා තමයි **පුද්ගලත්වයට නැතිව පොදුවේ සංඝයා කෙරෙහි පැහැදෙන්න කියල බුදුන් වහන්සේ අනුශාසනා කළේ.**

අටවිසි බෝධි පූජා වගේ කටයුතු හිත පිරෙන්න ලස්සනට කරපු සමහර භික්ෂූන් වහන්සේලා උපැවිදි වෙලා ගිහි ජීවිත ගතකරන හැටිත් දකින්න තියෙනවා. ඒ අය සුපටිපන්නෝ කියන ගුණයට ගැඹුරින් ඇතුල් වෙලා නැති බවයි පේන්නෙ. ''සුවය ගෙන දෙන මගට පිළිපන්'' කියන එකයි සුපටිපන්නෝ කියන්නෙ. **එක් භික්ෂුවක් හය වරක් සිවුරු හැර ගිහින් හත්වෙනි වර පැවිදි වෙලා අරිහත්වයට පත් වෙච්ච කතාවක්** දහම් පොත්වල සඳහන් වෙනවා. මාත්‍රය බැගින් හෝ යහපත වැඩෙන නිසා හොඳ දේ මාත්‍රයත් යහපත් බව පේනවා.

නිවනෙ තමයි සුවයක් තියෙන්නෙ. ''...... මහණෙනි, නිවන හැර බොජ්ඣංග ධර්ම හැර වෙනත් සුවයක් මම නොදකිමි....'' කියලයි බුද්ධ දේශනාවෙ තියෙන්නෙ. නිවන් මගට පිළිපන් කියන්නෙ අරි අටඟි මග වැඩීමට පිළිපන් කියන එකයි. පැවිදි බවට පත්වෙලා ඉන්න හැම දෙනාම නිවන අරමුණු කරගෙනම පැවිදි වුනත්, සුපටිපන්න ගුණය දකින්න නම් ධර්ම ශ්‍රවණය කරන්න ඕන. යම් කෙනෙක් දේශනා කරන ධර්මය ශ්‍රවණය කරන කොට, රාග ක්ෂය වෙනව නම්, ද්වේශ ක්ෂය වෙනව නම්, මෝහ ක්ෂය වෙනව නම් ඒ දේශනා කරන්නෙ බුදු බණ. ඒ වගේ බුදු බණ දේශනා කරන මහා සංඝ රත්නය සුපටිපන්නයි. සුපටිපන්න වූ ඒ මහා සංඝරත්නයේ ගුණ දැක ඒ ගුණ තමන් තුළත් ගොඩනගා ගන්නව නම්, ඊට ඇදී සිටිනව නම් සංඝයා කෙරෙහි සද්ධා සම්පන්නයි කියනවා.

මෙන්න මේ විදියට බුදුන්, දහම්, සඟුන් කෙරේ සද්ධා සම්පන්න තැනැත්තාට ''සද්ධා ධනං'' කියන මහ ධනය හිමි වෙනවා. ''.... මා ගැන සද්ධා මාත්‍රයක්, ප්‍රේම මාත්‍රයක් ඇති තැනැත්තා කවදාවත් සසර අතරමං වෙන්නෙ නෑ. සතර අපායෙන් නිදහස් වෙනවා ....'' කියල බුදුපියාණන් වහන්සේ දේශනා කරල තියෙනවා. එහෙනම් එබඳු තැනැත්තා සසර වසනා තාක් සතර අපා දුකෙන් නිදහස් වීමේ මහා ධන නිධානයට හිමිකරුවෙක් වෙනවා. නමුත් **සතර අපා දුකේ භයානකකම වැටහෙන තුරුම, මේ මහා පුණ්‍ය නිධානයට වඩා, රන් රිදී ඉඩකඩම් වගේ ජාති ධර්ම තමයි වටිනා නිධාන හැටියට පේන්නේ.** අවිද්‍යාවෙත් තණ්හාවෙත් ස්වභාවය තමයි ඒ.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වෑරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**ඩබ්. ඒ. තිළිණවතී**
(විශ්‍රාමික මහජන බැංකු නිලධාරිනී )
කඩවත

# පද නිරුක්ති මගින් හෙළිවන ස්වභාව ධර්මයේ නිපැයුම්

*(පසුගිය කලාපයෙන් - ලොව සෑම වචනයකටම නිරුක්තියක් හා ඊට අනුකූල අදහස් ගැළපීමක් ඇත)*

පද නිරුක්ති කියන්නෙ මොනවද, ඒවායින් කෙරෙන්නෙ මොකක්ද, භාෂා නිරුක්තිවලින් වෙනස් වෙන්නෙ කොහොමද කියන කාරණා සම්බන්ධයෙන් පූර්ණ විග්‍රහයක් මීන් පෙර කලාපවලින් ඉදිරිපත් කළා. දැන් මේ කියන පද නිරුක්ති රටාවන් ලෝකයේ තියෙන විවිධ ද්‍රව්‍ය වස්තු, සත්ව නාම ආදී විවිධ දේවල් සම්බන්ධයෙන් අදාළ කරගෙන, වචනයන් කිහිපයක නිරුක්ති ගැනත්, ඒවායේ අර්ථයන් අදහසට ගැළපෙන හැටිත් කෙරෙන විග්‍රහයක් තමයි මේ ඉදිරිපත් කරන්නේ. ඒ සඳහා පළමුවෙන්ම ශාක ඖෂධ වර්ග කිහිපයක නිරුක්තීන් විග්‍රහ කර ගත්තොත්,

ලෝකය හටගත් මුල් කාලයේ ප්‍රධාන වශයෙන් ඖෂධ ශාක විදිහට තිබුණේ අරළු, බුළු, නෙල්ලි කියන ඒවා තමයි. අදටත් ආයුර්වේදයේ එන ප්‍රධානතම ඖෂධ තුනක් තමයි මේ. ඒ වගේම ලෝකය හටගත් මුල් කාලයේ දස අකුසල්වලින් තොරව ජීවත් වුණු බ්‍රහ්ම කල්පීය මනුස්ස පිරිසක් තමයි හිටියේ. දස අකුසලින් තොර වුණාම දූෂ්‍යතාවක් නෑ. එතකොට ලෙඩ රෝගවලට මුලක් නෑ. හැබැයි මෙතනදී දස අකුසල්වලින් තොරයි කිව්වේ ඒවා ප්‍රහීන කළා කියන එක නෙවෙයි. යටපත් වුනා කියන එකයි. මොකද ප්‍රහීන වුනානම් නැවත එන්නෙ නෑ. ඒ තමයි අරිහතුන් වහන්සේගේ ස්වභාවය. නමුත් යටපත් වීම කියන කාරණයේදී පරිසරය සකස් වුනාම ඒවා නැවත එන්න පුළුවන්. ඒවා ඇවිත් දස අකුසලත් එක්කමයි ලෙඩ රෝගවලට මුල් වුණේ. ඉතින් දසකුසල් ඉවත දමන්න සාරධර්ම ඉවත් කළා. හරය කියන්නේ සාර ධර්මවලට. හරය ඉවත ලූ නිසා හර + ලූ - අරළු කියන ශාකය හැදුණා. හැබැයි ඉවත් වුනාට විනාශ වුනේ නෑ. ඒක ගිහින් වෙනත් විදිහකින් තැන්පත් වුනා. අරළුවල තියෙන්නේ ඒ විදිහට ඉවත් වෙච්ච ශක්තිය.



ඊළඟට සත් පුරුෂයන් විසින් ලෝකයාට දායාද කරපු සත් බස ඉවත් කළා. ඒක යටපත් කළා. මේ විදිහට බහ ඉවත ලූ නිසා බහ + ලූ - බුළු කියන ශාකය හැදුණා. බුළුවල තියෙන්නේ මේ විදිහට එදා විසි වෙච්ච ශක්තිය. දැන් කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන්, මීන් පෙර විස්තර කරල තියෙන විදිහට බහ + අළු (ඉවත ලූ) - බලු කියල පෙන්වා දීපු කාරණය කොහොමද මෙතනට ගලපන්නෙ කියල. බලු කියල කිව්වේ සත් බස අළු කරල ඉවත දාපු සංඛාරයෙන් ගොඩනැගිච්ච තිරිසන් සත්ව ජාතියේ විපාක අවස්ථාව. ඒ විදිහට බහ ඉවත දාපු හේතුවෙන් හටගත්තු විපාක ඵලය තමයි බලු කියන්නේ. නමුත් බුළු කියන්නේ ඒ විනාශ කරපු සත් බසේ තිබිච්ච ශක්තිය නැවත ලබාගන්න ගොඩනැගිච්ච ද්‍රව්‍ය අවස්ථාව.

ඊළඟට එදා තිබුණා, දස අකුසලයෙන් තොර මානසික ශුද්ධත්වය නිසා ඇතිවෙච්ච නොඇලී සිටීමේ ගතියක්. නමුත් පසුකාලීනව මේ නොඇලී සිටීමේ ගතිය ඉවත් වෙලා ලෝක සත්වයා හැම දේකටම ඇලෙන්න පටන් ගත්තා. එතකොට නොඇලී සිටීමේ ගතියට අනුකූල ශක්තිය විශ්වයට ගිහින් නොඇල්ලී - නෙල්ලී කියන ශාකය හැදිල ඒකෙ තැන්පත් වුණා. අද නෙල්ලි ශාකයේ තියෙන්නෙ ඒ ශක්තිය තමයි. මෙතනදී ක්‍රම දෙකක් තියෙනවා. **පුද්ගලයෙකුට අගුණයක් එන කොට, තිබුණු ගුණය ඒ නමින් විශ්වයට පිටවෙනවා. ඊට පස්සෙ ක්‍රම ක්‍රමයෙන් ගිහින් ඊටත් වඩා අගුණ වෙන කොට ඒ කියන අගුණ ශක්තියත් ඒ විශ්වයට පිට** වෙනවා. උදාහරණ විදිහට යම් කිසි කටුක ගතියක් තියෙන කොට ඒ කටුක ගතියෙන් තවත් කෲර ගතියට ආවොත් ඒ ගති ශක්තියත් විශ්වයට පිට වෙනවා. මේ නිසා හොඳ නරක දෙකම විශ්වයේ තියෙනවා. ඒ ශක්තිය ශාකවලත් ඒ විදිහටම තැන්පත් වෙනවා. මේ නිසා ශාක ගත්තමත් හොඳ නරක ශාක දෙවර්ගම තියෙනවා. 'ස්ව' කියන්නේ තමා. 'විශ්ව' කියන්නේ තමන්ගෙන් විසි වුණා කියන එක. 'ස්වභාව' කියන්නේ තමන්ගේ හැටි. 'ධර්මය' කියන්නේ යමක් දරන හැටි. තමන්ගේ හැටි දරනවා. ඒක තමයි ස්වභාව ධර්මය වුණේ. ඒ **ස්වභාව ධර්මයේ තියෙන්නෙ වෙන මොකුත් නෙවෙයි, අපි දරපු ගති ලක්ෂණ අනුව පිටවෙච්ච ශක්තිය. ඒ ශක්තිය විවිධ ද්‍රව්‍ය වස්තු විදියට පිහිටනවා.**

තවත් උදාහරණයකින් පහදනව නම් මුල් කාලයේ තිබිච්ච අලෝභ, අද්වේශ, අමෝහ ගති ඉවත් වෙලා මනුස්සයා රසයෙහි කිඳා බහින්න පටන් ගත්තා. පසුව ඊටත් වඩා දූෂ්‍ය වෙලා දූවෙන්න වුණා. එතකොට ඒ ගුණය ඈත් වෙලා ගිහින් රසකිඳ ඇති වුණා. මේ විදිහට ශක්තිය විසි වෙලා, දුරස් වෙලා කොහේ හෝ පහළ වෙනවා මිසක් විනාශ වෙන්නෙ නෑ. විනාශ වුණා නම් නැවත ගන්න ක්‍රමයක් නෑ. එතකොට මේ ශක්තිය ගත්තොත් **වෙළෙන ගතිය වැල් වෙනවා. කෙළින් සිටින ගතිය ගස් වෙනවා.** ගස්වැල් ☞

විදිහට පිහිටන්නේ මේ ගති ලක්‍ෂණ දෙකෙන්. රසයේ කිඳා යාම කියන්නේ වෙළෙන ගතියක්. මේ නිසා රසකිඳ වැලක් විදිහට පිහිටනවා.

ඊළඟට 'වට්ට' කියන්නේ සැරිසරනවා කියන එක. පාදයෙන් සැරිසරන කොට තමයි ගමන් කරන්නේ. වැඩක් කරගන්න අවශ්‍ය තැන්වලට යන්න පටන් ගත්තෙ මේ නිසා. නමුත් වැටකඩුළු බැඳ ගෙන අහුරාගත් නිසා අවශ්‍ය තැනට යන්න වටයක් ගහන්න සිද්ධ වුණා. ඊට පස්සෙ කම්මැලිකමට කොහේවත් නොගිහින් නිකන් ඉන්න පටන් ගත්තා. මේ නිසා පාදයෙන් සැරිසරන ගතිය විසි වෙලා ගියා. ඒ ගතිය තමයි පාවට්ටා විදිහට ශාකවල තැන්පත් වුණේ. පාදයෙන් වට්ට කරන එක (සැරිසැරීම) නැති වෙලා කකුල් අමාරුව හැදුණාම, ඒ ශක්තිය ආපසු ගන්න පාවට්ටා දෙනවා. ඒ වගේම යන්න බැරිව වැළපෙන කොට පෙර තිබ්ච්ච කායික ශක්තිය අක්‍රීය වෙලා පිටවෙලා ගිහින් වට්ට+අක්කා=වට්ටක්කා ලෙස වැලක පිහිටියා.

ඊළඟට මිහිරියාවෙන් වෙළිල ඉන්න එකත් වැල්වලට අයිතියි. වැල් - වෙළෙනවා, මී - මිහිරියාව. ක්‍රෝධය හට ගැනීමත් සමගම මිහිරියාවෙන් වෙළෙන ගතිය දුරස් වෙලා ගියා. ඒක තමයි වැල්මී වුණේ. මේ ගති ලක්ෂණ ඉවත් වෙලා යන කොට ශරීරය දූෂ්‍ය වෙනවා. එතකොට ඒ ශක්තිය ආපසු දෙන්න ඕනත් ඒකෙන්මයි. සියලුම ගස් වර්ග, බෙහෙත් වර්ග හැදුණේ මේ ක්‍රමයට තමයි. හැබැයි නැවත ගන්න ගියාම ඒවා ඉවත් වෙච්ච වගේ ලේසියෙන් ගන්න බෑ. හරි අමාරුයි ගන්න. 'ස්ව' කියන්නේ තමා තුළ තිබුණු ගුණ. 'ක' කියන්නේ ක්ෂය වුණා කියන එක. තමා තුළ තියෙන ගුණ ක්ෂය වෙලා ගියාම ඒක තැන්පත් වෙලා ස්ව+ක-ශාක හැදෙනවා. ඒ ගුණ තමයි ශාකවල තැන්පත් වෙලා තියෙන්නේ. **එකම දෙයන් හඳුන්වන්න විවිධ නම් තිබුනත් ඒ විවිධ නම්වලින් කියවෙන නිරුක්තිය ඊට ගැලපිලා තියෙනවා.** තමා තුළ තියෙන තාරුණ්‍ය බවටයි තුරුණු කියන්නේ. ඒක ඉවත් වෙලා තමයි තෘණ වර්ග හැදුණේ. මේවා දකින නුවණට, පෙර හිටපු ඍෂිවරු කිව්වෙ ද්‍රව්‍ය පදාර්ථ ඥානය කියල.

නරක පැත්ත එන්නෙත් මේ කියපු විදිහටමයි. නරක ගතියක් ආවොත් ඒක තවත් දූෂ්‍ය වෙලා පිටවෙලා යනවා. උදාහරණ විදිහට ඉස්සර නිය අඟලක් වවාගෙන හිටපු කාලයක් තිබුණා. ඒ කියන්නේ කිසිම වැඩක් කරන්නෙ නැතිව නිය අඟලක් විතර දිගට වවාගෙන සුඛෝපභෝගීව ජීවත් වෙලා ඉන්නවා. අන්තිමට ලෝකයේ තියෙන සම්පත් හා ඒවායේ ගුණාත්මක භාවය වැහැරිලා යන කොට එහෙම වැඩ නොකර ඉන්න බැරිව ගියා. ඒ කියන්නෙ ඒ තත්වය නියඟය ඇති වෙන්නත් හේතු වුණා. ඊට පස්සෙ ඒ විදියට ක්‍ෂය වෙලා වැහැරිලා ගියපු සම්පත් නැවත ලබාගන්න නියගය ඉවර වෙනකල් වැඩ කරන්න පටන් ගත්තා. ඉතින් අර නිය අඟලක් වවාගෙන නිකන් හිටපු කාලෙදි විසි වෙච්ච නරක ගුණය තමයි නියගලා විදිහට පිට වෙලා ගියේ. විෂ ශාක වර්ග හැදුණෙත් මේ විදිහට. ස්ත්‍රීන් තමයි වැඩි හරියක් මේක කළේ. නිය අඟලක් වවාගෙන කේන්ති දිදී, ලේසියට ලස්සනට වැඩක් නොකර ජීවත් වීමේ ප්‍රතිඵලය තමයි නියගලා වුණේ. නියගලා මලේ තියෙන්නෙත් ඒ ගතිය. ''කලා රසය තිබුණත් නියගලා මලේ - මළා නේද කැවොත් නියගලා අලේ'' කියන්නෙත් මේ නිසා. ඒ තමයි අර තිබ්ච්ච ගතිය. පිටින් ලස්සනට තියෙනවා. නමුත් ඇතුළෙ තියෙන්නෙ විස කුණක්. ඒ තිබ්ච්ච ගතිය තමයි පිට වෙලා ගිහින් නියගලා වුණේ.

ඒ වගේම තමයි කටුක ගතිය වැඩි වෙන කොට ඒක පිට වෙලා ගිහින් කටුවැල්, කටුගස් හැදුණා. කවුරු හරි ගෙදරට ආවොත් බත් පතක්, ඖෂධ පතක්, තේ එකක් හෝ අන්තිම අඩු වශයෙන් වතුර පතක් හෝ දෙන හොඳ සිරිතක් අපි ළඟ තිබුණා. පසුකාලීනව ඒකත් දෙන්නෙ නැතිව ගියා. ඒ සිරිත ඔක්ක කළා කියන්නෙ ඉවත් කරල දැම්මා කියන එක. (ඔක්කාරය කියන්නෙත් ඉවතට දමනවා කියන එකයි) මේ විදිහට පත ඔක්ක කරල දැම්ම නිසා තමයි පතොක් හැදුණේ. ඒක කටුක ශාකයක්. ඊළඟට කාලයේ පෝෂ්‍ය දේවල් අවශ්‍ය තරම් තිබුණා. පසුව ඒවා අඩු වුණා. එතකොට පෝෂ්‍ය දේවල් අල්ලන්න පටන් ගත්තා. ඒකෙන් පිටවෙච්ච ශක්තිය තමයි පෝ+අල් =පොල් වුණේ. ආදි කල්පික මනුෂ්‍යයන්ගෙන් කල්පයේ මුල පහළ වෙච්ච නිසයි කල්ප වෘක්ෂය කිව්වේ. ඊළඟට පංච කාමය හට ගත්තා. මුල් කාලයේ පංචකාමයට ලොල් වෙලා හිටපු ගති ලක්ෂණය නිසා පංචකාමයෙන් දූෂ්‍ය වෙන්න පටන් ගත්තා. ඊට පස්සෙ කාම අදහසටත් එහා දූෂ්‍ය වෙලා ගිහින් ඒකත් නැතිවෙලා ගියා. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ කියන මේ පහට ලොල්වීම නිසා තමයි ඒ ගති ලක්ෂණයෙන් පහලොල් - පලොල් හටගත්තේ. ඒ වගේ පංච කාමයට ලොල් වෙලා දූෂ්‍ය ගතිය වැඩි වෙන කොට පහලොල් කියන එක දුරස් වෙලා ඒකෙන් පලොල් ගස කියල ගහක් හැදුණා. කාම දූෂණය නිසා එන රෝග ඉදිමුම් ආදියට පලොල් පොතු ඉස්ම අරගෙන කැඳ උයා දීමත් බේතක්.

ඊළඟට මිනිස්සු වැඩකට නැති පුහු වැඩ කරන්න පටන් ගත්තා. අවංක බව නැති වෙලා ගිහින් වක් වුණා. වක් වුණා කියන්නේ වංක වුණා කියන එක. මේ ගති ලක්ෂණය තමයි විසි වෙලා ගිහින් පුහු+වක් - පුවක් වුණේ.

මුල් කාලයේ මේ කියන ගස් වැල් මොකුත් තිබුණෙ නෑ. ඒවායේ අවශ්‍යතාවක් ඒ කාලයේ තිබුණෙ නෑ. මිනිස්සු දස අකුසලයට බරවෙන කොට පසුකාලීනව තමයි ගස්වැල්වල අවශ්‍යතාව පහළ වුණේ. ඉතින් මුලින්ම මේ කියන ගස්වැල් හට ගත්තේ ස්වයංජාතව. මුල් කාලයේ හටගත් සත්තුත් ස්වයංජාතයි. ඉතින් කිකිළි ද බිත්තරය ද පළමුව හැදුණෙ කියල ප්‍රශ්න කරනවා. උත්තරය තමයි කිකිළි. කිකිළිය මුලින්ම හට ගත්තේ ස්වයංජාතව. ඉන් පස්සෙ තමයි බිත්තර දාන්න පටන් ගත්තේ. කිකිළිය විතරක් නෙවෙයි අනෙක් **සියලු සතුන්ගෙත් මුල්ම ජීවියා ස්වයංජාතවයි බිහි වුණේ.** (ගන්ධබ්බයා මුලින්ම මස් ලේ කයක් නැතිව බොහෝ කල් ජීවත් වෙලා ඉන් පසු ක්‍රමයෙන් ඝනීභවනය වෙච්ච කයක් හිතේ ශක්තියෙන්ම හටගත්තා. චිත්තජ රූපත් කර්ම විපාක ඍද්ධියෙන් ඝනීභවනය කරන්න පුළුවන්.) ඉන්පසු උන්ගේ ගැහැනු පිරිමි සතුන් එකතුවීම මගින් ඒ ජාතියේම සතුන් බිහි වෙන්න පටන් ගත්තා. ඊට පස්සෙ ඕපපාතික, සංසේදජ උපත් ක්‍රමයෙන් අඩුවෙමින් ජලාබුජ, අණ්ඩජ කියන ක්‍රමවලට සතුන් බිහි වුණා. අඟපසඟ සියල්ලම එකට පහළ වෙලා හට ගන්නා සූක්ෂම ශරීර ඕපපාතිකයි. මස් ලේ කයක් සහිත ඝනීභවනය වූ ශරීර ඇතිව මවෙක්, පියෙක් නැතිව රසායනික සංයුතියන්ගේ එකතු වීමෙන් පහළ වුණොත් ඒක සංසේදජයි. උදාහරණ විදිහට පොක්කරසාති බමුණා නෙළුමක උපන් බව සඳහන් වෙනවා. මේ කාරණය අදටත් අපට දැක බලා ගන්න පුළුවන් අවස්ථාවක් තමයි වන්දා සහ දෙහි කොළයා කියන සතුන්. උන් මව්පියන්ගෙන් තොරව සංසේදජවයි හට ගන්නේ. මෙහෙම ගිහින් පසුව ස්ත්‍රී පුරුෂ සංවාසයෙන් බිත්තරවලින් හටගන්නවා. මේ සතුන්ගේ මේ ක්‍රම දෙකම දැනටත් තියෙනවා.

ඊළඟ කාරණය තමයි මේ දෙහි කොළයා කියන සතා පේර කොළ, දෙහි කොළ, ජම්බු කොළ කියන තුනෙන්ම හට ගන්නවා. හැබැයි තුනෙන් මොකෙන් හැදුණත් සතාගේ මට්ටම එකයි. කොළේ ලොකු වුණාට සතා ලොකු වෙන්නෙ නෑ. කර්මජ රූපයට අනුකූලව ගන්ධබ්බ රූපය පළමුව හට ගන්නවා. ඒ ගන්ධබ්බ සතා කොළය හා සම්බන්ධ වෙලා ඝනීභවන කය දෙවනුව හදාගන්නවා. මේ

විදියට කර්මජ රූපයට අනුව සකස් වුණු ගන්ධබ්බයාගේ මට්ටමටයි කොළයෙන් ඒ සතා සකස් වෙන්නෙ. කොළයේ ඉතිරි ප්‍රමාණය ඉවත් වෙනවා.

වැදැමහ සහිතව උපදින ක්‍රමය ජලාබුජයි. කුකුළෙක් හා කිකිළියක් එකතු වීමෙන් බිත්තර හට ගැනීම අණ්ඩජයි. මේ කියන සමහර කාරණා තවමත් විද්‍යාවට හසු කරගන්න බැරි වෙලා තියෙනවා. නමුත් බුදුන් වහන්සේගේ සර්වඥතා ඥානයට මේ කාරණා හසු වෙලා තියෙනවා. කොහොම හරි ආදියේ තිබ්බ ගති ලක්ෂණ අනුෂය වශයෙන් පරිසරය සකස් වෙන කොට ඇදිල එනවා. එතකොට ගතියට අනුව ගති රුව නිර්මාණය වෙන නිසා ඒ වර්ගයේ සතුන් බිහි වෙනවා. **ඕපපාතිකව හැදිච්ච සත්ව ගන්ධබ්බයෝ වසර ලක්ෂ ගණන් ආයුෂ ඇතිව සියුම් ආහාර අරගෙන කාලයක් සැරිසරන කොට තමයි ඝනීභවනය වෙච්ච පළමු සිරුරු හට ගත්තේ. මේ විදියට මනුස්සයා හට ගත්තු හැටි ලෝකෝප්පත්ති වංශ කතාවේ සඳහන් වෙනවා.**

මේ විදිහට ලෝකයේ තියෙන හැම වචනයකටම නිරුක්තියක් තියේ නම්, ලෝකයේ සිදුවන විවිධ ස්වාභාවික විපත් ආදිය හට ගන්නා හැටිත් නිරුක්තිවලින් විග්‍රහ කරන්න පුළුවන්. භාෂාව මොකක් වුණත් නිරුක්ති පටිසම්භිදා ඥානයට ඒක ගෝචර වෙනවා. උදාහරණ විදිහට මෑත කාලයේදී නිතරම අහන්න ලැබිච්ච වචනයක් තමයි 'සුනාමි' කියන වචනය. මේක ජපන් වචනයක්. නමුත් පද නිරුක්තිය සිංහලෙන් දෙන්න පුළුවන්. ශාක්‍ය, කෝලිය යුද්ධය ගැන කතා කරන කොට පෙර කෙවුල් ගමක මසුන් මරා ජීවත් වෙච්ච පිරිසකට ඒ කරගත් පාපය ඵල දුන්නා කියල විග්‍රහ කරල තියෙනවා. ඒ ගමේ හිටපු දෙගොල්ලන්ම මරා ගන්න හේතු වුණේ ඒකයි. ඒ යුද්ධයෙන් කෝලිය පිරිස ජයගෙන ගංගාවේ වැලිතලාවේ ජය පැන් බිව්වා. ඒ වෙලාවේ මහා ජල කඳක් අකාලයේ ඇවිදින් ඔක්කෝම ගහගෙන ගියා. ඒකෙන් ඒ දෙගොල්ලම විනාශ වුණා කියල සඳහන් වෙනවා. කොටසක් ගහල මරල විනාශ වුණා. අනෙක් කොටස වතුරට ගහගෙන ගියා.

සුනාමියක් ඇති වීමේ ස්වභාවයත් මේ වගෙයි. සමාජයේ යම් කිසි පිරිසක් ඉන්නව නම්, ඒ අයගේ නාමයවත් තියෙන්න නොදී සුන් කරනවා. ඒක තමයි සුන්+නාම-සුනාමි වුණේ. ශාක්‍ය-කෝලිය යුද්ධයේදී ශාක්‍යයන්ගේ නාමයවත් ඉතුරු නොකර සුන් කළා. සුන්නාමු කළා. එදත් වුණේ ඒකයි. ශාක්‍ය-කෝලිය මේ දෙගොල්ලන් එකතු වෙලා කර ගත්තු දේ තමයි එදා තිබුණේ. ඒකට සම්බන්ධ වෙලා පැටලි පැටලී ආපු පිරිස් අදත් ඉන්නව නම් ඒ වගේ අය අදත් එවැනි දේකට ගොදුරු වෙන්න පුළුවන්. මොකද **එක පාප කර්මයක් එක දවසින් ඵල දීල ඉවර වෙන්නෙ නෑ.** ඒ ජාතියේ ඒවා කොච්චර නම් ගෙවන්න තියෙනවද? එහෙම වුණොත් තවත් කාලාන්තරයක් ඉපදි ඉපදී ඒ වගේ ව්‍යසනයන්ට ගොදුරු වෙන්නත් පුළුවන්. අපට කියන්න බෑ කර්ම විපාකයක් කොච්චර කලකින් ගෙවිල ඉවර වෙනවද කියල. එකම පාප කර්මයක් ගෙවල ඉවර කරන්න එක් කාන්තාවක් ඇගේ ලෝම පමණටම අත්බැව් ලබා කැපෙමින් දුක් වින්ද කියල සඳහන් වෙනවා. ''පෙර අඟනක් එක් එළු දෙනක හිස සිඳා-ඇය ඇඟ ලෝම ගණනේ හිස් කැපුම් ලදා'' කියන කොට ඒ ස්ත්‍රිය ඒ විදිහට හිස් සිඳලා නැවත වාරයක් එළිච්චියක් වෙලා ඉපදිලා ඒ විදියටම ඇගේ ලෝම ගණනට බෙලි කැපුම් කෑවයි කියල සඳහන් වෙනවා. එතකොට එක හිස් කැපුමකට කොච්චර නම් විපාකය විඳල තියෙනවද? ඉතින් ඒ වගේ තිරිසන් සතෙක් මරල එහෙමත් විපාක විඳින්න සිද්ධ වුණා නම්, ලෝකයාට යහපත කියා දුන් සත් පුරුෂයන්ගේ නාමය සුන් කෙරුවොත් ඒ හේතුවට ගෝචර වෙච්ච අයට කොච්චර නම් විපාක ගෙවන්න වෙයිද? විවිධ අවස්ථාවල ඒ වගේ සුනාමියන්ට ගොදුරු වෙන්න පුළුවන්.

සුනාමි කියන්නේ ජලයෙන්ම වෙන විනාශ විතරක් නෙවෙයි. සමහර විට ගින්නකින්, සුළඟකින් හෝ මහ පොළොව කඩා වැටීමකින් වගේ දේකිනුත් වෙන්න පුළුවන්. ඉතින් මේ වචනය ජපන් භාෂාවෙන් ආවත් අපටත් සම්බන්ධයි. ඔක්කෝම ඉවරයි, සුනු විසුනු වෙලා ගියා, සුන්වෙලාම ගියා, සුන්නද්දූලි වෙලා ගියා... ආදී වශයෙන් අපි අදත් කියනවා. සුනාමි කියන්නෙත් ඒකයි. අදහස හොඳට ගැළපෙනවා. මොකද විදෙස් භාෂාවක් සමග සම්බන්ධ වෙලා ආවට ඒ අයත්, සියල්ලෝමත් මාගධී මූල භාෂාව කියන මුල් භාෂාව භාවිතා කරපු උදවිය. සියලු සත්වයින්ගේ පරම්පරාව ඒකයි. එතකොට ඒ සත්වයින්ගේ ඒ ගති ලක්ෂණය අභ්‍යන්තරයේ සැඟවිලා තියෙනවා. මොකද ආගන්තුක භාෂාවකින් කතා කළත් ඒ හඬට අනුකූල ස්වභාවයකට ගැළපෙන අදහසක් එනවා. ඒ අයගේ තියෙන ගති ලක්ෂණ ආදියේ ස්වභාවය නිසා වෙනත් භාෂා හඬකින් පරිවර්තනය වෙලා ආවත් එහි ස්වභාවය මුල් හඬට අනුරූපයි.

මේකට තවත් හොඳ උදාහරණයක් තමයි අපි 'අම්මා' කියන වචනයට 'උම්මා' කියන වචනයක් තවත් පිරිසක් කියනවා. තවත් පිරිසක් මදර් (Mother) කියල කියනවා. ඒ වගේ තවත් කොටසක් මමා කියනවා, මම් කියනවා, මාතා කියනවා. ඒ වගේම විවිධ භාෂාවලදී 'මා', 'මාජි', 'මේටර් (Mater), 'මාතෘ', 'මම්' (mom) ආදී නම් භාවිතා කරනවා. එතකොට අපි 'පියා' කියන වචනයට ශුද්ධ මාගධියෙන් කිව්වේ පීතු කියල. සංස්කෘතයෙන් පීතෘ කිව්වා. ඉංග්‍රීසියෙන් ෆාදර් (Father) කිව්වා. ද්‍රවිඩ භාෂාවෙන් පප්පා, අප්පා කිව්වා. තවත් කොටසක් පීතා, පේටර් ආදී නම් භාවිතා කරනවා. මේ හැම අවස්ථාවකදීම සමාන ශබ්දය වෙනස් ආකාරයකින් ඇවිත් තියෙනවා. ඒ වගේ මෙතනදීත් 'මා, පා' කියන ශබ්දයන් මව්පියන් හැඳින්වීමේදී විවිධ භාෂාවල සමානත්වයකින් යෙදෙනවා. මේ කියන ලක්ෂණයේ ස්වභාවය බොහෝ භාෂාවල තියෙනවා. ඉතින් මේ වගේ අනෙක් භාෂාවලත් තිබුණට අපිට තේරුම් ගැනීමේ හැකියාව තමයි අඩු. මුල් නිරුක්තියෙන් ඒ වචන පරිවර්තනය වෙච්ච හැටි තමයි මේ. නමුත් වචනවලින් පෙන්වන මූල ධර්මයක් තිබුණ නම් ඒක ඒ විදිහටම තියෙන බව පේනවා.

මේ කියන මූල ධර්මය මුලින්ම තිබුණේ මාගධී නිරුක්තිය මුල් කරගෙන. **නිරුක්ති පටිසම්භිදා ඥානය උපරිමයෙන් තියෙනව නම් ඒ මාගධී භාෂාවට යන කල්ම මේ වචන ආපසු සැරයක් බිඳිච්ච හැටියටම ගන්න පුළුවන්.** එතකොට හැම වචනයකම මූල එතැන. ඒ ඥාන මට්ටමින් තමයි ඒක හොයාගෙන ආපසු යන්නේ. නමුත් අද බැලුවොත් කිසිම විද්‍යාවකවත්, භාෂා ශාස්ත්‍රයකවත් එහෙම රටාවක් ගැන හිතලවත් නෑ. මේ නිසා තමයි මේ මාගධී නිරුක්ති ක්‍රමය පොඩ්ඩක් හරි ගෑවෙන කොටම සමහර භාෂා තර්කවාදීන් කුපිත වෙන්නේ. මොකද මේ ක්‍රමය ඒගොල්ලන් හදල තියෙන ක්‍රම රටාවට අයිති නැති, ඥාන ගෝචර ධර්මයක් නිසා. **ව්‍යවහාරයෙන් ඇති වන වෙනස්වීම් භාෂා පණ්ඩිතයන්ගෙන් ඇති වන දෙයක් නෙවෙයි, සාමාන්‍ය ලෝකයාගෙන් සිද්ධ වෙන දෙයක්.** මේ කියන ව්‍යවහාර භාෂාව නිසා තමයි නිරුක්ති හැදුණේ. එහෙම නැතිව දැන් තියෙන වට අකුරු භාෂා ශාස්ත්‍රයකට අනුව නෙවෙයි. නමුත් පසුකාලීනව පොත්පත් ලියන කොට බොහෝ කොටම හදාගත් භාෂා ව්‍යාකරණ රීතිවලට අනුව තමයි වට අකුරු ශාස්ත්‍රයෙන් ඒවා සකස් කරල තියෙන්නේ.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# දස දිසා බන්ධන බුද්ධ ආරක්ෂාව

බුදුන් වහන්සේ දේශනා කොට වදාළ සූත්‍ර දේශනා දහස් ගණනක් අතරින් දැනට අපේ ත්‍රිපිටකයේ සූත්‍ර සැහෙන ප්‍රමාණයක අඩුවක් යම් අතපසුවීමකින් හෝ වෙනත් යම් ක්‍රියාවකින් හෝ ඉවත්වී තියෙනවා. මේ බව ත්‍රිපිටක සංඥාපනවලත් සඳහන් වෙනවා. මේ නිසා මුඛ පරම්පරාවෙන් හෝ අටුවා කථාවකින් හෝ පැවත එන යම් සූත්‍ර දේශනාවක් ත්‍රිපිටකයේ සටහන් නොවෙච්ච පළියට ඒක බුද්ධ දේශනාවක් නෙවෙයි කියල අපට අහක දාන්න බෑ. මොකද යම් කිසි මාධ්‍යයකින් අද දක්වාම ඒ වගේ සූත්‍ර දේශනාවන් ආවේ යම් කිසි සත්‍යතාවයක් ඒවායේ තියෙන නිසයි. ජලනන්දන පිරිත වගේම දස දිසා බන්ධන පිරිත කියන්නෙත් ඒවගේ ත්‍රිපිටකයේ නැති, නමුත් බොහෝ පිරිත් පොත්වල තියෙන, ඉතා පැරණි කාලයේ පටන් ථේරවාදී පරපුර භාවිතා කරල තියෙන පිරිතක් බව පෙනී යනවා. මේකට චුල්ල ජින පඤ්ජර පිරිත කියලත් කියනවා. මේ පිරිත පටන් ගත්තු තැනක් හොයාගන්න නැති වුනත්, ත්‍රිපිටකයේ පිරිත් සූත්‍ර ගණනාවක් අඩු නිසා මේකත් ඒ කාලෙ තිබිල පසු කාලීනව හැලිච්ච ආරක්ෂා පිරිතක් වෙන්න පුළුවන්. මේක බොහොම බලවත් ආරක්ෂා පිරිතක් බවට අත්දැකීම් තියෙනවා.

මෙතනදී පෙන්වා දීල තියෙන්නෙ බුදු-රජාණන් වහන්සේලා දස නමකගේ නම් මුල් කරගෙන දස දිසාවට පිහිටුවල සියලු බුදුවරයන් වහන්සේලාගේම බල පිහිටන්න කියල අධිෂ්ඨාන කරන එකයි. අපේ සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ පළමු නියත විවරණය ගත්තේ දීපංකර බුදුපියාණන් වහන්සේ-ගෙන්. එතකොට දීපංකර බුදුපියාණන් වහන්සේ ඇතුළු අටවිසි බුදුපියාණන් වහන්සේලාගෙන් දස නමකගේ නම් මේකට සම්බන්ධ වෙනවා. (නියත විවරණ ගන්න පෙර අනියත විවරණ ගත් ඒ කල්පයේම පහළ වූ තණ්හංකර, මේධංකර, සරණංකර යන බුදුවරු 3 නමයි. ඉන් පසු නියත විවරණ ගත් බුදුවරු 24 නමයි. මේ අනුව ගෞතම බුදුන් වහන්සේත් සමග 28 නමයි.) ඒ වගේම මෙතනදී අපි කියන ලෝක සම්මත දස දිසාව හෝ පුද්ගලිකව කෙනෙකු ඉදිරිය බලා ගත්තම (ආර්ය මෛත්‍රී භාවනාවේ පෙන්වා ඇති පරිදි) ඒ පුද්ගලයාගේ දස දිසාව හෝ අයත් වෙනවා.



දිසාසු දස භාගේසු - ඨිතා බුද්ධානු භාවතෝ
වේරාදි අන්තරායාපි - විනස්සන්තු අසේසතෝ
ඒවමාදි ගුණෝපේතං - පරිත්තං තං භණාමහේ
පදුමුත්තරෝ පුරත්ථිමායං - අග්ගිනේ චේව රේවතෝ
දක්ඛිණේ කස්සපෝ බුද්ධෝ - නිරිතේච සුමංගලෝ
පච්ඡිමේච සිඛී බුද්ධෝ - වායබ්බ්‍යා මේධංකරෝ
උත්තරේ පියදස්සීච - ඊසානේ දීපංකරෝ
පඨවියං කකුසන්ධෝච - ආකාසේ සරණංකරෝ
ඒවං දසදිසාචේව - සබ්බේ බුද්ධා පතිට්ඨිතා
අච්චන්තරායා සබ්බේ (මේ) - සෝක රෝග භයාපිච
විනස්සන්තු සදා (මයිහං) - සබ්බීරියාපතේසුච
යක්ඛාදි දේවතා භීච - රාජ චෝරාරි අග්ගභි
අමනුස්සේපි සබ්බේපි - තිරච්ඡානගතේසුච
ජාතා සබ්බේ විනස්සන්තු - උපද්දව අසේසතෝ
සබ්බ බුද්ධානු භාවේන - සබ්බ රෝග විනස්සතු
සබ්බ භය විනස්සතු - සබ්බ වින විනස්සතු
සබ්බන්තරාය විනස්සතු - වින බන්ධන විනස්සතු
උද්ධං අධෝච තිරියංච - අසම්බාධං අවේරං අසපත්තං
සාදු ! සාදු ! සාදු !

විවිධ පොත්වල මේ පිරිත සටහන් කරල තියෙන ආකාරයන් අනුව අක්ෂරවල යම් යම් වෙනස්කම් තියෙන්න පුළුවන්. ඒ අතරින් අත්හදා බලල ප්‍රතිඵල තියෙන එකක් තමයි මේ ඉදිරිපත් කරල තියෙන්නෙ.

ඒ වගේම මේ පෙන්වා තියෙන පිරිතේදී පිරිත් පොතේ තියෙන කොටසට අමතරව, අත්දැකීම් සහිත විවිධ බන්ධන කැපෙන්න ගාථා කොටසකුත් එකතු කරල තියෙනවා. සබ්බ රෝග විනස්සතු..... සබ්බ භය විනස්සතු..... ආදී වශයෙන් කියන කොටස තමයි ඒ විදියට එකතු කරල තියෙන්නෙ. එහෙම නැතිව සාමාන්‍යයෙන් පිරිත් පොතේ තියෙන විදියට නම් සබ්බ බුද්ධානු භාවේන සොත්ථි මේ / තේ හෝතු සබ්බදා කියන තැනින් ඉවර වෙනවා. මේ නිසා කෙනෙකුට අවශ්‍ය නම් සාමාන්‍ය පිරිතක් විදියට එතැනින් ඉවර වෙන්න කියන්නත් පුළුවන්. නමුත් මේ පෙන්වා තියෙන අනෙක් කොටසත් ගත්තොත් බැඳිල තියෙන බරපතල බන්ධන ආදියත් කැපෙන්න හේතු වෙනවා.

**සියලු ආරක්ෂාවන්ට, වින බන්ධන කැපීම් ආදියට මේ පිරිත ඉතා සුදුසු වුනත්, එහෙම ගන්නකොට බොහොම පරිස්සමින් තමයි කරන්න ඕන.** මොකද බන්ධන කැපෙන කොට සමහර අමනුස්ස කොටස් ඇවිස්සිලා ඒ අයට ඉන්න අමාරු වෙනවා. මහ බන්ධන පවා කැපෙන නිසා මේකට හුඟක් අමනුස්සයො බය වෙනවා, ඒ සීමාවේ ඉන්න බැරිව යනවා. මේ නිසා ☞

ගෙදරක මේ පිරිතෙන් ආරක්ෂාවක් කරන කොට ඒ ගෙදර ප්‍රබල නරක ගති තියෙන කෙනෙක් ඉන්නව නම්, ඒ ගති තියෙන අමනුස්සයො ඇවිස්සිලා රෞද්‍ර බව වැඩිවෙනවා. ඒ කියන්නේ ඒ පුද්ගලයාගේ ගතිය අර අමනුස්ස ගතියට සමාන නම් තමයි එහෙම වෙන්නේ. හැබැයි ඉතින් එහෙම කලාතුරකින් තමයි තියෙන්නේ. ටික කාලයක් අමනුස්සයො ඇවිස්සිලා ගියත් ජීවම් ආරක්ෂාව සම්පූර්ණ වෙනකොට ඒක නැතිවෙලා යනවා.

මේ නිසා මේ පිරිත ගෙවල් ආරක්ෂාවක් විදියට (මින් පෙර පෙන්වා දුන් දිෂ්ඨි, ප්‍රාණ, පලිප්පු .... ආදිය යොදා ගෙන) යොදා ගන්න කොට එක පාරටම කරන්න හොඳ නෑ. ටිකෙන් ටික තමයි කරන්න ඕන. ඒ කියන්නෙ පළමුව 108 වරක් ජීවම් කරල, ඒකෙන් දින 7 ක් පමණ පහන් පත්තු කරල, අවශ්‍ය නම් වැලි සුවඳ දුම් ආදියත් ඉහිනවා. ඒ සතියෙන් පස්සෙ දෙවනුව ඒ විදියටම 324 වරක් ජීවම් කරල ඒකෙනුත් අර විදියටම සතියක් පමණ පහන් පත්තු කරල, වැලි සුවඳ දුම් ආදිය ඉහිනවා. ඉන් පසු තුන් වන වරට 1008 වාරයක් ජීවම් කරල ඒකෙනුත් පහන් පත්තු කරල, වැලි සුවඳ දුම් ආදිය ඉහිනවා. මේ ආකාරයට ආරක්ෂාව පිහිටු වනවා. මේ විදියට උපරිමය 1008 වාරයකට වඩා කරන්න හොඳ නෑ. මොකද ඊට වැඩියෙන් කළොත් ප්‍රබල අමනුස්ස දිෂ්ඨි ඇවිස්සිලා ඒවා කපන්න දොළ පිදේනි ආදිය දෙන්න වෙනවා. නමුත් මෙතනදී එවැනි කිසිම දොළ පිදේනි දීමක් නැතිව බුද්ධ බලයෙන් කෙළින්ම කපල දාන නිසා අමනුස්සයෝ කිපෙනවා. හැබැයි බන්ධන කැපිල සුද්ධ වුනාට පස්සෙ නම් ගැටළුවක් නෑ. එතකල් උන් කිපෙනවා, නැත්නම් ගති කුපිත වෙනවා, නරක ගතියෙන් පිරිස් මැඩ පවත්වගෙන ඉන්න අයගෙ බලය කැපෙනවා. එතකොට චණ්ඩින්ට ගහල මෙල්ල කරනවා වගේ වැඩක් තමයි සිද්ධ වෙන්නේ. මේ නිසා ඉහත පෙන්වා දුන්නු විදියට ආරක්ෂාව කරගත යුතුයි.

හැබැයි මේ විදියට ආරක්ෂාකාරීව කරන්න අවශ්‍ය වෙන්නෙ, මේ පිරිත ජීවම් ආරක්ෂාවක් විදියට කරනව නම් විතරයි. එහෙම නැතිව සාමාන්‍ය පිරිතක් විදියට උදේ හවා සජ්ජායනා කළාට කිසිම ප්‍රශ්නයක් නෑ. ඒකත් බොහොම හොඳයි. එතකොට අමනුස්ස ප්‍රශ්න නෑ. උදේ හවස වරකට එක් වරක් හෝ තුන් වරක් හෝ හත් වරක් සජ්ජායනා කළාම ප්‍රමාණවත්. නමුත් අර ජීවම් ආරක්ෂාව කරන එක විශේෂ ආරක්ෂාවක් සපයා දෙන ක්‍රමයක්.

ඊළඟට මෙහි පෙන්වා තියෙන සබ්බ බුද්ධානු භාවේන කියන කොටස වෙනුවට අවශ්‍ය නම් සබ්බ බුද්ධානු භාවේන- සබ්බ ධම්මානු භාවේන- සබ්බ සංඝානු භාවේන ලෙසත්, එහෙම නැත්නම් බුද්ධ රතනානු භාවේන- ධම්ම රතනානු භාවේන- සංඝ රතනානු භාවේන ලෙසත්, එසේත් නැත්නම් බුද්ධ රතනානු භාවේන (බුද්ධ රත්නයේ ආනුභාවයෙන්) ලෙසත් යොදා ගන්න පුළුවන්. මොකක් හරි තමන් කැමති මේ ඕනෑම එක ක්‍රමයක් දිගටම පාවිච්චි කරන්න පුළුවන්.

ඒ වගේම තමන්ගේ ආරක්ෂාවට විතරක් කියනව නම් වරහන් තුළ ඇති (මේ) යන්නත්, පොදුවේ තමන් ඇතුළු සියළුම දෙනාගේ ආරක්ෂාවට කියනව නම් එතැනට (තේ) යන්නත් යොදා ගත යුතුයි. ඒ වගේම තමන්ගේ ආරක්ෂාවට වහරන් තුළ යොදා ඇති (මයිහං) යන්නත් පොදුවේ තමන් ඇතුළු සියලු දෙනාටම කරන කොට ඒ වෙනුවට (තුයිහං) යන්නත් යොදා ගත යුතුයි. මෙහිදී පොදුවේ කරන නිසා (තේ / තුයිහං) කියල යෙදුවත් ඒක සියලු දෙනාටම නිසා තමනුත් අයිති වෙනවා. මේ =මම, මයිහං =මගේ, තේ =අනුන්, තුයිහං =අනුන්ගේ

දැන් මේ ගාථාවේ අර්ථය දැනගැනීමත් වැදගත් වන නිසා ගාථාවේ කොටස්වල අර්ථයන් වෙන වෙනම පහත දක්වා තියෙනවා.

දිසාසු දස භාගේසු - දස දිසා භාගයන්හි (සියලු දිසාවන්හි)

ඨිතා බුද්ධානු භාවතෝ - බුදුවරයන් වහන්සේලාගේ ආනුභාව පිහිටුවනවා

වේරාදි අන්තරායාපී - වෛර හා අන්තරාවෝ

විනස්සන්තු අසේසතෝ - ශේෂයක් නැතිව (ඉතිරි නැතිව) විනාස වේවා

ඒවමාදි ගුණෝපේතං - ආදියේ පටන් එන්නා වූ ඒ මහා උත්තම ගුණය

පරිත්තං තං භණාමහේ - ඒ උතුම් ගුණ ආරක්ෂාව මම ප්‍රකාශ කරනවා

පදුමුත්තරෝ පුරත්ථිමායං - පෙර දිසාවේ පදුමුත්තර බුද්ධ ආරක්ෂාව

අග්ගිනේ චේව රේවතෝ - ගිණිකොණ දිසාවේ රේවත බුද්ධ ආරක්ෂාව

දක්ඛිණේ කස්සපෝ බුද්ධෝ - දකුණු දිසාවේ කාශ්‍යප බුද්ධ ආරක්ෂාව

නිරිතේච සුමංගලෝ - නිරිත දිසාවේ සුමංගල බුද්ධ ආරක්ෂාව

පච්ඡිමේච සිඛී බුද්ධෝ - බටහිර දිසාවේ (පසු දිග) සිඛී බුද්ධ ආරක්ෂාව

වායබ්බ්‍යා මේධංකරෝ - වයඹ දිසාවේ මේධංකර බුද්ධ ආරක්ෂාව

උත්තරේ පියදස්සීච - උතුරු දිසාවේ පියදස්සී බුද්ධ ආරක්ෂාව

ඊසානේ දීපංකරෝ - ඊසාන දිසාවේ දීපංකර බුද්ධ ආරක්ෂාව

පඨවියං කකුසන්ධෝච - පොළව දිසාවේ (යට දිසාවේ) කකුසඳ බුද්ධ ආරක්ෂාව

ආකාසේ සරණංකරෝ - උඩ දිසාවේ සරණංකර බුද්ධ ආරක්ෂාව

ඒවං දසදිසාවේච - ඒ ආකාරයෙන් දස දිසාවේම

සබ්බේ බුද්ධා පතිට්ඨිතා - සියලු බුදුවරයන් වහන්සේලා පිහිටුවනවා

අච්චන්තරායා සබ්බේ (මේ) - ඒ ඇසුරේ තිබෙන්නා වූ මේ සියලු

සෝක රෝග භයාපිච - සෝක රෝග හා භය ආදිය

විනස්සන්තු සදා (මයිහං) - මා කෙරෙහි සියලු ආකාරයෙන් වැනසේවා

සබ්බීරියාපතේසුච - සියලු ඉරියා පථයන්හිම

යක්ඛාදි දේවතා භීච - යක්ෂ හා දේවතා භය

රාජ චෝරාරි අග්ගහි - රජ හා සොරුන්ගේ ගැහැට

අමනුස්සේපි සබ්බේපි - සියලු අමනුස්සයින්ගේ

තිරච්ඡානගතේසුච - තිරිසන් ගත සත්වයින්ගේ

ජාතා සබ්බේ විනස්සන්තු - උපන්නා වූ සියලු (භය) විනාස වේවා

උපද්දව අසේසතෝ - සියලු උපද්‍රව ශේෂයක් නැතිවම

සබ්බ බුද්ධානු භාවේන - සියලු බුදුවරයන් වහන්සේලාගේ ආනුභාවයෙන්

සබ්බ රෝග විනස්සතු - සියලු රෝග විනාස වේවා

සබ්බ භය විනස්සතු - සියලු භය විනාස වේවා

සබ්බ වින විනස්සතු - සියලු වින විනාස වේවා

සබ්බන්තරාය විනස්සතු - සියලු අන්තරායන් විනාස වේවා

වින බන්ධන විනස්සතු - සියලු වින බැඳීම් විනාස වේවා

උද්ධං අධෝච තිරියංච - උඩ යට වට

අසම්බාධං අවේරං අසපත්තං - බාධා නොවේවා, වෛර නොවේවා,

සාප නොවේවා

සාදු ! සාදු ! සාදු !

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# ඉනා බන්ධන, වශී ගුරුකම් ආදියෙන් ලෙඩ රෝග ඇති වන හැටි....

*(පසුගිය කලාපයෙන් - මිනී ඇළුවලින් කරන කොඩිවිනවලින් ලෙඩ රෝග කරදර ඇති වෙන හැටි)*

''**වශී! වශී! පිනට වශී!.....** පන්නන්න, ගෙන්නන්න, පලිගන්න..... අති ප්‍රබල වශී ගුරුකම්..... වරු තුනෙන් ප්‍රතිඵල.... ඔබ හෝ ඇය ඔබව මුලා කොට මග හරිනවද? දින හතෙන් දෙපා මුලට ගෙන්වා දෙමි..... නීච කුල වශී ගුරුකම්..... පිං පිණිසයි..... ඔබ ප්‍රේමයෙන් පරාදද? ඔබ පතන කෙනා පිට රටක හිටියත් සදහටම වශී කර ගෙන්වා ගැනීමට..... පරම්පරාවෙන් පැවත එන රොඩී දහැනින් ස්ත්‍රී පුරුෂ වශී...... නීච කුල ස්ත්‍රී පුරුෂ වශී.... නොමිලේ..... හරිගිය පසු ආධාර කරන්න...... මවක් මෙන් පිහිට වෙමි..... පරම්පරාවෙන් පැවත එන චණ්ඩාලීන් වශී කළ නීච කුල වශී ගුරුකම් තාමත් අප අතර පමණක්.... ගැහැණියකගේ දුක හඳුනන්නේ තවත් ගැහැණියක් පමණි..... ව්‍යාජ ගුරුන්නාන්සේලාගෙන් හා ගුරු මැණිවරුන්ගෙන් ඔබ මුලාවී සිටීද? පසු තැවෙන්න එපා..... මම ඔබට පිහිට වන්නේ පිං පිණිසයි.... මෙතෙක් කල් කළ ගුරුකමක් වැරදී නැත. හරියටම හරි..... තවත් මුලා නොවන්න..... බොරු කරන්නන්ට අභියෝග කරමි. අහිමි ආදරය යළි ලබාගැනීමට..... හැර ගිය අය ගෙන්වා දෙමි.....''

මේ තියෙන්නේ අපේ රටේ දිනපතා බොහෝ පුවත්පත්වල පිටු ගණන් පුරවන ප්‍රසිද්ධ දැන්වීම් අතරින් කිහිපයක්. මේ ටික මෙහෙම සඳහන් කළේ තවත් වැදගත් කාරණයක් පෙන්වා දෙන්න. මේ වගේ දැන්වීම් දිහා ඉතා සුපරීක්ෂාකාරීව බලන්න. අසරණ මිනිස්සුන්ට පිහිට වෙන්න මේ අය අතර තියෙන කුලල් කාගන්නා අතිශය තරඟකාරීත්වය තේරුම් ගන්න මේ දැන්වීම් කිහිපය හොඳටම ප්‍රමාණවත්. ඒකටම හරියන්න මුදල් දෙනව නම් ඕනෑම දෙයක් පළකරන්න සූදානම් පුවත්පත්වලින් අඩුවකුත් නෑ. එක්කෝ මේකෙ තියෙන බරපතලකම දන්නෙ නැතිව, එහෙම නැත්නම් දැනගෙනත් මුදල්වලට තියෙන ගිජුකම නිසා මේ වගේ දේවල් පළකරන්න මාධ්‍ය පෙළඹිලා තියෙනවා.

සාමාන්‍යයෙන් සමාජයේ අපරාධ විදියට සලකන්නේ මිනීමැරුම්, මංකොල්ලකෑම්, ස්ත්‍රී දූෂණ, ළමා අපචාර, සොරකම.... වගේ දේවල්. ඕනෑම කෙනෙක් විවාදයකින් තොරව මේවා අපරාධ විදියට සලකනවා. අපරාධ කියල කිව්වම ජනතාව අතර ප්‍රසිද්ධ වෙලා තියෙන්නෙ මේ වගේ දේවල් විතරයි. නමුත් සාමාන්‍යයෙන් සමාජයේ කතා නොකරන, වෛද්‍ය විද්‍යාවටත් හසු නොවන දරුණු ලෙඩරෝග කරදර ආදියට



මුල පුරන තවත් ප්‍රබල අපරාධයක් සම්බන්ධ ඉතා වැදගත් තොරතුරු ටිකක් තමයි මේ හෙළි කරන්නේ.

තමන් කැමති ස්ත්‍රිය හෝ පුරුෂයා ලබාගන්න නොහැකි වුණාමත්, හොඳින් ඉන්න දෙන්නෙක් වෙන් කරන්නත්, තවත් කෙනෙකුගෙන් පළිගන්නත්, කෙනෙකුගේ දියුණුවක් දැකල ඒක කඩාකප්පල් කරන්නත්..... මේ ආදී නොයෙක් කටයුතුවලට බොහොමයක් මිනිස්සු අදත් මේ වගේ දේවල් පස්සෙ තමයි දුවන්න පෙළඹිලා ඉන්නෙ. **මුදල්, ඉඩකඩම් හෝ වෙනත් කාම වස්තුවක් මුල්කර ගෙන තමයි මේකට ප්‍රධාන වශයෙන්ම පෙළඹෙන්නෙ.** ඒ අතරින් එන ප්‍රශ්නවලට දෙන ප්‍රධාන ගුරුකමක් තමයි වශී, ඉනා ආදී වශයෙන් හඳුන්වන්නෙ. තමාට අවශ්‍ය දේට සම්බන්ධ කරල දෙනව කියන එකයි වශී කියන්නෙ. වශ්‍යතාවය ආපුවම අවශ්‍ය වෙනවා. ඒකට තමයි වශී කියල කියන්නෙ. මේක යම්කිසි මන්ත්‍ර බලයකින් අමනුස්සයින් සම්බන්ධ කරගෙන, ඒ වගේම මනුස්ස ශරීරයේ නියපොතු කෑල්ලක්, ලේ බිඳක්, කෙස් ගහක් වගේ දේකුත් සම්බන්ධ කරගෙන, යම්කිසි පුද්ගලයෙක් එල්ල කරල තමයි සිද්ධ කරන්නෙ. මීට අමතරව මේ වගේ ශරීර කොටස් හෝ ආහාර හෝ අමනුස්සයින් සම්බන්ධ කර නොගෙන යම් මන්ත්‍ර බලවලින් තමන්ට අවශ්‍ය කරන කටයුත්තට පුද්ගලයන් නැඹුරු කරගන්න වශී ක්‍රමයකුත් තියෙනවා. රාජ වශී ආදී වශයෙන් කියන්නෙ ඒ වගේ ක්‍රමයක්. නඩු හබ දිනන්න වගේ කටයුතුවලට ඒ ක්‍රමය පාවිච්චි කරනවා. නමුත් අද බොහෝ කොටම වශී කියල සිද්ධ කරන්නෙ ස්ත්‍රී පුරුෂයන් එකතු කරන ක්‍රමයක්. ඊළඟට ඉනා කියල කියන්නෙත් මේ වගේ දෙයක්ම තමයි. ඉන්න තැනට ආවා කියන එකයි ඉනාව කියන්නෙ. ඒ කියන්නෙ තමන්ට අවශ්‍ය තැනට අවශ්‍ය කෙනාව ගෙන්න ගන්නවා. එතකොට දාල යන්න බෑ. මේකෙ විද්‍යාත්මක පසුබිමකුත් තියෙනවා.

නවීන විද්‍යාවෙන් ජාන තාක්ෂණය කියල එකක් හොයාගෙන තියෙනවා. යම් කිසි කෙනෙකුගේ තියෙන ජාන තවත් කෙනෙකුගේ ජාන සමග එකිනෙකට වෙනස්. මෙතනදී කෙනෙක්ගෙ සෛලවල තියෙන ජාන ආකර්ශනය කරන්න පුළුවන් ක්‍රමයක් තියෙනවා. ඒ වගේම අද මිසයිල වගේ බෝම්බ හදල තියෙනවා, යම්කිසි පුද්ගලයෙක් ඉන්න තැන හොයාගෙන ගිහින් එතැනට වැටෙන්න. ඒක නවීන තාක්ෂණය කරන වැඩක්. මෙන්න මේ වගේ **යම්කිසි කෙනෙකුගේ නියපොතු කෑල්ලක්, කෙස් ගහක්, ලේ ටිකක් සම්බන්ධ කරගෙන කරන ආකර්ශනයක් තියෙනවා.** ශරීරයේ පුංචි කොටසක පවා ජාන කියන ☞

එක තියෙනවා. ඒක සම්බන්ධ කරල තමයි තව කෙනෙකුට දෙන්නෙ. මේ වගේ දෙයක් කරන කොටත් මොකක් හරි කන බොන ආහාරයකට දාල තමයි තව කෙනෙකුට දෙන්නෙ.

කන ආහාරයක් නම් ඒක දෙනකොට කෑමත් එක්ක බොහෝ කොටම බටු මාළුවක් සම්බන්ධ කරනවා. මොකද බටු පොත්ත ගිහින් බඩවැලේ කොහේ හරි තැනක ඇලෙනවා. ඇලුනම එතැන තමයි අමනුස්සයත් එක්ක අජීර්ණ වෙලා සෙම බැඳෙන්නෙ. මේ වගේ ඉනා දෙන්නෙත් බොහෝ දුරට ඇලෙන දේවල් එක්ක සම්බන්ධ කරල. ජීවම කරල දෙන දේ බටුවලට දාල දුන්නම ඒක ගිහින් ඇලෙනවා. ඒක මන්ත්‍රවලින් කරන දෙයක්. රසයෙන්, සුවඳින්, පාටින් හොයන්නත් බෑ. බටුවල තියෙන තෙල් ගතිය නිසා වැඩේ තවත් ලේසියි. මේ වගේ වැඩ කරන ලංකාවේ එක්තරා ප්‍රදේශයක අදත් කවුරුහරි කසාදයක් බැඳගෙන ආවොත්, උඹ බටු මාළුව කෑවද කියල කතාවටත් අහනවා. මොකද අර ක්‍රමයට ගෙන්න ගත්තයි කියල තමයි හිතන්නෙ. ඒ තරම් ඒ ප්‍රදේශය ඒ වගේ වැඩවලට ප්‍රසිද්ධයි.

ඒ වගේම බොන කිරි වීදුරුවකට, සුප් එකකට, වතුර වීදුරුවකට හෝ වෙනත් බීමකට වගේම චොක්ලට්වලටත් මේ වගේ දාල දෙන්න පුළුවන්. මේ වගේ අවස්ථාවකදී ඇලෙන දෙයක් විදියට සීනි සම්බන්ධ කරනවා. හැම වෙලේම සිහි කරන න්‍යාය තමයි සීනි කියන්නේ. ඒ කියන්නේ දෙන්නෙක් එකතු කරන්න තමයි සීනි යොදාගන්නේ. මේවත් සමගම අමනුස්සයෙක්, ඌට අවශ්‍ය ආහාරය සපයල මන්ත්‍ර බලයෙන් බන්ධනය කරනවා. මෙතනදී අමනුස්සයා කටින් ඇතුල් වෙන්න අවශ්‍ය නෑ. කිරණ වශයෙන් ශරීරයට ඇතුල් වෙනවා. දැන් මේ වගේ විවිධ ක්‍රමවලට ඉනාව හෝ වශිය කළාට පස්සෙ ඒක ක්‍රියාත්මක වෙන විදියක් තියෙනවා.

**යම් කිසි පුද්ගලයෙකුගේ පුංචි කොටසක පවා ජාන තියෙනවා. ඒ ජානවල පුද්ගලයාගේ සම්පූර්ණ ස්වභාවය හා ස්වරූපය පිහිටල තියෙනවා.** මේක වෛද්‍ය විද්‍යාවෙනුත් හොයාගෙන තියෙනවා. ඒ වගේම දිව්‍යසට, සමාධියට ගෝචර කරගන්නත් පුළුවන්. දැන් අර වගේ දෙයක් දුන්නට පස්සෙ ඒක ගිහින් ජාන ශක්තියත් එක්ක පුද්ගලයාගේ හෘදය වස්තුවට සම්බන්ධ වෙනවා. හෘදය වස්තුවේ හිත හටගන්නා සීමාවට ඒක ආකර්ශනය වෙලා අර ශරීර කොටස් හිමි පුද්ගලයාගේ රූපය එතැන වැටෙනවා. ඒක ආහාරය නෙවෙයි, ආහාරය නිසා මතුවෙච්ච එක්තරා කිරණ ශක්තියක්. ඒ කිරණ ශක්තියේ තමයි අර පුද්ගලයාගේ රූප ස්වභාවය තියෙන්නේ. ඒ රූපය තමයි හදවත ඇසුරු කරගෙන පිහිටන්නේ. හදවතේ සිට බාහිර ධර්ම වශයෙන් තමයි මේක පිහිටන්නෙ. එතකොට මනංච පටිච්ච ධම්මේච උප්පජ්ජති මනෝ විඤ්ඤාණං කියන සිද්ධාන්තයට අනුව, ධර්ම වශයෙන් අර හැදිච්ච පුද්ගලයාගේ රූපය ඒ ඉනාව කැවිච්ච පුද්ගලයාගේ සිතට සට්ඨනය වෙනවා. දැන් ඒක හදල තියෙන්නෙ පුද්ගලයා වසඟ වෙන විදියට අදහස් දීලා. ඒ කියන්නේ දැක්ක ගමන් හිත ඇදිල යන්න, වශී වෙන්න, සතුටු වෙන්න පුළුවන් විදියට. හිනාවෙච්ච මූණයි තරහ මූණයි කියන්නෙ දෙකක්. මේ වගේ හදවතේ ඇති කරල තියෙන ඉනා බන්ධනයෙන් හැදිච්ච රූපයෙන් ඒ වගේ ආකර්ශන මුහුණක් ඇති කරනවා. එතකොට ඒ පුද්ගලයාට නිතරම අර ධර්මය සට්ඨනය වෙන කොට ඒ **හදවතේ ඇදිච්ච පුද්ගලයා සම්බන්ධ සිතිවිල්ල, ස්වරූපය අහක් කරගන්න බැරුව යනවා. කොච්චරවත් ඒ පුද්ගලයාගේ රූපය මතක් වෙනවා. ඒ මතක් වෙන්නෙත් ප්‍රිය මනාපයෙන්.** කලින් තරහ වෙලා හිටපු දෙන්නෙක් යාළු කරල දෙනව කියන්නෙත් මෙහෙම දෙයක්. **මේ ප්‍රියමනාපය කොච්චර බලවත්ද කියනව නම් ඒ වශිය (ඉනාව) කාපු කෙනාට, තමන්ට මෙහෙම දෙයක් දීල තියෙනවයි කියල කිව්වට ඒක ලේසියෙන් පිළිගන්නෙ නැති මට්ටමට ඒ පුද්ගලයාගේ මනස වැහෙනවා. ඒ තරම් දැඩි බැඳීමක් අර පුද්ගලයා (ස්ත්‍රිය හෝ පුරුෂයා) කෙරෙහි ඇති වෙනවා. ඒ බැඳීම පස්සෙන් යන තරමටම ප්‍රබල වෙන්නත් පුළුවන්.**

එතකොට මේ ආකර්ශනය යම් කිසි මන්ත්‍ර ශක්තියකින් කරන්නේ. ඒ ශක්තිය නිසා ඉනාව දුන්නම ඒ ආහාරයේ ප්‍රධාන කොටස ගිහින් බඩේ කොතැනක හරි බැඳෙනවා. එහෙම බැඳිල එතැන අමනුස්සයින් අරක් ගන්නවා. ඒ අමනුස්ස කොටස් පාවිච්චි කරන්නේ කෙනෙක්ව බැඳගන්න, ගෙන්න ගන්න, පාලනය කරන්න වගේ වැඩවලට. මේ කොටස්වලින් එක්තරා අති සූක්ෂම කොටසක් තමයි අර කලින් කිව්ව වගේ හදවතේ ලේ ඇසුරට යන්නෙ. ඒක හදවත ඇසුරේ දිගටම පවතිනවා. කාටවත් හොයන්නත් බෑ. ඒක ගිහින් පිහිටියාම මනෝමය හදවතක් වගේ ක්‍රියාත්මක වෙනවා. ඒ මනෝමය හදවතට තමයි අර රූපය වැටිල මනෝමය හදවතේ තියෙන වස්තු රූපයට ධර්ම වශයෙන් සට්ඨනය වෙන්නෙ. ඉතින් කොච්චරවත් අර පුද්ගලයාව මතක් වෙනවා. දැන් මතකයෙන් අහක් කරන්න බෑ. හිත කොච්චරවත් ඇදෙනවා. හැබැයි **මේ වගේ වශියකින් හෝ ඉනාවකින් ඇති වෙන්නේ ස්වභාවික ලෙන්ගතුකමක් නෙවෙයි.** ධර්ම ස්වභාවයෙන්, කර්මස්වභාවයෙන් ඇතිවන ලෙන්ගතුකමට, ප්‍රියමනාප බවට වඩා **මේකෙන් ඇතිවන අවසන් ප්‍රතිඵලය හරි භයානකයි.**

මෙතනදී අමනුස්ස බන්ධනය සම්බන්ධ කරන්නේ පුද්ගලයාගේ මනස මෙල්ල කරල අවශ්‍ය ගතියට අනුකූල කර ගන්න. (මෙවැනි සත්‍ය සිද්ධියක සම්පූර්ණ විස්තරයක් හෙළ බොදු පියුම දහම් සඟරාවේ 5 වන කලාපයේ අභයරතනාලංකාරය යටතේ පළ කළා.) මේ අවස්ථාවේදී අර දීපු ආහාරය දිරවන්නෙ නැතිව බඩේ තැන්පත් වෙනවා. මෙතනදී එන ගැටළුව තමයි යම්කිසි අජීර්ණයක් එක්ක අමනුස්සයෙක් සම්බන්ධ වෙලා බැඳිලා මේ ඉනාව බඩේ තැන්පත්වීම. මේ වගේ අජීර්ණ වෙලා එයින් යම්කිසි කොටසක් ගර්භාෂය, බඩවැල්, වකුගඩු ආදී ස්ථාන ආශ්‍රිතව තැන්පත් වෙනවා. එහෙම ගිහින් අර විෂ කරපු සෙමයි අමනුස්ස බන්ධනයයි මේ ඔක්කොම එකට බැඳිල හිරවෙනවා. ඊට පස්සෙ **කල් යන කොට ගෙඩියක් හරි තුවාලයක් හරි බවට පත්වෙලා පිළිකාවකට මුල පුරනවා. එහෙම නැත්නම් වකුගඩු වගේ ඉන්ද්‍රියන් නරක් වෙලා ඔඩු දුවනවා.** මෙහෙම ගිහින් පිළිකාවකින් හෝ වෙනත් දරුණු රෝගාබාධයකින් අන්තිමට මැරෙනවා. ඒ වගේම සමහර විට මේ විස කැවුනට පස්සෙ කාලයක් යන කොට පපුවෙ අමාරුව, කැස්ස, ශරීරය කෘෂ වීම වගේ මොනවහරි රෝග ලක්ෂණයක් මතු වුනත්, ඒක අර වගේ බන්ධනයකින් ඇති වෙච්ච දෙයක් කියල දන්නෙ නෑ. මොකද ඒක වෛද්‍ය විද්‍යාවටත් අහුවෙන්නෙ නෑ. **බොහෝ කොට මනස පාලනය කරගන්න බැරි විවිධ විකෘතිතාවයනුත් මේකෙන් ඇති වෙන්න පුළුවන්.**

දැන් මෙතනදී පුද්ගලයා මළොත් සමහර විට ඒ ගන්ධබ්බයටත් මේක සම්බන්ධ වෙලා දිගටම ඒ අමනුස්ස බන්ධනය යන්න පුළුවන්. ඉතින් අන්තිමට මැරිලත් විසුමක් නෑ. ඒ නිසා තමයි මේවා අපි අද කතා කරන අපරාධවලටත් වඩා දරුණු අපරාධ කියල කියන්නෙ. මේ අමනුස්ස බන්ධනයත් හරියට මේ වගේ දෙයක්. උදාහරණ විදියට කෙනෙකුට විවාහයක් කරගන්න ඕන කමක් තියෙනව නම් ඒ පුද්ගලයාගේ යාළුවො කට්ටියක් ඒකට එකතු වෙලා උදව්වට එනවා. උදව්වට ආවට පස්සෙ ඒ අය තමයි වැඩේ මෙහෙය වන්නේ. මොකද යාළුවොත් හරි කැමතියි මේ වගේ වැඩවලට. ඉතින් නොයෙක් ආකාරයෙන් උදව් කරල ☞

තමන්ගෙ යාළුවගෙ පැත්තමයි ගන්න බලන්නෙ. යාළුවට වාසි වෙන විදියටම වැඩ කරනවා මිසක්, විවාහ වෙන අනෙක් පුද්ගලයාට සිද්ධ වෙන පාඩු ගැන හොයන්නෙ නෑ. අද කාලෙ ගත්තත් ගැහැණු ළමයෙකුට පැනල යන්න මග පාදල දෙන්නෙම වටේ ඉන්න යාළුවො තමයි. මේ විදියට ඒ ස්ත්‍රියට හෝ පුරුෂයාට තම තමන්ගෙ යාළුවො උදව් කරනවා. මෙන්න මේ වගේ ක්‍රමයක් ගුප්ත ලෝකයෙත් තියෙනවා. යාළුවො උදව් කරනව වගේ ගති ලක්‍ෂණය තමයි මේ අමනුස්ස බන්ධනයේදීත් ක්‍රියාත්මක වෙන්නේ. මෙතනදී ගන්ධබ්බ ලෝකෙ ඉඳගෙන උදව් දෙන්න ගැලපෙන අමනුස්සයෝ අර මන්ත්‍රවලට ආකර්ශනය වෙනවා. එහෙම ආකර්ෂණය වෙලා ඒ අයට ඒකට උදව් කරනවා. මේකට තමයි අමනුස්සයෝ බඳින්නේ. **මේ අමනුස්සයෝ පැලපදියම්වීම තමයි රෝගයට මුල් වෙන්නේ.** මේක ඉතින් වෛද්‍ය විද්‍යාවට අහුවෙන්නෙ නෑ. ඊට පස්සෙ මේ විසත් එක්ක ඔක්කොම අයින් කරන්න, ගුප්ත ක්‍රමයකින්ම සැහෙන බලවේගයක් දෙන්න වෙනවා. නැත්නම් මැරෙන කල්ම තියෙනවා. පහු වුණාට පස්සෙ හරි අමාරුයි. ඒ වගේ අමනුස්සයො සම්බන්ධ කරන්නෙ නැතිවත් මන්ත්‍රවලින් හෝ විස බෙහෙත්වලින් යම් මට්ටමක ප්‍රමාණයකට විස මරල ඉනාවක් විදියට දෙන අවස්ථා තියෙනවා. එතනදීත් පුද්ගලයාට සිහි කල්පනාවෙන් කටයුතු කරන්න බැරි වෙලා ලෙඩ රෝග ඇති වෙනවා.

**ඊළඟට මේ විදියට දෙන්නෙක් එකතු කරනවා වගේම කඩන්නත් මේ වගේ දේවල් කරනවා.** එතනදී බොහෝ කොට ලුණු තමයි ද්‍රව්‍යයක් විදියට යොදා ගන්නේ. ල+වණ - ලවණ කියන්නේ ලය වණ කරනවා කියන එක. සීනිවලින් එකතු කරන්න පුළුවන් වගේ ලුණුවලින් ලය වණ කරල සම්බන්ධය කඩල දානවා. එතකොටත් අර වගේම ශරීරයේ ලේ වගේ මොනව හරි එක්ක සම්බන්ධ කරල බන්ධනය කරල තමයි දෙන්නේ. ඒකෙන් අති සියුම් කොටසක් ගිහින් අර වගේම හදවත ඇසුරු කර ගෙන තැන්පත් වෙනවා. එතකොට හිත හැඩ ගැසෙන්නේ ද්වේෂ විදිහට. මෙතනදී අර පුද්ගලයා නයාට අඳුකොළ වගේ පේන්න බැරිව යනවා. මේකට සම්බන්ධ කරන්නෙ විරුද්ධ අමනුස්ස කොට්ඨාස. වශී කරන සිද්ධියේ ප්‍රතිවිරුද්ධ පැත්ත තමයි මේ. හරියට අපේ සතුරන්ගෙ සතුරො අල්ලගෙන ඒ අය මගින් සතුරන්ට ගහනව වගේ වැඩක්. මේ වගේ ක්‍රමයක් තමයි මෙතනදී ක්‍රියාත්මක වෙන්නෙ.

ඊළඟට හදි හූනියම් කියල දෙයක් කරනවා. **හදි කරනවා කියන්නෙ කෙනෙක් හද්ද භාවයට පත් කරනවා, විනාශ කරනවා කියන එක. හූනියම් කියන්නෙ හූල්ලන න්‍යාය. යම් කිසි දෙයක් හූල්ලන්න නියම කරනවා. අණ වින කියන්නෙ අණ කරල වින කරනවා කියන එක. ඒ කියන්නේ යමෙකුට විනාශයක් කරන්න අණ කරනවා. කොඩිවින කරනවයි කියන්නෙත් ඒ වගේම කොටල විනාශ කරල දානවයි කියන එක.**

මේ වගේ සිද්ධි අද ඊයෙ විතරක් නෙවෙයි මීට අවුරුදු දහස් ගණනකට



පෙරත් පැවතුණා. බුදුන් වහන්සේ වැඩ ඉන්න කාලයෙත් සිද්ධ වුණා. නමුත් ඒ කාලවල ඒක කපන්න දන්න ගුප්ත, අධ්‍යාත්මික ශක්තිය තිබ්බ්ච නිසා අද වගේ ප්‍රශ්න වුණේ නෑ. මේ වගේ සිද්ධියක් ආනන්ද හිමියන්ටත් සිද්ධ වුණා. ඒක බුදුන් වහන්සේ දිව්‍යසින් දැකල අධිෂ්ඨාන කරල කපල ඉවත් කළයි කියලත් පරම්පරාවෙන් එන කතාවල සඳහන් වෙනවා. ත්‍රිපිටකයේ නැතත් මේක පාරම්පරිකව ආපු කතාවක්. ආනන්ද හිමියන් එක් අවස්ථාවක තමන්ගෙ ගමට යන්න බුදුන් වහන්සේගෙන් අවසර ඉල්ලුවා. මේක බොහෝ දුර ගමනක් බවත්, එහිදී මෙහෙම කරදරයක් ආනන්ද හිමියන්ට වෙන්න ඉඩ තියෙන බවත් බුදුන් වහන්සේ දැක්ක නිසා, ගව්වක් වඩින කොට ගව් 4 ක් පහුවෙන්න අධිෂ්ඨානයක් කළා. මෙහෙම ආනන්ද හිමියන් වඩින කොට අතර මගදී පිපාසයක් දැනුන නිසා, ස්ත්‍රියක් වතුර අදිනව දැකල එතැනට වැඩල පිණ්ඩපාතෙන් වතුර ටිකක් ඉල්ලුවා. තමන් රොඩී කුලයේ අයෙක් නිසා මේ වතුර බොන්න ගන්නෙ නැහැයි කියල ඒ ස්ත්‍රිය පැවසුවාම, තමන්ට කුලයෙන් වැඩක් නෑ පිපාසයට වතුර ටිකක් දෙන්න කියල ආනන්ද හිමියන් පැවසුවා. ආනන්ද හිමියන්ගේ ඒ කතාවට අර ස්ත්‍රියගේ හිත ඇදිල ගියා. මේකෙන් මත් වෙච්ච ඒ රොඩී ස්ත්‍රිය ගෙදර ගිහින් තමන්ගෙ මවට කිව්වා, අහවල් හිමියන් නැත්නම් මට ජීවිතයෙන් වැඩක් නෑ කොහොම හරි ලබා දෙන්න කියල. ඇගේ මවත් ගෙන්නල දෙන්න පොරොන්දු වෙලා, නම් ගම් ආදී විස්තර අහගෙන ඊට අනුව වශී බන්ධනයක් කළා. ඒකෙන් පස්සෙ ආනන්ද හිමියන්ට ඉන්න බැරිව ගිහින් අර ස්ත්‍රිය මතක් වෙලා ආකර්ශනය වෙන්න පටන් ගත්තා.

දැන් මෙතනදී කන බොන ආහාරයක් දීල නෙවෙයි, නම සිහි කරල ගෙන්න ගන්න ක්‍රමයක් තමයි තිබිල තියෙන්නෙ. ඒතරම් ප්‍රභලයි. කොහොම හරි මෙහිදී ආනන්ද හිමියන් සිහිය විකල් වෙලා ගියා වගේ, කියන කරන දෙයක් තේරෙන්නෙ නැතිව ආපසු හැරිල අර ස්ත්‍රිය හොයාගෙන එන්න පටන් ගත්තා. එහෙම ඇවිත් ඒ ගෙදරට පය තියන කොටම බුදුන් වහන්සේ අධිෂ්ඨාන කරල ජල නන්දන පිරිතෙන් 7 වරක් පිරෙන කොටම ඒ රොඩී බන්ධනය සම්පූර්ණයෙන්ම සුනු විසුනු වෙලා ගියා. ඒකෙන් පස්සෙ ආනන්ද හිමියන්ට සිහි කල්පනාව ඇවිත් නැවතත් ඉක්මන් ගමනින් ආපසු වැඩම කළා. එහෙම නැවත වඩින කොටත් අර ස්ත්‍රිය පස්සෙන්ම ආවා. අවසානයේ ජේතවනාරාමයට එනකල්ම මේ විදියට ඇවිත්, බුදුන් වහන්සේගේ දේශනාවක් අහල ඒ ස්ත්‍රියත් මගඵල ලැබුවයි කියල මේ කතාවේ සඳහන් වෙනවා.

දැන් මෙතනදී ආනන්ද හාමුදුරුවො වගේ සෝවාන් වෙච්ච කෙනෙක් සිහිවිකල් තත්වයට පත් කරන්නෙ කොහොමද කියන ප්‍රශ්නය කෙනෙකුට එන්න පුළුවන්. නමුත් උන් වහන්සේ සෝවාන් වුණේ මහණ වෙලා සැහෙන කලක් ගිහින් එක්තරා රහතන් වහන්සේ නමකගෙන් බණ අහලයි. ඒ නිසා මේ සිද්ධිය උන් වහන්සේ සෝවාන් වෙන්න පෙර වෙච්ච සිද්ධියක් වෙන්නත් පුළුවන්. ඉතින් පාරමිතා පුරාගෙන ඇවිත් බුදුන් වහන්සේගේ අග්‍ර උපස්ථායක වෙච්ච ආනන්ද ☞

හිමියන්ටත් එහෙම දෙයක් කළා නම්, අද ඉන්න සාමාන්‍ය ජනතාව මෙහෙම දේවල්වලට අහුවෙන එක අහන්නත් දෙයක්ද?

රොඩී, නීචකුල, මලයාලි, කල්ලු මලයාලම්.... ආදී විවිධ නම්වලින් අදත් ඔය මන්ත්‍ර ගුරුකම් කරන්නේ එදා ඉඳන් පාරම්පරිකව ආපු උදවිය තමයි. **නීචකුල කිව්වෙ නීච වැඩ කරපු නිසා. කෙනෙක්ගෙන් පලිගන්න, නීච දේවල් අසුරු කරගත් අයගේ මන්තර නිසා ඒවට නීච මන්තර කියල කිව්වා.** ඒ අයට තිබ්ච්ච එකම ආයුධය තමයි ඔය මන්තර. වෙන මොකවත් භාවිතා කළේ නෑ. ශුද්ධ පවිත්‍ර දේ අපට ඕන නෑ කියල නීච අමනුස්සයන් සම්බන්ධ කරල මේ වගේ වැඩ කරන්න පටන් ගත්තා.

දැන් ඊළඟට කෙනෙකුට තවත් ප්‍රශ්නයක් මතුවෙන්න පුළුවන්, මේ කියන යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම්වල යහපත් පැත්තක් ඇත්තෙම නැද්ද කියල. මොකද අනියම් සබඳතා නතර කරදීම, සුරා සූදු දුරාචාර නතර කරදීම, හැරගිය අය අය ගෙන්වාදීම වගේ දේවල් කරන නිසා, ඒ වගේ දේවල් කරල දෙන්න පුළුවන් නම් කෙනෙකුට යහපතක් නේද කියල හිතෙන්න පුළුවන්. මුල් කාලයේ එහෙම වැදගත්කමක් තිබුණු බව ඇත්ත. නමුත් ඒකෙ නරක පැත්ත වැඩියි. උදාහරණ විදියට කෙනෙක් තවත් කෙනෙකුට ගහන එක නතර කරල දෙන්න, ඒ පුද්ගලයාගේ අතට යම්කිසි විෂ බේතක් විදිනවා අත පණ නැති වෙන්න. එතකොට ඒ පුද්ගලයා පහර දෙන කරදරයෙන් බේරුණා. හැබැයි ඒ පුද්ගලයාගේ අත පණ නෑ. දැන් ඉතින් අබ්බගාතයෙක් වගේ. මේ වගේ එක පැත්තක් හොඳ කරල දෙන කොට අනෙක් පැත්තෙන් නරකක් වෙනවා. බරපතලකම තමයි අවැඩ වෙන පැත්ත. **අන්තිමට රෝගී වෙලා ජීවිතවලින් වන්දි ගෙවනවා.** මේ නිසා සමහර විට යහපතක් කරන්න කියල දුන්නත් භයානක ප්‍රතිඵලය තමයි අන්තිමට රෝගී වීම.

හැබැයි මේ මන්ත්‍ර ගුරුකම්වල මූලාරම්භය ගත්තොත් යහපත් චේතනාවෙන් කෙනෙකුට යහපතක් සිද්ධ කරල දෙන්න තමයි පටන් ගත්තේ. ඒ කියන්නේ යම් කෙනෙක් යම් දුරාචාර කටයුත්තකින් බේරගන්න අර වගේ යන්ත්‍ර ගුරුකම් කළා. හැබැයි එහෙම කරල නතර වුණේ නෑ. ඒ දුරාචාර කටයුත්ත නැවැත්තුවට පස්සෙ අර බන්ධනය අනිත් පැත්තට කපල ඉවත් කරන්නත් ඒ අය කටයුතු කළා. එතකොට යහපත් පැත්ත විතරක් ක්‍රියාත්මක වෙලා නරක පැත්ත කැපිල යනවා. මොකද ඒ අය දැනගෙන හිටියා ඒවායේ භයානක පැත්තකුත් තියෙන බව. මේ නිසා යම් කිසි වින බන්ධනයකින් අනියම් සම්බන්ධයක් තියෙන දෙන්නෙක් දෙපැත්තට කරන්න ඕනකමක් තිබුණ නම්, ඒක ඒ විදියට වෙන් කරල නැවත එකතු නොවන විදියට වැඩේ සිද්ධ වුනාට පස්සෙ, අර දීපු විස වෙනත් ක්‍රමයකින් වහාම ශරීරයෙන් ඉවත් කළා. මේ නිසා ඒකෙන් කාටවත් හානියක් වුනේ නෑ. නමුත් අද එහෙම නෙවෙයි. වැඩේ කළාට පස්සෙ කරපු කෙනාවත්, කරවන කෙනාවත් දන්නෙ නෑ පුද්ගලයා ලෙඩ වෙලා, විනාශ වෙලා යනවා. මේ නිසා අද බොහෝ කොටම හොඳ පැත්තක් කෙරෙන්නෙ නෑ. කොටින්ම කියනව නම් කරන්න දන්නව මිසක් කපන්න දන්නෙ නෑ. දැන් මේ ලිපිය කියවන පුද්ගලයන් අතර ඉහත කී කටයුතු කරන අය ඉන්නව නම් ඒ අය, අපි ඒවා කපලත් දෙනවයි කියල තවත් ගජබින්නයක් ඇද බාලා තව තවත් හම්බ කරන ක්‍රමයක් හොයාගන්න පුළුවන්. මේ නිසා ඒ ගැනත් සැලකිලිමත් වීම වැදගත්.

අනෙක් කාරණය තමයි **ඉස්සර මේ වගේ ක්‍රම තිබුණේ සමහර වෙලාවට ගමට රටට පිළිලයක් වෙච්ච පුද්ගලයින් මෙල්ල කරන්න මිසක් අද වගේ පලිගන්න, වනසන්න, බලහත්කාරයෙන් එකතු කරන්න නෙවෙයි.** උදාහරණයක් විදියට එදා ගම රට විනාශ කරන අසත් පුරුෂයෙක් හිටිය නම්, ඒ පුද්ගලයාගෙන් සමාජය බේරගන්න ඔහුව මෙල්ල කරල ගමෙන් පන්නන්න මේ වගේ වැඩ කළා. ඒකට සමහර විට රාජ අනුග්‍රහයත් ලැබුණා. නමුත් අන්තිමට මිනිස්සු තමන්ගේ පෞද්ගලික අවශ්‍යතා උඩ යහපත් පුද්ගලයින්ටත් ඒක කරන්න ගියා, අයහපත් දේවල්වලටම යොදාගත්තා. අද වෙලා තියෙන්නෙ ඒක තමයි.

ඊළඟට මේ වගේම තවත් එකක් තමයි වස් කවි කියන එක. මේකත් යම්කිසි බලවත් අමනුස්ස කොට්ඨාශවලට දානුම් දීල ඒ අය පිට ඉඳන් කරන වැඩක්. උදාහරණයක් ගත්තොත් යම් කිසි නායකයෙක්ගෙන් හෝ බලවත් කෙනෙක්ගෙන් අණක් ලැබුණොත් ඔහු යටතේ ඉන්න අය බයවෙලා වෙව්ලල ඒ අණ ක්‍රියාත්මක කරනවා. ඒ වගේ කෙනෙකු ලවා යමෙක් යම් දෙයක් කියල, ඒ පුද්ගලයාගේ මාධ්‍යය තුළින් තමන්ගේ කටයුත්ත ඉෂ්ට කරගන්නවා. මේක අදත් රටේ ලෝකෙ ඕන තරම් සිද්ධ වෙනවා. වස් කව්වලින් කරන්නෙත් මේ වගේ දෙයක්. දැඩිමුණ්ඩ, වීරමුණ්ඩ, කඩවර, කාලි වගේ බලවත් දේව කොට්ඨාශ හා යක්ෂ කොට්ඨාශ ලවා ඒ වගේ වැඩ සිද්ධ කරගන්නවා. ඒ වගේම වස්කව්වල අක්ෂර, ගණ, මාත්‍රා ගැලපීම නිසා සමහර දේව, අමනුස්ස කොට්ඨාශ ආකර්ශනය වෙනවා.

මේ වගේ බලවත් දේවතාවන් වගේම යක්ෂයන් සම්බන්ධ කර ගෙන ඒ ඉන්න අමනුස්ස පිරිස්වලට අණ කරනවා ගිහින් මෙහෙම කරපන් කියල. අණවින කිව්වෙත් ඒකයි. එතකොට ඒ අමනුස්ස පිරිස් ගිහින් ඒ වැඩේ කරනවා. වස් කවියෙන් කරන්නෙ ඒ අයට ආරාධනා කරල, මේක කරල දෙන්න කියල ඉල්ලා සිටින එක. එහෙම කියල සමහර වෙලාවට ඒ මහ බලවත් උදවියට දොල පිදේනි දෙනවා, පූජා තියනවා. ඒ පිදේනි, පූජා ලබාගන්න ඒ බලවත් පිරිස්, තමන් යටතේ ඉන්න අත් උදව් කරන අමනුස්සයන්ටත් ඒවායින් කොටස් දෙනවා. දීල අණ කරනවා අහවලාට, අහවල් දේට මෙහෙම කරපන් කියල. හරියට මනුස්ස ලෝකයේ වගේම තමයි. මේකත් එදා යහපතට පාවිච්චි කළත් අද මිනිස්සුන්ට වින කරන්න තමයි පාවිච්චි කරන්නේ.

''රන්සිරි විමන බෝ අත්තෙන් වැසී ගියා - සුන් කර හරින් තෙද බල වීර මුණ්ඩයා'' එක්තරා විහාරස්ථානයක විහාරයට බෝ ශාකාවක් නැමිල තිබුණා. ඒක විහාරයට කඩා වැටුණොත් විහාරය විනාශ වෙන නිසා එතැන වැඩ හිටපු හිමි නමක් ඒ බෝ ශාකාව කපන්නෙ නැතිව ගැලවිලා යන්න මේ විදියට වස් කවියක් කිව්වා. ඒකෙන් පස්සෙ මහ සුළඟක් ඇවිත් බෝ අත්ත කැඩිල පන්සල් වත්තෙන් එපිට සීමාවට වැටුණා. බුදුන් වහන්සේ වැඩ ඉන්න කාලයේ කරපු දේශනාවන්ට අනුව අටුවාවල විග්‍රහ කරල තියෙනවා, බෝ අත්තක් විහාරයට නැමී තියේ නම් ඒක ඉවත් කළාට කමක් නෑ කියල. මේ වගේ යම්කිසි කරදරයකින් බේරෙන්න තමයි එදා වස් කවියක් වුණත් කිව්වෙ. නමුත් දැන් වෙලා තියෙන්නෙ ඒවා අයහපතටම යොදා ගන්න එකයි. මේ වගේ ඕනෑම දෙයක් හදන්න මුල් වෙච්ච කාරණය බොහෝ විට යහපත්. නමුත් පස්සෙ කපටිකමට ඒක කන්න සූත්තරයක් ලෙස හදාගන්නවා, ඒකෙන් අයුතු ප්‍රයෝජන ගන්නවා. උදාහරණයක් විදියට එදා හිටපු සෘෂිවරයෙක් හෝ වෛද්‍යවරයෙක් යම් කිසි බේතක් පෙන්වල, මෙන්න මේ බේත බඩදරු අම්මලාට දෙන්න එපා, දුන්නොත් ගබ්සා වෙනව කියල කියනවා. නමුත් එදා යහපතින් පෙන්වා දුන් ඒ කාරණය වැරදියට පාවිච්චි කරල දරුවො මරන්න ඕන නිසා ඒ බේත දෙනවා. නමුත් එදා පෙන්වා දුන්නෙ බඩදරු අම්මලාට මේකෙන් ප්‍රවේශම් වෙන්න ඕන නිසා ඒක ගන්න එපා කියල. පස්සෙ කාලයක අසත් පුරුෂයො ඒකම ප්‍රයෝජනයට අරගෙන අසත්පුරුෂ වැඩ කරන්න පටන් ☞

ගන්නවා.

ඉතින් මේ විස්තර කරපු ඉනා, වශී.... ආදී ගුරුකම්වලින් වෙච්ච විනාශය කොච්චරද කියනව නම් අපේ රටේ 50% කටත් වැඩිය ඒකෙන්ම ලෙඩ වෙච්ච අය ඉන්නවා. ඒකෙන් පිළිකා, වකුගඩු රෝග, දියවැඩියාව.... ආදී නොයෙක් රෝග හැදිල මුළු ජීවිත කාලයම විඳවල අන්තිමට මැරිල යනවා. ඊට පස්සෙ ලේ උරුමය අනුව ඒක පවුලෙ අයටත් බලපාන්න පුළුවන්. මේකට බටහිර විද්‍යාවේ ෆැමිලියල් කියලත් කියනවා. පරම්පරා ගණනාවකටත් බලපාන්න පුළුවන්. මොකද මේක අද ඊයෙ පටන් ගත්ත දෙයක් නෙවෙයි. සෑහෙන කාලයක පටන් කරගෙන යනවා. දූන් ඔය පත්තරවල දාල තියෙන දූන්වීම් අනුව දවසකට කී දෙනෙක් නම් ගිහින් ඔය වැඩේ කරනවද? ඒ විදියට අවුරුදු ගණනක් තිස්සේ කරපුව මේ වෙනකොට කොච්චර නම් ඇත්ද? නමුත් ඒව කරල දෙනව මිසක් එකක්වත් ගොඩ දාන්නෙ නෑ. ඉතින් මේ වගේ වැඩ කරන උදවියට තැනක් දෙන එක නෙවෙයි කරන්න ඕන, වගකිව යුතු අය මැදිහත් වෙලා මේ වගේ නීච වැඩ කරන අසත්පුරුෂයො අල්ලලා ඒවා තහනම් කරන එකයි කරන්න ඕන.

බොහෝ උදවිය පොඩි දේකටත්, කවුරු හරි වචනයක් කතා කළත් දේවාල වගේ තියෙන කොහේ හරි ගුබ්බෑයමකට ගිහින්, මේ වගේ අසත්පුරුෂ වැඩ කරල තමන්ගෙ අවශ්‍යතාවය පිරිමහගන්න බලනවා. විශේෂයෙන් කාන්තා පක්ෂය මේ වගේ දේවල්වලට පෙළඹෙනව වැඩියි. මේවායේ තියෙන බරපතලකම හිතන්නෙ නැතිව, මේ වගේ අසත්පුරුෂ වැඩ කරන උදවිය ලවා දහ ජරාව ඔක්කොම කවලම් කරල ජීවම් කරල වින කරල දෙනවා. එහෙම නැත්නම් සාප කරනවා. කාගෙ හරි අණ්ඩක් කැඩෙන්න, හැඳි ගෑවිලා යන්න කියල මේ වගේ සාප කරනවා, පලිගහනවා මිසක්, අනේ හැමෝටම යහපතක් වෙන්න කියල කරන තැන් කොහෙද තියෙන්නෙ? ඉතින් මේ වගේ කරන හැම එකක් ගානෙම සාපයක්මයි වදින්නෙ. නිකන් නෙවෙයි දස දහසක් සක්වලටත් ඔය සාප කරන ඒවා පැතිරෙනවා. ඒවායින් පිටවෙන කළු විස කිරණ දූවිල පිච්චිල යන ඒවා. භූමිපාළු කියල දාන්නෙත් ඔය වගේ ඒවම තමයි. මොනම දෙයක්වත් හදාගන්න බෑ. මේ වගේ විවිධ වැඩවලට විවිධ ජීවම් ක්‍රම තියෙනවා. මේවා කරන උදවියත්, මෙන්න මේක දීපං බල්ල වගේ හදාගන්න පුළුවන් කියල සල්ලිත් කඩාගෙන ඔය වස විස කරල දෙනවා. සමහරු පිනට වශී කිය කියා සිවුරුත් පොරවගෙන ඉන්නවා.

මේ විදියට කොච්චර කළත් මේ අය මේවායේ තියෙන බරපතලකම ගණන් ගන්නෙ නෑ. නමුත් මහ අපරාධ වැඩ. මේ වගේ දේවල් කරන්න එපා කියල පත්තරවල දාන්නෙ නැතිව ඒවාට තවත් උදව් දෙනවා. මේවායින් අභ්‍යන්තරයේ සිද්ධවෙන විනාශය, කරන අයවත් කරවන අයවත් දකින්නෙ නෑ. මේවා මහා අපාගත වෙන පාප කර්ම. මේවා කරන හා කරවන උදවියට දහදුක් විඳල තමයි අවසානයේ මැරෙන්න වෙන්නෙ. සමහරු කුණුවෙලා පණුවොත් දාල මැරෙනවා. උපනුපන් තැන දුක් විඳිනවා. මනුස්සයෙක් වෙලා ඉපදිලා මේ ජීවත් වෙන අවුරුදු 60 - 70 කට පිනක් දහමක් කරල යහපතක් කරල මැරෙන්නෙ නැතිව, මේ කෙටි කාලයකට තණ්හාවෙන්, වෛරයෙන්, ක්‍රෝධයෙන් ආස්වාදයන්ට ගිජු වෙලා මහා අපා ගතවෙන පාපකර්ම රැස් කරනවා. සමහර පළාත්වල මේ වගේ දේවල්වලට රොඩී ගම්මාන පිටින් තියෙනවා. මේවාට උදව් දෙන අයටත් විපාක උපනුපන් තැන එනවා.

මේ වගේ කාරණා ගැන අද කවුරුවත් කතා කරන්නෙ නෑ. මේ තමයි සැඟවිලා මනුස්සයො විනාශ කරන පැති. ඒ නිසා මේවායේ තියෙන බරපතලකම ධර්මානුකූලව වටහා ගෙන, තමන්ට එන ගැටළුවලට විසඳුම් සොයන්න අසත්පුරුෂයන් පස්සෙ දුවන්නෙ නැතිව, යහපත් ක්‍රම මගින් ඒවාට විසඳුම් සොයා ගන්න ඕන. මේ බුදු දහමේ කාටවත් කරදරයක් නොකර මෙලොව පරලොව අභිවෘද්ධියත් සලසගෙන නිවී සැනසෙන වටිනා මංපෙත් පෙන්වා දීල තියෙද්දිත්, ඒවා පැත්තකට දාල අසත්පුරුෂ වැඩවලින් විසඳුම් සොයන්න ගියාම අන්තිමට තමන්ට තිබ්බච දෙයත් නැතිවෙලා යන්න තියෙන තැනත් නැතිවෙනවා.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# නිවනින් සැනසෙන්න පුළුවනි හැමදාම...

**මනසේ ඇඳුන රුව දිනකදී බොඳව ඇසින්**
**රිසි සේ ඇසුව හඬ හෙමිහිට ගොළුව ගොසින්**
**පණ සේ රැකුණ දෙය අහිමිව දුකක වෙසින්**
**සිතු සේ කිමද නොමැතිය අප කැමති ලෙසින්**

**පෙනෙනා මානයෙන් සැප ලෙස වසා ගෙන**
**දුක දුක ලෙසම වී සරු වෙස් වලා ගෙන**
**නවතින තැනක් නැත දාහය දරා ගෙන**
**බියකරු දාමයකි සසරෙහි බැඳී ගෙන**

**පිනවා පසිඳුරන් ලැබ සිත් මනාපයා**
**ලුහු බැඳ පසුව විය හැකි දුක් අනේකයා**
**පුහුදුන් කමට නොම දැන වන විනාසයා**
**නිසි මග නොම ගියොත් සසරෙහි අනාතයා**

**කරදර කටොලු බාධක දුක වැඩි හින්දා**
**සසරෙහි අවිදු අඳුරෙහි කෙලෙසුන් බැන්දා**
**ඉපදී මැරී යළි වෙන බවයක රන්දා**
**තිලකුණු නුදුටු දිවියක් කුමටද මන්දා**

**දැනුනත් විඩා බව සිටියත් සිනහ පපා**
**තිරිසන් මිනිස් නොමිනිස් දෙවි සතර අපා**
**සැප යැයි දුකම දෙන වෙන බවයකුත් එපා**
**සදහම් මගෙහි ඇත නිසැකව මිදෙන උපා**

**රාගය දෝස මෝහය මුසු ගිනි කන්ද**
**තනිවම පසක් කොට විදු නැණසින් බින්ද**
**තිලොවග පියා දෙසු දම් රස මකරන්ද**
**සිසිලයි සැබෑමයි කොතරම් මනරම්ද**

**ලොව තතු එලෙසමයි අතිරයි නිසරු නියා**
**බව දුක නිම කරමු සසරේ දුරක නොයා**
**සුවහස් කල් නොඉඳ මතු බුදු කෙනෙකු සොයා**
**නිවනෙහි මගම යමු වෙන බැඳි වළක නොයා**

**අරි මග සොයා යා යුතු ලහි ලහියේම**
**දැන අරි අටඟි මග සිවුසස් නිසි සේම**
**සම්බුදු පසේ බුදු මහ රහතුන් සේම**
**නිවනින් සැනසෙන්න පුළුවනි හැම දාම**

**ස්වර්ණා සමරසිංහ - නැදිමාල, දෙහිවල**

**අභයරතනාලංකාරය - 18**

# ගුප්ත ලෝකයේ සිට ලෙඩ රෝග හදන අමනුස්සයින් සම්බන්ධ අත්දැකීම් කිහිපයක්...

*(පසුගිය කලාපයෙන් - රක්තවාතය නිට්ටාවට සුව කරන තෙල හිඳ ගන්නා හැටි....)*



**- වහරක අභයරතනාලංකාර හිමි**

අපේ ගම් පළාතේ එක්තරා ප්‍රදේශයක 1980 ගණන්වල පමණ සිද්ධ වූ සිද්ධියක් තමයි මේ විස්තර කරන්නේ. මේ ප්‍රදේශයේ ගම් මඩුවක් කියල දෙයක් තිබුනා. ඒක එක්තරා දේවාල කටයුත්තක්. ඒකට ගම් මඩු නටනවයි කියලත් කියනවා. ඒක සාම්ප්‍රදායිකව කරගෙන එන, වස් දොස් අරින්න කරන හොඳ දෙයක්. මේ සඳහා කපු මහත්තුරු කට්ටියක් විශේෂයෙන් එනවා. ඒ අය ඇවිත් ස්තෝත්‍ර වගයක් ගායනා කරනවා. සාමාන්‍ය දේවාලයක වගේ වතුර ගෙනල්ල දිය කපනවයි කියල එකකුත් කරනවා. එතනදී පළමුවෙන්ම තියන වතුර ටික හිඳිලද කියල බලනවා. වතුර අඩුනම් මොනව හරි දෝසයක් තියෙනවයි කියනවා. හිඳෙන්නෙ නැතිව ඒ ප්‍රමාණයටම තිබුනොත් දෝසයක් නෑ කියනවා. මෙහෙම මනින ක්‍රමයක් තියෙනවා. ඉතින් මේ විදියට වතුර අරගෙන දිය කපන්න පෙර ගමේ හැම තැනම අහල පහල ගෙවල්වලට ගිහින්, ඒ ගෙවල්වල ඉන්න අය කැමති නම්, ඒ අයගේ ගෙවල්වල ඉන්න අමනුස්සයෝ අර මඩුවට කැන්දගෙන එනවා. අමනුස්සයෝ ඉන්න එක කරදරයක් නිසා කවුරුවත් අකමැති වෙන්නෙ නෑ. මේ නිසා මේ වගේ දේවාල ඇදහිලි ආදිය විශ්වාස කරන පිරිස් ඉන්නවනම් ඒ අය මේකට බොහොම කැමතියි.

දැන් මේ කපු මහත්තුරු එකතුවෙලා අමනුස්සයින්ට කදක් හදනවා. කද මල්ලක් බඳිනවා වගේ තමයි ඒක කරන්නේ. කෙහෙල් කැන් කෑලි, කෙහෙල් ලෙලි, කැවුම් කාලා ඉතුරු වෙච්ච කෑලි, ඉඳුල් බත් වගේ දේවල් තමයි මේකට දාන්නේ. ඒවා අර ගෙවල්වලින්ම එකතු කර ගන්නවා. එතකොට මේ කදේ එක පැත්තක කෙහෙල් කැන්වල මල් ඇවරි වගේ ඒවා දානවා. අනෙක් පැත්තෙ කැවුම් කද කියල මොනව හරි කාල දාපු, පොඩි කරල දාපු කෑම ජාතිත් දානවා. මේ විදියට මොනවහරි රොඩුවලින් තමයි පෙරේතයන්ට දෙන කද හදන්නේ. දැන් මේක එක්කෙනෙක් කරේ තියාගෙන කද ගහගෙන තමයි ගම වටේට යන්නේ. එතකොට ප්‍රධාන කපු මහත්තයා දුම්මල ගහගෙන කෙලින්ම ගෙවල්වලට ගිහින් ඒවා ආරක්ෂා කරන්න මොනවද යාතිකා වගයක් කියනවා. "ආ... වරෙල්ලා යන්න ... මේක කරන්නේ උඹලට කන්න දෙන්න ... උඹලා පෝෂනය කරන්න ... උඹලා ඔක්කෝටම උත්සවයක් තියෙනවා ... ඔක්කොම වරෙල්ලා ..." මේ ආදී වශයෙන් මන්ත්‍ර කවිවලින් කියල අඬ ගහනවා. ඉතින් ගමේ ඉන්න අමනුස්සයෝ ඔක්කොම, උන්ට කන්න බොන්න දෙන නිසා බොහොම ප්‍රියමනාපෙන් මේක පස්සෙන් යනවා.

දැන් මේ සිද්ධිය ගමේ හැමෝටම කියන්න කියල පෙර දැනුම් දීමක් කරනවා. අපේ ගෙදරටත් දැනුම් දීපු නිසා මමත් ඒක බලන්න ගියා. කද මල්ල අරගෙන කඩපොල (නගරය) දිහාවෙන් හවස 4 - 5 ට විතර තමයි මේක පටන් ගන්නේ. මේක රවුමට ගම වටේ යනකොට සෙනගත් ඒ පස්සෙන් යනවා. මමත් සෙනගට යන්න ඇරලා, මොකක්ද මෙතන සිද්ධ වෙන්නෙ කියල බලන්න ඒ අයගෙ පිටි පස්සෙන්ම ගියා. එතකොට මට පේනවා මේ ගමේ මිනිස්සුන්ට අමතරව තවත් පිරිසක් මේකෙ යනවා. බලන කොට උන්ගෙ මට්ටමේ හැටියට හොඳට ඇඳල ඉන්න මේ මනුස්ස ලෝකයේ හිටපු ගන්ධබ්බයෝ පිරිසක්. මැරෙන්න පෙර හිටපු ස්වභාවයෙන් තමයි ඒ අය ඉන්නේ. හැබැයි එදාට වඩා අද පොඩි වෙනසකුත් තියෙනවා. එදා මහලු වෙලා (වයසට ගිහින්) හිටියනම්, දැන් එදා අතපය වාරු නැතිව වැටෙනවා වගේ මහලුකමක් නෑ. ඒ මහලුකම දැන් ටිකක් හොඳට නිරෝගි වෙලා. ඒ වගේම එදා අංශභාගෙ හැදිල ඔත්පල වෙලා හිටිය නම්, දැන් ගන්ධබ්බයා අංශ භාගෙ හොඳ වෙච්ච කෙනෙක් වගෙයි. හැබැයි පෙර ගති ලක්ෂණ තියෙනවා. මහලු නම් මහලුයි. ඇඳුම් එහෙමත් එදා වගේම තියෙනවා. මේ වගේ ඔළුවේ ලේන්සු බැඳගෙන, කරේ ලේන්සු දාගෙන එහෙම නැත්නම් සාටක පටලවාගෙන මොකක් හරි බැනියම්, සරොම් වගේ ඒවා ඇඳගෙන අරක පස්සෙන් යනවා. මම බැලුවා කවුද මේ මෙච්චර මැරිච්ච කට්ටියක් යන්නෙ කියල. නම් ගම් කියන්න හොඳ නෑ, නමුත් මම දන්න මැරිච්ච අයත් මෙතන හිටියා. මම හොඳට බැලුවා. එතකොට මේ අය මනුස්සයෝ නෙවෙයිනෙ කියල තේරුණා. හැබැයි මස් ලේ ඇහැට හොඳට පේනවා. හරි පුදුම සිද්ධියක්. ඈත ඉඳල මම බලාගෙන යනකොට මගේ ඇස් දෙකටම මේ පිරිස පේනවා. දැන් මේ පිරිසත් පස්සෙන් වෙනම යනවා. ඉස්සරහින් යන පිරිස වෙනම පේනවා.

මෙහෙම යන ගමන් දේවාලෙ තියෙන භූමියට යන්න සාමාන්‍යයෙන් යාර 25 ක් 30 ක් දුර තියා, මේ පිටිපස්සෙන් ගියපු පිරිසෙන් හත් අට දෙනෙක්ගෙ පමණ රංචුවක් එක පාරටම කැලේට පැන්නා. එතන තිබ්බිච්ච කම්බි වැටකින් පැනල තමයි කැලේට ගියේ. මම බැලුව මොකද මේ එකපාරටම පැන්නෙ කියල. බලනකොට ටික වෙලාවකින් මේ අය තොලකට ලෙව කකා බොහොම සන්තෝසෙන් ඉක්මනට ආපහු එනවා. මම දන්නෙ නෑ මෙතන පාරක් තියෙනවද කියලවත්. කම්බි වැටක් නම් තිබුනා. පස්සෙ මම විපරම් කරල බැලුවා, මොකටද මේ අය ගියේ, මොනවද ගිහිල්ල කළේ කියල. මම ඒ අයට යන්න ඉඩ හැරල ටිකක් පහුවුනාට පස්සෙ ඒ අය හැරිච්ච තැනට බලන්න ගියා. බලනකොට එතැන අඩි පාරකුත් ☞

තියෙනවා. එතැනින් කම්බිවැට කැඩිච්ච තැනකුත් තිබුනා. මේ අය කොහාටද ගියේ කියල බලන්න මමත් අඩි පාර දිගේ ටික දුරක් ගියා. බලන කොට මහා අසූචි ගොඩක්. එතැන ගලක් තියෙනවා. මිනිස්සු මෙතැනින් යනකොට රැට හදිස්සියේ වැසිකිලියට යන්න ඕන වුනාම මේ වැටෙන් පැනල ඒ වැඩේ කරන තැනක්. ඒ ගලට තමයි මිනිස්සු අසූචි පහරන්නේ. මෙතැනින් යන කොට මේ ගඳ එද්දී මේ අයට ඉන්න බෑ. මේක කන්න තමයි අර ගියේ. දැන් මේ අය මේකත් කාලා දඩිබිඩි ගාල පැනල නැවතත් අර කද පස්සෙන් යන්න පටන් ගත්තා.

දැන් මෙතනදී තවත් වැදගත් කාරණයක් මතුවෙනවා. මේ වගේ අසූචි කාපු අමනුස්සයෙක් මනුස්සයෙක්ගෙ ඇඟට ඇතුල් වුනොත්, ඒ අසූචි අංශු මනුස්සයගෙ බඩට යනවා. ඊට පස්සෙ ඒකෙන් ලෙඩ හැදෙනවා. මේ කාරණය වෛද්‍ය විද්‍යාවට අසු නොවුනත් විෂබීජ ගමන් කරන එක ක්‍රමයක් තමයි මේ. (වැඩි විස්තර සඳහා 16 වෙනි කලාපයේ පලවූ ''වෛද්‍ය විද්‍යාවට හසුනොවූ අමනුස්ස හා කර්මජ රෝග'' යන ලිපිය බලන්න.)

මේ තවත් ඒ වගේ අමනුස්සයෝ සම්බන්ධ පුදුම සිද්ධියක්. අමනු-ස්සයෙක් ආවේස වෙච්ච තරුණ කාන්තාවක් තමයි මේකට මුල් වුනේ. මේ ආවේසය නිසා ඒ කාන්තාවට මොකක්වත් කරගන්න බැරිවයි හිටියේ. ඒක අයින් කරන්න කට්ටඩියෙක් මුල් කරගෙන එක්තරා තොවිල් කටයුත්තක් කළා. මේකට ගොඩදිය කියන මස් ඕන වුනා. ඒක පෙරේත තටුවට දාන්නයි ගන්නේ. සාමාන්‍යයෙන් ඒ වැඩේට ගන්නෙ හරක් හංකඩයක්, කුම්බලා ඔළුවක් වගේ දෙයක් තමයි. ඒ සාමාන්‍ය තොවිල්වලට. නමුත් මේකට එහෙම හරියන්නෙ නෑ, මේක පෙරේතයට කෙලින්ම කැප කරන එකක් කියල, මේ කට්ටඩි මහත්තය ගොඩමස් වෙනුවට හරියන්න එළු මස් ඕන කියල තිබුනා. ඒ අවස්ථාවේ එළු මස් ගන්න තැනක් කොහෙවත් තිබිල නෑ. මොකද කලින් දවස පෝය දවසක්. හැම තැනම හොයා ගෙන යනකොට එක කඩේකින් කිව්වා, කලින් පෝය දවස නිසා එළු මස් නෑ, එක කෑල්ලක් තිබිල ඒකත් නරක් වෙලා කුණු කුඩෙට විසි කළා කියල. හැබැයි ඒක ගෙනිහින් නෑ, ඒ වෙලාවෙත් කුනු කුඩෙ තිබුනා. පස්සෙ, අනේ කොහොම හරි ඒ කෑල්ල වුනත් කමක් නෑ අමතර ගාණක් අරගෙන ඔතල දෙන්න කිව්වා. මේ මස් කෑල්ලට, ඒ ටිකට මැස්සොත් ගහල කුනුවෙලා පනුවොත් දාලයි තිබුනේ. මුදලාලිට වැඩිපුර ගාණක් දීල, ගඳ ගහන නිසා පොලිතින් කවර දෙක තුනක දාල ඔතල දීල තිබුනා. ඒ තරම්ම ගඳ ගහන නිසා පොලිතින් කවරෙ ලිහන්නෙත් නැතිවම පෙරේත තටුවට දැම්මා.

මේ අමනුස්සය ආවේශ වෙච්ච කාන්තාව සාමාන්‍ය දවස්වලට පියවි තත්වයෙන් ඉන්න කොට මස් මාළුවත් කන කෙනෙක් නෙවෙයි. ඒවා බොහොම අප්‍රිය කරනවා. හැබැයි අමනුස්සයා ආවේශ වුනාට පස්සෙ ඕන ජරා ගොඩක් කිසි ගාණක් නැතිව කනවා. අන්තිමට මේ කාන්තාව අර කට්ටඩියට මල්ලි කියල කතා කරන්නත් පටන් ගත්තා. අර පෙරේත තටුව දිහා බලලා "මල්ලි හොඳ කෑමක් තියෙනවා බං, මං කන්නද'' කියල මෙහෙම අහනවා. ඉතිං කාපන්කො බං උඹට තමයි ගෙනත් තියෙන්නෙ කියල කට්ටඩිය කියනවා. මේ කාන්තාව මේකට තලු ගගහා යන කොට, ඔය ඇඟ මෙහෙ දමල උඹ ගිහින් කාපන් කියල කට්ටඩියා කිව්වා. දැන් මේ කාන්තාව මළ පෙරේති වගේ තමයි ක්‍රියාත්මක වෙන්නේ. මල්ලි කියල අර කට්ටඩියට කතා කරන්නෙත් මේ කාන්තාවගේ ශරීරයට ආවේශ වෙච්ච මළ පෙරේතිම තමයි. දැන් දෙන්නම යාළුවො වගේ කථා කරන්නේ. ආවේශ වෙලා ඉන්න තරුණ කාන්තාව නමුත් දැන් කථා කරන්නේ වයසක අම්මන්ඩි කෙනෙක් වගේ. ඒ තමයි මළ පෙරේත ගන්ධබ්බයා. නැවතත් අර කට්ටඩිය කාන්තාවට කියනවා, ඔය ඇඟ දාල උඹ ගිහින් කාපං කියල. මේ කාන්තාවගේ ශරීරය අත හැරල ගිහින් කාපං කියල කිව්වෙ අර ඇඟේ ඉන්න අමනුස්සයට. "එහෙම නම් කාල වැඩක් නෑ, අනේ මල්ලි ඇඟෙන්ම ගිහින් කන්නම්, මේකිත් එක්කම ගිහින් කන්නම්." දැන් අර පෙරේතිය මෙහෙම උත්තර දෙනවා. කට්ටඩියත් කරන්න දෙයක් නැති නිසා ඕන එකක් කර ගනින් කිව්වා. පුදුමෙ කියන්නේ අර කාන්තාව ගිහින්, මෙච්චර මේ පැත්ත පලාතෙවත් ඉන්න බැරිව ගඳ ගහන අර කුණු මස් කෑල්ල ඔක්කොම කෑවා. දැන් මේක හිතාගන්නවත් බැරිව බලන් හිටපු සමහර අයගෙ කම්මුලට අත යනවා. සමහරු ඔළුවෙ අත තියාගන්නවා. මේ කාන්තාවට සිහි බුද්ධියක් තිබුන නම් මේ කුණු වෙච්ච අමු මස් කෑල්ල කනව තියා හීනෙකින්වත් හිතන්නෙ නෑ. දැක්කොත් වමනෙ යනවා. නමුත් තලු ගගහා හොඳට කෑවා.




දැන් මෙහෙම තොවිලෙත් කරල ඔක්කොම කරනකල් කිසිම බඩේ අමාරුවක්වත් හොයා ගන්න නෑ. මේ විදියට යන්ත්‍ර මන්ත්‍රත් කරල නූල් ගැට ගහල, දෙහි පුහුල් කපන්නත් සූදානම් කරල, මෙච්චර කරල තියෙද්දිත් තවම අවේශ-යෙන් "මොනව කිව්වත් යන්නෙ නම් නෑ මල්ලි" කියල උත්තර දෙනවා. "ආ උඹ ඕන එකක් කර ගනින්. අපේ වැඩේ අපි කරනවා. උඹේ වැඩේ උඹ කරපන්." කට්ටඩියා මෙහෙම කියල වින රාජ කසායක් ඒ කාන්තාවට දුන්නා. සැරයක් බඩ යනකොට දැන් අර මල්ලි කියල කියන කතා මොකුත් නෑ. මේ විදියට දෙතුන් පාරක් බඩ යන-කොට මේ කාන්තාවට සිහිය ආවා. තවත් හත් අට වතාවක් බඩ ගියාට පස්සෙ ගෙනිහින් නාවල අරගෙන ආවා. දැන් හොඳට සිහිය තියෙනවා. මේ විදිහට සිහිය ආවට පස්සෙ දැන් මේ කාන්තාව "මගේ අත ගඳයිනේ මේ මොකද" කියල අහනවා. "ඊයෙ අර පෙරේත ආවේසෙන් තටුව එහෙම අත ගෑවනෙ, ඒකෙ තිබ්බ්ච පුලුටු නිසා වෙන්න ඇති." ගෙදර උදවිය ඇයට මෙහෙම කිව්ව මිසක් කුණු මස් කෑල්ල කාපු කතාව කිව්වෙ නෑ. මේක කියපු ගමන් අර කාන්තාව බොහොම පිලිකුලෙන් ඊයිය කියල කිව්වා. දැන් මේ අතේ ගෑවුනයි කියල ඊයිය කිව්වේ. බැරි වෙලාවත් කෑව කියල කිව්වනම් මොනව වෙයිද? ඉතින් මෙච්චර ජරාවක් කාලත් මේ කාන්තාවට කිසිම බඩේ අමාරුවක් වත් නෑ. කලින් මස් මාංශ කටේවත් තියන්නෙ නැතිව මෙච්චර පිරිසිදුවට හිටියට, අර ආවේසෙන් කරපු වැඩේ හැටි! දැන් ඉතින් මේ කාපු එක බඩේ තියෙද්දී අජීර්ණ වෙන්න එපැයි ! මොකද විෂ බීජ ගොඩක්. නමුත් එහෙම මොකවත් නෑ. අර වගේ ජරාවක් මනුස්සයෙක්

දැනුවත්ව කනවද කියල හිතා ගන්න බැරුව මිනිස්සු ඔළුවෙ අත තියා ගත්තා. මේ වගේ සමහර අවස්ථාවලදී පෙලක් අය කොච්චර ජරාව කැවත් දිරවනවා.

දැන් මේ විස්තර කරන්නේ මම පොල්ගහවෙල වැඩ ඉන්න කාලෙදි වෙච්ච තවත් අමනුස්ස සිද්ධියක්. එක්තරා දෙමාපිය යුවලකගේ ළමා වයසෙ ඉන්න පුතෙක් ඌරු මස් කෑල්ලක් කටේ දාගත්තු ගමන් වතුරට පිහිනන්න පැනල මළා. හැබැයි මේක සිද්ධ වුනේ විදෙස් රටකදී. ඒ ළමයා වතුරට පනිනකොට අම්මත් ළඟ ඉඳල තිබුණා. මස් කෑල්ල හිරවෙලා තමයි ළමය මළේ. මැරිච්ච ගන්ධබ්බයාගෙත් කටේ මස් කෑල්ලක් ඒ විදියටම තියෙනවා. කථා කරන්නෙත් ඒක කටේ තියාගෙන. දැන ගන්නත් බෑ. නමුත් අම්මත් එක්ක නාන්න ගියාම ළමා වයසෙ නිසා, බයක් තැති ගැන්මක් ආවොත් අම්මෙ කියල තමයි ළඟට දුවල යන්නෙ. නමුත් දැන් ඒ ළමය තමන් මැරිල කියලවත් දන්නෙ නෑ. මැරිල ගියපු හැටියෙම මේ ළමා ගන්ධබ්බයා පැනල ගිහින් අම්මේ කියාගෙන අම්මගෙ බඩේ එල්ලුනා. උදරයේ ගර්භාෂයට කිට්ටු තැනක බඩ පැත්ත තමයි අල්ල ගත්තෙ. ඊට පස්සෙ ටික දවසක් යනකොට අම්මගෙ බඩේ ගෙඩියක්. මොනව කළත් හොඳ වෙන්නෙ නෑ. වෛද්‍යවරු කිව්වෙ ශල්‍යකර්මයක් කරන්න ඕන කියල. බලන කොට එක්ස්රේ (X-Ray) වලටත් බඩේ ගෙඩියක් කියල අහුවෙනව මිසක් වෙන එකක් අහුවෙන්නෙ නෑ.

මේ කාරණය මට ඇවිත් කිව්වම, කරන්න අවශ්‍ය කටයුතු ටික සමාධියට වැටහුනා. පස්සෙ ළමය වෙනුවෙන් දානයක් දීල පින් අනුමෝදන් කරනකොට, ළමයට අම්මගෙ බඩ අල්ලගෙන ඉන්න පුළුවන් තත්ත්වය වෙනස්වෙලා ගියා. එහෙම වෙනස් වෙලා ළමය එතනින් අහක් වුනාට, පරිවර්තනය ආවේ එතැනින් චුතවෙලා වෙනත් අත්බැවකට යන්න. කලින් හිටියෙ මනුස්ස ගන්ධබ්බයා වුනත් දැන් ඒ තත්වයට ගන්න බෑ. මේ නිසා මෙතනදී ප්‍රයෝගයකින් ගොඩගන්න පුළුවන් අවස්ථාවක් තමයි තිබුනේ. ඉතින් ගෙනාපු ආයුසත් හරියට වෙලාවට ඉවරයි. ඒ කියන්නෙ පෙර භවයෙන් මේ ළමයට ලැබිල තිබ්ච්ච ආයුස. දැන් මේ ළමයට ගති නිමිත්ත පේනවා. බලන කොට විශාල දිග උස චීන ඌරෙක්. මේ දර්ශනය ඒ ළමයට පේනවයි කියන එක මට සමාධියට වැටහුනා. දැන් මේ ගන්ධබ්බ ළමයා අර මස් කෑල්ලත් කටේ දාගෙන හපන ගමන්, අම්මෙ මට යන්න කියනව කියල අඩනවා. මට තේරුණා යන්න කියනව කියල මොනව කිව්වත් මේ ළමය මෙතනින් චුතවෙන බව. චුත වුනොත් කෙලින්ම යන්නෙ ඌරු අත් බැවකට. මොකද ඌරු මස් කාල ඒකට ගිජු වෙච්ච නිසා ඌරගෙ සම්බන්ධයක් තමයි ඊළඟ අත් බවය විදියට වැටෙන්නේ. ඌරගෙ දර්ශනය තමයි මේ ළමයගෙ හිතට එන්නේ. ඌරා ඕන දහ ජරාවක් ගිලින නිසා ඒ රසයට කෑදර වුණොත් ඒකත් ඌරු ගති ලක්ෂණයක්. මේ නිසා පටිසන්ධිය ඌරු පටිසන්ධියක් වෙලා ඌරෙක් විදියට උපදිනවා. එහෙම අවස්ථාවක් මතු වුණත් ළමය වෙනුවෙන් කරපු පිනකුත් මේ ළමයට තිබුනා. හැබැයි ඉතින් ප්‍රයෝග සම්පත්තියකින් ඒ පින නගන්න ඕන. එහෙම නැතිව නිකම්ම එන්නෙ නෑ. මේ නිසා කාව්‍යමය ශක්තියකින් යමක් කරල



දෙන්න අවස්ථාවක් සමාධියට නැගිල ආවා.

කවි මාලාවකින් සම්පූර්ණ කරල ඒ ළමයට අදහස් දීල, ඒ කියන්නෙ මැරෙන්න ඉස්සෙල්ල සුළු මොහොතකදි සිද්ධ කරගත්ත පිනේ තියෙන වටිනකම පෙන්නල දීල, ඒ වගේම ඒකෙන් ඒ ළමයගෙ තියෙන ගුණයට දිව්‍ය කුමාරයෙක් බවට පත් කරල, ඔහුට දිව්‍ය පිරිසක් විදියට තවත් 99 දෙනෙක් මවල දුන්නා. මේ විදියට මවන කොට ඒකට ගැලපෙන්නා වූ පින් ඇති ගන්ධබ්බ පිරිස් එතන උප්පත්තිය අල්ල ගන්නවා. ඊට පස්සෙ සමන් පිච්ච මල් තියෙන සඳුන් වනයක් එක්ක විශාල විමානයක් මැව්වා. මේවා ඔක්කොම කවිවලින් තමයි ගෙතිල ආවෙ. මේ විදියට මවල ඒ විමානයට යැව්වා. මෙහෙම යන කොට දැන් මේ ළමයට හරි සන්තෝසයි. ඒ සන්තෝසෙට අම්මව අමතක වුනා. ඒත් එක්කම චුතවෙන වෙලාවත් ආවා. ඌරු ගති නිමිත්ත එහෙම්ම අතුරුදන් වෙලා ගියා. අර ප්‍රියමනාප ලෝකෙක විමානයක් පහල වෙලා මේ ළමය ඒකෙ නායකය වෙලා තවත් කුමාරවරු 99 ක් එක්ක උපන්නා. දැන් මේ සිද්ධිය ශක්‍ර දේවේන්ද්‍රයා බලාගෙන හිටියා. බලාගෙන ඉඳල මේ පිරිස අරගෙන යන්න ආවා. ඊට පස්සෙ මේ පිරිස ශක්‍ර දෙව් ලොවට අරගෙන යන්න කියල ඔහුට භාර දුන්නා. ශක්‍ර දෙවියොත් බොහොම සන්තෝසෙන් ඒ පිරිස අරගෙන තාවතිංසය කියන ශක්‍ර දෙව් ලොවට ගියා. මේ මනුස්ස ලෝකෙදි මැවුනට පස්සෙ ඒ විමානය පිටින්ම උඩින් ගෙනියනව වගේ ශක්‍ර දේවේන්ද්‍රයා දිව්‍ය කුමාරයෝ 100 ක් එක්ක යන්න ගියා.

සිද්ධිය මේ විදියට නිමාවෙන කොට අම්මගෙ බඩේ අමාරුවත් හොඳ වුනා. එතකල් අම්ම හැමදාම අඬ අඬා හිටියෙ. මොකද දරුවගෙ මොකක් හරි මතක් වෙලා. ඒ වගේම ඇගේ නිතරම පළු මතුවෙන ස්වභාවයකුත් තිබුනා. අම්මගෙ ඒ මානසික තත්වයයි, කායික තත්වයයි සම්පූර්ණයෙන්ම සුව වුනා. දැන් ඊට පස්සෙ වෛද්‍යවරු ළඟට ගිහින් පරීක්ෂා කරල බලන කොට ගෙඩියක් නෑ. ඒක එක පාරටම අතුරුදන් වෙලා. ශල්‍යකර්මයකට භාජනය කරනවා ඇරෙන්න වෙන කරන්න දෙයක් නෑ කියල වෛද්‍යවරු කිව්ව ගෙඩිය, බේතක් හේතක් වත් නොකර මේ විදියට ඉවත් වුනේ කොහොමද? මේවා වෛද්‍ය විද්‍යාවට අහුනොවෙන ගුප්ත කාරණා.

දැන් මේ කථාව මෙහෙම කිව්වම සමහරු කියයි, මේවා පිස්සු විකාර කථා කියල. මොකද මේ වගේ සිද්ධි අද අහන්න ලැබෙන්නෙ නෑ. සුරංගනා කථා වගේ තමයි අද ඒවා සලකන්නෙ. ඒ නිසා ඒ වගේ දේවල් විස්වාස කරන්නෙ නෑ. නමුත් මේ පෙන්වා දුන්නෙ පිස්සුවක් විකාරයක් නෙවෙයි, අපේ මස් ලේ ඇහැට නොපෙනෙන, මස් ලේ කන්වලට නොඇසෙන, මස් ලේ ශරීරයට නොදැනෙන මේ ලෝකයේ සිද්ධවෙන අනන්ත අප්‍රමාණ ගුප්ත සිදුවීම්වලින් ඉතා අතලොස්සක් පමණයි. කර්ම ඵල විස්වාස කරන, දහම් අවබෝධ කරගන්න හේතු වාසනා තියෙන පින්වතුන්ට මේ වගේ දේවල් දැනගෙන, සංසාරයේ තියෙන භයානකත්වය වටහාගන්න මේ වගේ සිද්ධි උපනිශ්‍රයක් වේවායි කියන අදහසින්මයි මේ කාරණා හෙලි කළේ.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

**සටහන**
**නීතිඥ චන්දන සිරිවර්ධන**

# ආදි පැරැණ්නන් දහමට අනුව ගොවිතැන් කර පෙරදිග ධාන්‍යාගාරය ගොඩ නැගූ හැටි...

අපේ ආදී බොදුනුවන් වස විසෙන් තොරව, ප්‍රාණ ඝාතයෙන් තොරව, අනවශ්‍ය වියදමකින් තොරව ගොවිතැන් බත් කරල විශාල අස්වැන්නක් ලබල, රට සහලින් ස්වයංපෝශිත කරල යහපත් කෘෂි කර්මාන්තයක් බිහි කරපු හැටි තමයි මේ පෙන්වා දෙන්න උත්සාහ කරන්නේ. මේ සඳහා බොහෝ ක්‍රමෝපායන් යොදා ගත්තත් මූලික වූ න්‍යාය ධර්මය තමයි මෙතැනදී වැදගත් වෙන්නේ.



එදා අද වගේ උදලු, නගුල්, ට්‍රැක්ටර් ආදී යකඩින් හදපු උපකරණ ගොවි තැනට පාවිච්චි කළේ නෑ. ඒ එක්තරා හේතුවක් නිසා. **කුඹුරු සීසාන්න පාවිච්චි කළේ මී හරක් අඟකින් හදපු නගුලක්** තමයි. ඒකට කිව්වේ අං නගුල කියල. හැබැයි ඒකට **යකඩ සම්බන්ධ කරන්නෙ නෑ.** මොකද යකඩ පොළවට විසයි. මී හරක් අඟ අරගෙන කිතුල් ලීයෙන් හදපු ඇණයක් දාල නගුල වගේ අල්ලනවා. ඒ නගුල තමයි හරකට බැඳල අදින්නෙ. ඒක අඩි තුනෙන් තුනට එක අතකට ඇදගෙන යනවා. ඊලඟ වතාවේ කතිරෙ වගේ කැපෙන්න නැවතත් අඩි තුනෙන් තුනට අනෙක් අතට ඇදගෙන යනවා. අඟල් 4 ක් විතර හෑරෙන්නයි ඇදගෙන යන්නේ. හරක ඇදගෙන යනකොට අඟ පහත් කරනවා. හරියට අද නගුල පහත් කරනවා වගේ තමයි. මේ විදියට එක පැත්තකට අඩි 3න් 3ට රවුමට ගිහින් අනෙක් අතටත් අඩි 3න් 3ට හාගෙන යනවා. හාල ඉවර වෙලා වතුර බැඳල දවස් 7ක් යනකොට සම්පූර්ණයෙන්ම දියමඩ කාලා තැම්බිලා, මතුපිට තියෙන පෝර පස් යට යන්නෙ නැතිව රැඳෙනවා.

හැබැයි වර්තමානයේ කරන්නේ නගුලෙන් බිම පෙරලන එක. එතකොට මතුපිට තියෙන පස යට ගිහින් යට තියෙන පස උඩට මතුවෙනවා. නමුත් මේ පැරණි ක්‍රමයට සී සාන කොට පොහොර පස පණුවන් විසින් මතු පිටට ගෙනත් දානවා. ඒ සත්තු තමයි යට තියෙන පස කකා උඩට ගෙනත් දාන්නේ. එතකොට ගොයම් ගහේ මුල් ඇදෙන්නේ අඟල් 4ක් විතර ප්‍රමාණයකට. කොච්චර යට පොහොර තිබුණත් මුලෙන් ගන්න පුළුවන් ප්‍රමාණය එච්චරයි. ඉතින් අඟල් 4 කට පමණ දිය මඩ කාලා පොහොර වෙලා තිබුණොත් ගොයම් ගහ සරු සාරෙට වැඩෙන්න ඒ ටික හොඳටම ප්‍රමාණවත්. නමුත් වර්තමානයේ නගුලෙන් / උදැල්ලෙන් හාන කොට අඟල් 4 ක විතර පොහොර තට්ටුව පෙරලලා අනෙක් පැත්ත දාන එක තමයි කරන්නේ. ඒකෙන් යට තියෙන වැල්ල උඩට මතුවෙනවා. එතකොට අඟල් 4 ට වඩා යටගිය පොහොර පස් ටිකෙන් හැදෙන්න තියෙන ගහ හැදෙන්නෙ නෑ. නමුත් අං නගුලෙන් හාන කොට ඒ ප්‍රශ්ණය එන්නෙ නෑ. ඊට පස්සෙ පෝරු ගාන්න පුළුවන් වෙන ගාණට හැල් වෙනවා. යට තියෙන ඒවා මොකුත් අවුස්සන්නෙ නැති නිසා පණුවන්ට හානියකුත් නෑ. උන් පස් කනවා. ඒකට බාධාවක් නෑ. පණුවා පහරන්න විතරයි උඩට එන්නේ. ඒ විදියට පහරන මළ තමයි අපට පොහොර වෙන්නේ. ඒ ටික කරල උඃ නැවතත් යටට යනවා. මේ නිසා අං නගුලෙන් සී සාන කොට පණුවන් කැපෙන්නෙ නෑ. කුඹුරේ මේක ඇදගෙන යනකොට පණුවන් දෙපැත්තට ඇදිල යනව මිසක් කැපෙන්නෙ නෑ. නමුත් යකඩ නගුලුවලින්, උදලුවලින් උන් කැපිල මැරෙනවා. **පෝරු ලෑල්ලටවත් අං නගුලටවත් පණුවන් මැරෙන්නෙ නෑ.** පණුවන් අපට බාධකයක් නෙවෙයි. උන් කරන්නේ අපට වාසියක්. උන් තමයි පස පෝර කරල දෙන්නේ. ඉතින් මේ සිද්ධිය හරියට සිද්ධ වුනොත් විශාල යහපතක් වෙනවා. හරක් බානක් ගත්තම මේ ක්‍රමයට අක්කර 2ක් පමණ වැඩ කරන්න පුළුවන්. හරකුන්ට අමාරුවකුත් නෑ. මිනිස්සුන්ට අමාරුවකුත් නෑ. දැන් මෙහෙම කළාට පස්සෙ කුඹුර පෝරු ගානවා. නැවත දෙවන වරක් සී සාන්න දෙයක් නෑ. පෝරු ගාලා වපුරනවා.

ඊලඟට **අතින් මඩ අරගෙන තමයි එදා නියරවල් හැදුවේ.** උදැල්ලක් තියා යකඩයක් ගෑව්වෙවත් නෑ. මොකද යකඩ විසයි. ඒකෙන් ගොයම් රතුපාට වෙන රෝගයක් හැදෙනවා. ඒක මළකඩ මුල්කරගෙනයි හැදෙන්නේ. අද සමහර විට එහෙම දෙයක් සිද්ධ වෙන බවවත් දන්නෙ නැතිව ඇති. අර විදියට යකඩ සම්බන්ධ නොකළාම ඒ රෝගය හැදෙන්නෙ නෑ. යකඩයක් කැපෙන්න කැපෙන්න ඒ යකඩ අංශු සියල්ලම මළකඩ අල්ලමින් මාස ගණන් දිරනවා. ඒවා ඔක්කොම පොළවට සම්බන්ධ වෙනවා. ඒක ගොයමට දෝසයක් වෙනවා. නමුත් ඒ කාරණය අද දන්නෙ නෑ. දැන් යකඩ භාවිතය නිසාම ඒවාට වෙන වෙන ප්‍රතික්‍රියා ප්‍රතිචාර දක්වලා, ගොයම බේරගන්න බේත් වර්ග, රසායන පොහොර ආදිය දාන්න වෙනවා. නමුත් අර කියපු ස්වභාවික ක්‍රමයට කටයුතු කරන කොට ඕව මොකුත් ඕන නෑ.

අනෙක් කාරණය තමයි සත්ව අපද්‍රව්‍ය වශයෙන් පණුවගෙ අපද්‍රව්‍යමයි කුඹුරට එකතු වෙන්නේ. පණුව පස් කාලා ඒ පොළවෙම මැරිල යනවා. ඉතින් හය මාසයක් තුල මැරෙන පණුවන්ගේ තියෙන සත්ව පොහොර ප්‍රමාණය කොච්චරද? ඒවා ☞

ඔක්කොම ගොයම් ගහට අදිනවා. එතකොට අමුතුවෙන් මොකවත් දාන්න ඕන නෑ. පණුවා පස් කනවයි කියන එක ඔප්පු කරන්න පුළුවන්. ගැඩවිල් පස් ටිකක් අරගෙන බැලුවොත් තනිකරම තියෙන්නේ හීනි මැටි. ඌ කාල තියෙන්නෙ පස්මයි. හරිම සියුම්. ඉතින් හරි පහසුවෙන් ගසට උරාගන්නවා. ඌ කන පස අපද්‍රව්‍යයත් එක්ක පහරන ඒවත් සමග සියල්ලෙන්ම පෝෂණය වෙලා තමයි උඩට එන්නේ.

මේ ගැඩවිලි පස් හොයාගත්තෙ මහ කැලෑවලින්. **ඉස්සර කුඹුරු වටේටම වනාත කියල විශාල කැලෑ ප්‍රදේශයක් තිබුණා. ඒක තිබුණේ වතුර හිඳෙනවට.** ඒක කපන්නෙ නෑ. ඒ නිසා තමයි කුඹුරේ වතුර හිඟ නොවී තිබුණෙ. මහා ගස් කොළන් ඒකෙ තිබුණේ. ඒ ගස් යට තමයි උඩට මතුවෙලා ලොකු ගුල් වගේ පණුවන්ගෙ මළපහ තියෙන්නේ. මේ ගැඩවිල් පොහොර තමයි කුඹුරට දාන්නේ. පොහොර හොයන්න ඈතට යන්න අවශ්‍ය වුනේ නෑ. මේ ගැඩවිල් පොහොර පොල් ලෙලි, කොළපු, පිති, හනසු ආදිය පුච්චපු අලු සමග මිශ්‍ර කරල තමයි දැම්මේ. අපතේ යන කිසිම දෙයක් නෑ. අද කුඹුරු වපුරන්න පෙර ගහන මඩ පොහොර වෙනුවට තමයි මේක පාවිච්චි කළේ. රසායනික පොහොර භාවිතයට පෙර මුල් කාලවල ඇට පෝර කියල දෙයක් දැම්මා. නමුත් ඒ ඇට පෝර දාන්න පෙර කාලයේ පාවිච්චි කළේ මේ කියන ගැඩවිලි පස් සමග පොල් ලෙලි, පිති, පොල් කොළපු ආදියේ අළු තමයි. මේකෙ මහා ඖෂධ රසායන පෝර ශක්තියක් තියෙනවා. ඒකෙන් කිසිම ජීවියෙකුට හෝ මනුස්සයෙකුට හානියක් නෑ. ඒ කාලයේ කුරුණියක් කියන තරම් ප්‍රමාණයක් තමයි අක්කරයකට පාවිච්චි කළේ. ඒ ටික හොඳටම ඇති. මේ කියන මිශ්‍රණය වංගෙඩියක දාල කොටල, හොඳට මිශ්‍ර කරල ගත්තම රසායන පෝරක් වගෙයි. එතකොට ඒකෙන් හැදෙන ගොයම කෘමීන් කන්නෙත් නෑ, විසත් නෑ. මොකද ගොයම් කන්නෙ කෘමි පණුවන්. නමුත් **පණුවන්ගෙ අපද්‍රව්‍යවලින් හැදිච්ච ගොයම පණුවන් කන්නෙ නෑ.** හරියට හරකගේ ගොමවලින් හැදිච්ච තණකොළ හරක කන්නෙ නෑ වගෙයි. ගොම ගොඩ හොඳටම පරණ වෙලා. හැබැයි එතැන තණකොල සරුවට හැදිල තියෙනවා ඒ ගොම පෝර නිසා. නමුත් හරක එච්චර සරුවට හැදිල තියෙන තණකොල පඳුර මග හැරල තමයි කන්නේ. මේක පැහැදිලිවම පේන්න තියෙන දෙයක්. මෙහෙම තමයි ගැඩවිල් පොහොර ගැහුවමත් සිද්ධ වෙන්නේ. ගැඩවිල් පෝර ගන්නෙ මේ නිසයි. කීඩෑ වර්ග ඔක්කොම කෘමි පණුවන් වර්ගවලට අයිතියි. මේ නිසා ගැඩවිල් පොහොරවලින් හැදෙන ගොයම උන් කන්නෙ නෑ. මේක අපේ පැරැන්නන් දැනගෙන හිටියා.

ඉතින් කෘමීන්, පණුවන් පිටකරන අපද්‍රව්‍ය තමයි ගැඩවිල් පස් කියල කියන්නේ. ඒක පොල් පිති, කොලපු, හනසු ආදියේ අළුත් එක්ක මිශ්‍ර කළාම පොටෑසියම් වගේ වෙනත් අයන වර්ගත් ලැබෙනවා. මේ කියන මිශ්‍රණය කුඹුරට ගැහුවම හය මාසයක් යනකල් ඒකෙ රසය අඩු වෙන්නෙ නෑ. ඒ වගේම කෘමියා ඒකට



ප්‍රිය නෑ. ඒ හේතුවෙන් කෘමීන් බෝ වෙන්නෙත් නෑ. කෘමියන්ගෙන් ඇතිවන හානියකුත් නෑ. ඵලදාවත් වැඩිවෙනවා. **මේ ක්‍රමයට 1 : 300 ක් හෙවත් බුසලට බුසල් 300ක් අස්වැන්න ගන්න පුළුවන්. එතකොට රසායන බෙහෙත් වර්ග, කෘමිනාශක.. මේ මොකුත් ඕන නෑ.**

මීලඟට අපේ පැරැන්නන් කුඹුරු වගාවට භාවිතා කළ බලවත් ගාථාවක් අද වෙනකොට යටපත් වෙලා තියෙනවා. ගොවිතැන් බත් කරල ජීවත්වෙන පින්වතුන්ගේ හිතසුව පිණිස ඒ ක්‍රමයත් මේ විදියට මතු කරල තියෙනවා. පාන්දර 4ට පමණ කපුටන් කෑගහන්න පෙර වතුර කලයක් අරගෙන ඒකට සුදු හඳුන් කුඩු ටිකක් එකතු කරගන්නවා. දැන් දෙහි අතු කැල්ලක් හෝ පුවක් මල් කිනිත්තක් අරගෙන නමස්කාරයෙන් පටන් ගෙන පහත ගාථාවෙන් 108 වරක් සජ්ජායනා කරමින් ඒ වතුර කලය ජීවම් කර ගන්නවා.

**බනේන අග්ගිං ජල මාන නාය**
**සබ්බං පි චේ චන්දන දාරු බීයේ**
**ශරීර බීයේ සුගතස්ස ධාතුයෝ**
**මුත්තං සුවණ්ණං සුමනංච දිස්සති**

දැන් මේක කුඹුරට ඉහිනවා. සමාන්‍ය ක්‍රමයට වගා කරන කොට කෘමි උවදුරුවලින් කොටු කුඹුරුවලට වඩා යාය කුඹුරු ආරක්ෂා වෙනවා. මොකද යාය කුඹුරක කෘමි සතුන් ව්‍යාප්ත වෙලා ඉන්නේ. නමුත් කොටු කුඹුරක නම් සත්තු ඔක්කොම එතනට එක් රැස්වෙන නිසා ආපදාව වැඩියි. ගොයම් මැස්සො වගේ සතුන් වට පිටාවේ ගොඩක් ඉන්නවා. නමුත් යාය කුඹුරක කුඹුරුවලට බෙදිල යන නිසා වටපිටාවේ ඉන්න සතුන් අඩුයි. මේ නිසා කොටු කුඹුරකින් අස්වැන්න ගන්න අමාරුයි, බොල් වැඩියි. නමුත් මේ ගාථාවෙන් සෙත් කළාම යාය කුඹුරුවලින් වගේම අස්වැන්න ගන්න පුළුවන්. කළු ඇට කියන ඒවා එන්නෙත් නෑ. මැස්සන් වී ඇටය බාගෙට බිව්වම හැදෙන ඇඟිටි තමයි කළු ඇට කියන්නේ. නමුත් මේ ගාථාවේ තියෙන බලය නිසා ගොයම් මැස්සො බොන්නෙ නෑ. ගොයම් ගහේ පිත්තේ තියෙන රසය බොනවා මිසක් වී ඇටය බොන්නෙ නෑ. ඊලඟට මේ ගාථාවෙන් සෙත් පැන් ඉහින ක්‍රමයක් තියෙනවා.

උදේ 8, 9, 10 වගේ කාල සීමාවේදී තමයි ගොයම් මල් පූදින්නේ. ඒ වෙලාවෙදි තමයි විනාඩි ගණනක් ඇතුලත පරාග පෝෂණය වෙන්නේ. මෙන්න මේ වෙලාවෙදි වැස්සොත් එහෙම විශාල වශයෙන් කුඹුර බොල් වෙලා යනවා. අස්වැන්න අඩු වෙනවා. මොකද වහින වෙලාවට මල් පිපුණොත් පරාග පෝෂණය වෙන්න විදියක් නෑ. මේ නිසා නියම විදියට නම් ඒ වෙලාවට පායන්න ඕන. නමුත් **මේ ගාථාවේ බලය කොච්චරද කියනව නම්, ඔය වෙලාවට කොච්චර වැස්සත් අර ගොයම් මල් විවෘත වෙන්නෙ නැතිව වහින වෙලාවට ඒ මල් වැහිල තියෙනවා. වැස්ස ඉවරවුනාට පස්සෙ තමයි ඒවා පීදිලා පරාග පෝෂණය වෙන්නේ.** ඉන්පසු කෙටි කාලයක් ඇතුලත රේණු විසිරිලා පරාග

පෝෂණය වෙනවා. ඒ රේණු තමයි මලින් මලට ගිහින් පරාග පෝෂණය කරන්නේ. ඒ කාල සීමාවේ වහින්නෙ නැතිව විනාඩි 10ක් තිබුණත් හොඳටම ඇති. මේ ගාථාවේ විශේෂත්වය තමයි ඒ කෙටි කාල සීමාවේදී ඉක්මනට පරාග පෝෂණය වීම. **ගාථාවේ බලයෙන්, පිපෙන වෙලාවට වැස්සොත් නොපිපී ඇතුලට යනවා. වැස්ස නතර වුණාට පස්සෙ නැවතත් වැඩේ සිද්ධ වෙනවා.** ඉන්පස්සෙ වැස්සත් කමක් නෑ. මේ විදියට ලැබෙන අස්වැන්න ගත්තොත් හාල් කොටල බලනකොට ඇඹිටි ඇට එකක්වත් නෑ. අස්වැන්න හොඳටම වැඩියි. **ගොයම් මැස්සටත් ඉතා සාර්ථකයි. වැස්සෙන් එන බාධාවයි, ගොයම් මැස්සගෙන් එන බාධාවයි දෙකම නවතිනවා. ගොයමට මේ ක්‍රමය විශේෂයි.** අනෙක් වගාවන්ටත් අවශ්‍ය නම් පරීක්ෂා කරල බලල යෙදීමෙන් බොහෝ යහපත උදාකරගන්න පුළුවන්.

මේ ගාථාවේ බලයෙන් මෙහෙම විශාල යහපතක්, අස්වැන්නක් ලැබෙන්නෙ කොහොමද කියල ගාථාවේ තේරුමෙන් දැනගන්න පුළුවන්.

බනේන අග්ගිං ජල මානනාය - ක්ෂණයකින් ගිනිගෙන ක්ෂණයකින්ම මහා ජල කඳක් ආවා. ඒ කියන්නේ බුදුන් වහන්සේගේ ශ්‍රී දේහය කවුරුවත් ගිනි තිබ්බෙ නෑ. නියම වෙලාවට නියම මිම් අනුව ජලය හා ගින්න ක්ෂණයකින් ප්‍රමාණාත්මකව ආවා. ගින්දර ඕන වෙලාවට ගින්දරත්, ජලය ඕන වෙලාවට ජලයත් කියන මේ දෙකම ක්‍රමානුකූලව ඇවිදින් තමයි ඒ ශ්‍රී දේහය ආදාහනය වුනේ. එතකොට ගොයමටත් අව්ව වැස්ස ක්‍රමානුකූලව අවශ්‍ය වෙලාවට ලැබෙන්න හේතුව තමයි මේ කියන සත්‍ය බලය. මේ නිසා විකෘති වෙලා අව් වැසි එන්නෙ නෑ. මේ විදියට තමයි බුදුන් වහන්සේගේ ශ්‍රී දේහයේ එදා තිබ්ච්ච මහා සත්‍ය බලය මෙතනට ගන්න ආරෝපණය කරන්නේ.

සබ්බං පි චේ චන්දන දාරු බීයේ - චන්දන දාරු කියන්නෙ හඳුන් දරවලට. සියළුම හඳුන් දර ඒ අවස්ථාවේදී දර සෑයට එකතු වෙලා ක්‍රියාත්මක වුනු හැටි තමයි මේ කියන්නෙ. දර සෑයේ සියළුම දර එකවිට ගිනි ගත්තා. ඉන්පසු එකවරම වැස්සා. අවශ්‍ය ප්‍රමාණයටයි දෙකම සිද්ධ වුණේ. ඉන්පසු නිවිල ගියා.

ශරීර බීයේ සුගතස්ස ධාතුයෝ - මුත්තං සුවණ්ණං සුමනංච දිස්සති. බුදුන්වහන්සේගේ ශාරීරික ධාතු මුතු මෙන් රන්වන් පැහැයෙන් මනාව දිස්වුණා. ඉතින් බුදුන් වහන්සේගේ ධාතුන් වහන්සේලා ලස්සනට රන්වන් පාටට විද්‍යමාන වුනේ කොහොමද, ඒ වගේම වී ඇට සම්පූර්ණයෙන්ම රන්වන් පාටට විද්‍යමාන වෙනවා. අපිට වී ඇට තමයි මුතු ඇට වගේ දිස්වෙන්නේ. බුදුරජාණන් වහන්සේගේ ධාතුන් වහන්සේලා වගේ, ඒ සත්‍ය බලයෙන් වී ඇටත් ලැබෙනවා. එදා බුදුරජාණන් වහන්සේගේ ධාතුන් වහන්සේලා කාටවත් වෙනස් කරන්න බැරිව මුතු මෙන් රන්වන්ව මනා සේ දිස්වුණා වගේ, වී ඇට විනාශ නොවී නියම වෙලාවට නියම විදියට පැහිල එනවා. **අව්වෙන් වැස්සෙන් දෙකෙන්ම විනාශ නොවී රැකවරණ ඇවිදින් නියම විදියට පෝෂණය වෙලා එනවා.**

බුදු රජාණන් වහන්සේගේ ගුණය මුල්කරගෙන අක්ෂර, ගන හරියට පිහිටුවල ඒ කාලයේ හදපු ගාථාවක් තමයි මේ. මේක පැරණි ගොවියෝ දැනගෙන හිටියා. පාරම්පරිකව ආපු එකක්. මෙන්න **මේ වගේ ක්‍රම අනුගමනය කරල තමයි එදා පැරකුම් රජ්ජුරුවන්ගෙ කාලයෙත් රට සහලින් ස්වයංපෝෂිත වෙලා ඉතිරිය රට යැව්වේ.** අදත් මේ ක්‍රම අනුගමනය කරනව නම් මෙච්චර කාලයක් රසායන පොහොර, කෘමිනාශක ගහල ගන්න බැරි ආදායමක් ලබා ගන්න පුළුවන්. වස විස මොකුත් නැතිව කිසිම බාධාවකින් කරදරයකින් තොරව ඒ වගේ සශ්‍රීකත්වයක් ලබන්න පුළුවන්. නමුත් උඩින් පල්ලෙන් රසායන පොහොර ගහල ඒක කරන්න බෑ. කුඹුරක් කියන්නේ නිදහස්ව ස්වාභාවිකව ඒ ස්ථානයේම පෝෂ්‍ය කොටස්වලින් හැදෙන එකක්. මේ නිසා එදා **තිබ්ච්ච අස්වැන්න ගන්න නම් වතාවල් හත අටක්වත් මේ විදියට වැඩ කරන්න වෙනවා.** මොකද මේ වෙනකොට රසායන බේත් ගහලා පොලවේ රස ධාතුව සම්පූර්ණයෙන්ම විනාශ වෙලයි තියෙන්නේ. ගොයම් ගහට පෝෂ්‍ය පදාර්ථ දෙන සත්තු විනාශ වෙලා. ඒවා නැවත හැදෙන්න ඕන.

ඔය ගොයම් ගහේ හෝ එළවලු පැලේ හෝ පලතුරු ගහේ හෝ තියෙන ස්වාභාවික රසය අඩුවීම නිසා තමයි කෘමි සතුන්ට ප්‍රිය කරන කොළයක් හරි ගහේ හැදෙන්නේ. ඒ නිසා තමයි කෘමි සත්තු බෝ වෙන්නේ. ඒ ගස නියම කොළ පාටට නියම තත්වයෙන් වැඩුනොත් සතුන්ට විනාශ කරන්න බෑ. ඒකට අවශ්‍ය පරිසරය ඒ තුලම වැඩෙන්න ඕන. ගහ වැඩිච්ච පලියට ඒක වෙන්නෙ නෑ. ගහ වැඩෙන කොට අලුතෙන් එකතු කරන රසායන අර විදියට කෘතිමව දුන්නොත් ඒ හේතුවෙන් ඒක හැදෙන්නෙ කෘමි සතුන්ට ඕන විදියට. නමුත් ඒක ස්වාභාවිකව හැදුනොත් ඒකෙ සාරය සතුන්ට ප්‍රිය නෑ. උන් කොළේ යුෂ බොනවා. එහෙම යුෂ බීලා හොඳනම් තමයි තමන්ගෙ ජාතිය ඒ ගසේ වැලේ බෝ කරන්නේ. යුෂ බොනකොට උන්ට තිත්ත නම්, අප්‍රිය නම් ඒ ගසේ බිත්තර දාන්නෙ නෑ. උන් වෙන දිහාවකට යන්න යනවා. එතකොට වර්ධනයට පසුතලයක් තිබුණ නම් ඒකත් හැදෙන්නෙ නෑ. වෙන තැනකට ගියත් එතැනත් පෝෂණයට හේතුවන සාධක නැත්නම් ඒ දාන බිත්තරත් වැනසිලා යනවා. නමුත් ඒක අපි කරන දෙයක් නෙවෙයි, එතකොට ඔය කීඩෑ උවදුරු වගේ ඒවා එන්නෙ නෑ. ස්වාභාවික පොහොරින් හැඩගැහෙනකොට සිද්ධ වෙන්නෙ ඒකයි. මොකද කීඩෑවෝ, පණුවෝ වගේ ඔය සත්තු ඉස්සරත් හිටියා. නමුත් හැදිල තියෙන ක්‍රමයට ශාකවලට වින කරන්න විදියක් තිබුණෙ නෑ. ඇට පෝර වගේ දේවල් දාන්න පටන් ගත්තෙ ඊට පස්සෙ. නමුත් ඇට පෝර දැම්මම ගහ හොඳට හැදුනත් ඒක පණුවන්ට ප්‍රිය නිසා උන් ඒව කාල හැදෙනවා. මේ නිසා අර පෙර තිබ්ච්ච අස්වැන්න නෑ. අනික ඇට පෝරවල ස්වභාවික ඖෂධ ශක්තිය නෑ.

ඉතින් මේ විදියට කෘමිනාශක, වල් නාශක, කෘතිම පොහොර ගහන්න ගත්තම අධික විස එකතු වුණා. ඒ විස පොළවට ගියාට පස්සෙ කාලයක් රැඳෙනවා. ඒ නිසා තමයි පුළුවන් තරම් බාල කරලා විවිධාකාර රසායන විදියට කලවම් කරල එවන්නේ. එතකොට ඒ අයගේ වැඩේ සාර්ථකයි. ශැබැයි මනුස්සයාට අගුණයි. පොළවේ විස රැඳෙනවා. මුලින් තාවකාලිකව විස ගතිය ගෙවිල යන ඒවා හදල තිබුණත් පසුව වැඩේ කරගන්න ඕන නිසා මිනිස්සු මළත් කමක් නෑ කියල විශේෂ අධිසැර ඒවා සකස් කළා. ඒවා ගැහුවම ඒ රසායන ශක්තියට වැඩි ආයුෂ එනවා. ඒ කියන්නෙ සත්තු හැදෙන්නෙම නෑ. එතකොට ඒ රසායන වර්ගය සාර්ථකයි කියල මිනිස්සුන්ට මතුපිටින් පේනවා. නමුත් ඒකෙ තියෙන්නෙ අධික විස. ඔය වකුගඩු රෝග, මී උණ ආදී නම්වලින් කියන විවිධාකාර රෝග හැදෙන්නෙත් මේවායින් තමයි. ඉතින් මේ කාරණා බුද්ධිවන්තව විමසා බලා නිවන් මග වඩන ගමන් ලෞකික අභිවෘද්ධියත් උදාකරගෙන තම තමන්ට යහපතක්ම සලස්වා ගන්න උත්සාහ ගන්න.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වතරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# සියලු උණ රෝගයන්ට උණ ශාකයෙන් ප්‍රතිකර්මයක්...

වහරක අභයරතනාලංකාර හිමියන් ගිහිවතක සිටියදී බොහෝ කොට අත්හදා බලා අත්දැකීම් ඇති, සමාධියට හසුවූ තවත් සුවිශේෂීය ප්‍රතිකර්මයක් තමයි මේ ඉදිරිපත් කරන්නේ.

සාමාන්‍යයෙන් සමහර රෝගවල ආරම්භක රෝග ලක්‍ෂණයක් ලෙස උණ හට ගැනීම හැඳින්විය හැකි අතර එය කුඩා රෝගවල සිට භයානක රෝග දක්වාත් දිවෙන රෝග ලක්‍ෂණයක්. සාමාන්‍ය වෛරස් උණ රෝගයන්ගේ පටන් මී උණ (ලෙප්ටොස්පයිරෝසිස්), චිකන් ගුන්යා, ඩෙංගු හා මොළේ මැලේරියාව වගේ මාරාන්තික උණ රෝගයන්ගෙන් වසරකට සෑහෙන ජීවිත සංඛ්‍යාවක් අහිමි වෙනවා. විශේෂයෙන් ජන සමාජයේ දූෂිත භාවය හා නොසැලකිලිමත්කම නිසාත්, ඒ හේතුවෙන් ස්වභාවික චක්‍ර හා ක්‍රම රටාවන්ගේ අක්‍රමවත්වීම නිසාත්, නිතර වෙනස් වන පාරිසරික තත්ත්වයන් යටතේ හඳුනා ගැනීමට පවා අපහසු උණ රෝගයන්ගේ ප්‍රවර්ධනයක් මෑතක සිට බොහෝ කොට අහන්න ලැබෙනවා. **හේතුඵල දහම් රටාව අනුව මේ සෑම උණ රෝගයකටමත් මුල් වෙච්ච හේතුවක් තියෙනවා.** විශේෂයෙන් මනුස්-සයින්ගේ අභ්‍යන්තරයේ තියෙන යහපත් ගුණ ධර්ම ඌන වී යාමෙන් ඒවා දුරට අස්වෙලා හෙවත් දුරස්වෙලා ඒ ශක්තිය උණ කියන ශාකයේ එක්තරා විදිහකට තැන්පත් වුණා. එහි හේතුඵලයක් ලෙස පටිච්ච සමුප්පාද චක්‍රය අනුව උණ ශාකය හටගෙන ඇති බව සමාධියෙන් දකින්න පුළුවන්. මේ පිළිබඳ පැහැදිලි විග්‍රහයක් පසුගිය 17 වන කලාපයේ ''ලොව සෑම වචනයකටම නිරුක්තියක් හා ඊට අනුකූල අදහස් ගැලපීමක් ඇත'' යන මාතෘකාව යටතේ ඉදිරිපත් කළා. ඒ අනුව සියලු උණ රෝගයන්ට ඖෂධයක් වූ ඒ ප්‍රතිකර්මය උණ ශාකයෙන් ලබාගන්නා හැටි තමයි මේ ඉදිරිපත් කරන්නේ.

උණ ශාකය ගත්තම ප්‍රධාන වශයෙන් වර්ග 2 ක් තියෙනවා. එයින් සුලභම වර්ගය තමයි කහපාට උණ ශාකය. ඊට තරමක් දුර්ලභ අනෙක තමයි කොළ පාට උණ ශාකය. ඒකට නිල් උණ කියලත් කියනවා. එතකොට දැනට ලෝකයේ පවතින දරුණුම උණ රෝගයක් වන මොළේ මැලේරියාවට හා මොළේ ආසාදනය මුල් කරගෙන හටගන්නා ජැපනීස් එන්සෙපලයිටීස් වගේ වෙනත් රෝගයන්ට යොදා ගන්නේ මේ කියන කහ පාට හා කොළ පාට උණ ශාක වර්ග දෙකේම මිශ්‍රණයක්. ඒ වගේම තවත් දරුණු උණ රෝගයක් වන කහ උණ (සෙංගමාලය හෙවත් හෙපටයිටිස්) කියන රෝගයට



යොදාගන්නේ කොළ පාට උණ ශාකය. ඩෙංගු ඇතුලු අනෙකුත් සියලුම සාමාන්‍ය උණ රෝගයන්ට යොදාගන්නේ කහ පාට උණ ශාකය.

මේ සඳහා යොදාගන්නේ උණ ශාකයේ ළපටි අවස්ථාවේ තියෙන උණ මොටෙයියන් හෙවත් උණ කුරුල්ලන්. ඒක සාමාන්‍යයෙන් පොළව මට්ටමේ සිට අඟල් 9 ක් පමණ හෝ අඩි 1 1/2 ක් පමණ හෝ උඩට වැඩිල තියෙන්න පුළුවන්. (සමහර විට ඊට වඩා වැඩියෙන් උස ගිහින් තිබුණත් අග ළපටි බොඩ කොටසක් ඉතුරු වෙලා තියේ නම් ඒකත් ගන්න පුළුවන්) අන්න ඒ මට්ටමේ ළපටි උණ ශාකයක් තමයි මේකට ගන්න ඕන. ඒ වගේ උණ ශාකයක විශේෂයෙන් ඉහළ කොටස ගත්තම ඉතා ළපටියි. පොළවෙන් උඩට ආපු ඒ කොටස කපාගෙන පිට පොතු ටික බූව යන කල් ඉවත් කළාම සුදු පාට ළපටි බඩයක් හමුවෙනවා. හරියට කෙහෙල් ගහක් පතුරු ගහපුවම මැද තියෙන සුදු පාට බඩය වගේ. ඒ උණ බඩය තමයි මේකට යොදා ගන්නේ. මෙතනදී සුදු බඩය කිච්චම අභ්‍යන්තරයේම තියෙන ටියුබ් ලයිට් එකක් වගේ පුංචිම කොටස විතරක් නෙවෙයි, ඊට පිටින් තවත් වට දෙකක් පමණ යනකල් තියෙන සුදු බොඩ කොටසත් යොදාගන්න පුළුවන්. කෙහෙල් ගහ පතුරු ගහනව වගේ උණ කඳ පතුරු ගහගෙන යන කොට බූව අහු නොවන මට්ටම ආවම එතැන් පටන් ඇතුළට තියෙන කොටස මේකට යොදාගන්න පුළුවන්. සාමාන්‍යයෙන් කොටල මිරිකල යුෂය ගන්න පුළුවන් ප්‍රමාණය තමයි මෙතනදී ගන්නෙ. ගහ පතුරු ගහනකොට ඒ විදියට කොටල මිරිකගන්න පුළුවන් මට්ටම මොකක්ද කියල තමන්ටම අත්දැකීමෙන් දැනගන්න පුළුවන්.

දැන් මේ කියන උණ බොඩය අරගෙන පුංචි කෑලිවලට කපාගෙන වංගෙඩියක දාල කොටා ගන්නවා. එහෙම නැත්නම් බ්ලෙන්ඩර් යන්ත්‍රයකින් ඒක කරගන්නත් පුළුවන්. මේ විදියට කොටාගත් උණ බොඩය පොට්ටනියකට අරගෙන හොඳින් මිරිකල පෙරහනකින් පෙරා ගන්නවා. හැබැයි කිසි විටෙකත් මේකට වතුර මුහු කරන්නෙ නෑ. තනි උණ යුෂමයි යොදාගන්න ඕන. සාමාන්‍යයෙන් එක් උණ බොඩයකින් පීරිසි කෝප්පයකට ආසන්න යුෂ ප්‍රමාණයක් මිරික ගන්න පුළුවන්. දැන් මේක තමයි ඖෂධය වෙන්නේ. මේක ටිකක් තිත්තයි. නිකන් බොන්න බැරිනම් සීනි හෝ තල් සූකිරි ටිකක් එක්ක ගත්තට වරදක් නෑ. හැබැයි **විශේෂයෙන්ම මේ ඖෂධය ගර්භනී මවුවරුන්ට නොදෙන්න**

**වගබලා ගත යුතුයි. මොකද සමහර විට ඒක ගබ්සා වීමටත් හේතු වෙනවා.**

උණ රෝගියා වැඩිහිටියෙක් නම් මේ යුෂයෙන් වරකට මේස හැඳි 2 බැගින්ද, ළදරුවෙක් නම් තේ හැන්දෙන් 2 බැගින් ද දිනකට 3 වරක් (කෑමට පෙර හෝ පසු) ගත යුතුයි. සාමාන්‍යයෙන් දින 2-3 ක් යනකොට දරුණු උණ රෝගයක් වුනත් සනීප වෙනවා. සමහර විට ඒක එක් දිනකින් වෙන්නත් පුළුවන්. එහෙම නැත්නම් දින 2-3 කට වැඩියෙන් යන්නත් පුළුවන්. උණ රෝගයේ ස්වභාවය හා පුද්ගලයා අනුව කාලය වෙනස් වෙන්න පුළුවන්. කොහොම හරි වේල් 2-3 ක් ගන්න කොට තමන්ටම වෙනස අත්දකින්න පුළුවන්. ඒ වගේම උණ රෝගය නිසා හටගත් තුවාල කුෂ්ඨ ආදිය තියෙනව නම් ඒවත් මේකෙන්ම සනීප වෙනවා. පසුව එන්න තියෙන අතුරු ආබාධ පවා සුව වෙනවා.

මේ ඖෂධයේ තියෙන තවත් විශේෂ ලක්‍ෂණයක් තමයි කොච්චර දරුණු උණ රෝගයක් වුනත් ඇඟ පතට වැඩි වෙහෙස මහන්සියක් නොදැනී කෙටි කාලයකින් සනීප වීම. ඒ වගේම වෙනත් බටහිර ඖෂධවල වගේ **කිසිම අතුරු ආබාධයක්** නෑ. 100% ක්ම ස්වභාවිකයි. කිසිම අගුණයක් නෑ.

දැන් මේක යොදාගන්න ඕන අර මුලින් සඳහන් කරපු වගේ ඒ ඒ උණ රෝගයන්ට ගැලපෙන උණ ශාකයක් යොදාගෙන. ඒ කියන්නේ මොළේ මැලේරියාව හෝ මොළේ ආසාදනය මුල්කරගෙන හටගන්නා උණක් නම් කහ පාට හා කොළ පාට උණ ශාකවල උණ බොඩයන් 2 ක යුෂය මිශ්‍ර කරගත යුතුයි. ඩෙංගු හා වෙනත් සාමාන්‍ය උණ රෝගයන්ට කහ පාට උණ ශාකයේ බොඩය ඒ විදියට මිරිකා යුෂය ගත යුතුයි. සෙංගමාලය හෙවත් කහ උණට තිල් උණ (හෙවත් කොළ පාට උණ ශාකයේ) බොඩයේ ඉස්ම ගත යුතුයි.

ඊළඟ කාරණය තමයි ඖෂධය කල් තබා ගැනීම. දැන් මේ විදියට ගත්තු උණ යුෂය සාමාන්‍ය තත්ත්වයන් යටතේ තියා ගන්න පුළුවන් දින 2-3 ක් පමණයි. ශීතකරණයක තැන්පත් කළොත් මාසයක් පමණ කල් තියාගන්න පුළුවන්. ඊට වැඩි කලක් (අවුරුදු කීපයක්) කල් තියාගන්න නම් තල් සූකිරිත් එක්ක මිශ්‍ර කර ලිපේ තබා උණු කර කුඩා කැට හෝ කුඩු විදිහට හදාගන්න පුළුවන්. හරියට හකුරු වගේ. එහෙම නැත්නම් තල් සූකිරිවලින් පැණියක් විදියට හදාගන්නත් පුළුවන්.

සාමාන්‍යයෙන් උණ යුෂ පිරිසි කෝප්පයකට තල් සූකිරි ග්‍රෑම් 100 ක් ප්‍රමාණවත්. මේක ලිපෙන් බාලා කෙහෙල් කොළයක තලපෙ වගේ තුනී කළාම ඉක්මනට ගල් ගැහෙනවා. ඒක පුංචි කැට හෝ කුඩුවලට කුඩු කරගන්න පුළුවන්. මේ තල් සූකිරි මිශ්‍ර පැණි හෝ කුඩු හදාගන්න කොට අඩුම උෂ්ණත්වයකින් සිඳ ගැනීම ඖෂධ බලය සුරැකීමට හේතු වෙනවා. එයින් තේ හැන්දක් පමණ එක වේලකට පාවිච්චි කළාම ප්‍රමාණවත්. හැබැයි මේ තල් සූකිරිත් සමග මිශ්‍ර කරල ගත්තම අර කලින්, යුෂය කෙළින්ම ගන්නව වගේ බලයක් නෑ. ඊට වඩා එහි බලාත්මක භාවය ටිකක් අඩුයි. නමුත් ඖෂධ ශක්තිය තියෙනවා. මේ නිසා විශේෂයෙන් දරුණු උණ රෝගවලට කෙළින්ම යුෂය ගන්න පුළුවන් නම් වඩා හොඳයි.

මේ උණ ප්‍රතිකර්මයෙන්, ඩෙංගු රක්තපාතය හැදිල මාරාන්තික වෙච්ච රෝගීන් පවා නිට්ටාවට සනීප වෙලා තියෙනවා. මේ සම්බන්ධව පරීක්‍ෂණ කටයුතු කරන වෛද්‍ය මණ්ඩලවලට අවශ්‍ය නම් මේ කියන කාරණයේ සත්‍ය අසත්‍යතාව පරීක්‍ෂා කරල බලන්න පුළුවන්.

**සටහන**

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# රක්තවාතය නිට්ටාවට සුව කරන තෙල සම්බන්ධයෙන් තවදුරටත් .....

පසුගිය කලාපයෙන් විස්තර කළ රක්තවාත තෙල සම්බන්ධයෙන් තවත් කෙටි පැහැදිලි කිරීමක් තමයි මේ. එහිදී ප්‍රධාන ශුද්ධ තෙල හිඳගෙන ඉතිරි වන තෙල් කා ටික පොට්ටනියකට දාලා වෙනම මිරිකගෙනත් අමතර තෙල් ප්‍රමාණයක් ලබාගන්න පුළුවන් බව සඳහන් කළා. සමහර විට එහෙම තෙල්කා මිරිකල ගන්න පුළුවන් තෙල් ප්‍රමාණය ඉතා අඩු නිසා එහෙම නොකළත් කමක් නෑ. මේ විදියට තෙල් ලබාගත්තට පසු අවශ්‍ය නම් තවත් අමතර තෙලක් හිඳගන්න පුළුවන්. ඒ සඳහා අර කලින් වගේ පැලපී පොල්වල පොල් මදය විතරක් අවශ්‍ය වෙනවා. ඒ වගේ පැලපී පොල් ගෙඩි 5 ක් හෝ 10 ක් හෝ කැමති ප්‍රමාණයක පහටිය පළුවේ පොල් බෑයවල් ටික ගා ගෙන, ඒ ගත්ත පොල් ගෙඩි සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් ලොඳ හැදිච්ච නැති කුරුම්බැට්ටිවල වතුරෙන් අමු කහ අඹරා හදාගත් ගුලි සමාන සංඛ්‍යාවක් දිය කර ගෙන ඒ වතුරෙන් පොල් ටික මිරිකා ගත යුතුයි. දැන් ඒ පොල් කිරි ටික අර කලින් තෙල් හිඳල ඉතිරි වෙච්ච තෙල්කාවලට (ශුද්ධ තෙල හා අමතර තෙලද ලබා ගත් පසු හෝ ශුද්ධ තෙල පමණක් ලබාගත් පසු) මිශ්‍ර කර මුලදී මිරිකගත් බෙහෙත් රොඩු ටික නැවත වරක් කොටා උණු දියෙන් මිරික ගෙන ඒකත් මිශ්‍ර කර, කලින් වගේම ලොකු ඇතිලියේ දාල කුරුඳු දරවලින් රත් කර මුදු පාකයට එනකොට බා ගන්නවා. ඒ තෙල් ටික මිරික ගත්තම ඒකත් වෙනම තුවාල තෙලක් විදියට පාවිච්චි කරන්න පුළුවන්. හැබැයි අර ශුද්ධ තෙලේ තරම් බලයක් මේකට නෑ. දද, කුෂ්ඨ, තුවාලවලට හොඳයි.







ඒ වගේම මේ විදියට තෙල් හින්දවල අවසානයට ඉතිරි වන තෙල්කා අපතේ නොදමා ඒකත් පාවිච්චියට ගන්න පුළුවන්. ඒ තෙල්කා තේ හැඳි 1/2 ක් පමණ දවසට දෙවරක් කෑමට පාවිච්චි කිරීමෙන් ශරීරයේ තියෙන රක්ත උෂ්ණය නිසා හටගත් විෂ මළපහත් සමග පිටවෙලා සුද්ධවෙලා යනවා. මේ තෙල් කා වලට මෝදකය සුළු ප්‍රමාණයක් මිශ්‍ර වෙලා තියෙන නිසා ළමයින්ට දෙනව නම් තේ හැඳි කාලකට අඩු ප්‍රමාණයක් දීම සුදුසුයි. හැබැයි මේ තෙල්කා පුස්කාලා නරක් වෙන්න බලන නිසා ශීතකරණයක තැන්පත් කර තබාගත යුතුයි. ඒ වගේම කැමති නම් මේ විදිහට දෙවෙනි වර තෙල් නොහිඳා පළමු වර තෙල් මිරිකා ගත් පසු ඉතිරිවන තෙල්කාත් මේ විදියට කෑමට පාවිච්චි කරන්න පුළුවන්.

මීන් පෙර විස්තර කළ පරිදි රත්පිත් විස ලේ මිරිකා ඇඟිලිවල නිල ස්ථානවලින් ඉවත් කිරීමට එකී නිල පිහිටි ස්ථාන සොයාගන්නා ආකාරය රූ සටහන් මගින් මෙහි දක්වා තියෙනවා.


# ගතියට ආවේණික රූපයන්ගේ පහළ වීම

*(14 වන කලාපයෙන් - උපතින් සමාන මිනිස් ජාතිය පසුව වඩන ගතිය අනුව වෙනස් වන හැටි)*

මිනිසා මිනිස් භවයට (ගතියට) අනුව පටිසන්ධිය ලැබුව නම් ''භව පච්චයා ජාති'' කියන සිද්ධාන්තයට අනුව මිනිස් ජාතිය ලබා උපදිනවා. මේ උපන් ජාතිය තුළ ඇස, කන, නාසය, දිව, ශරීරය, වස්තු රූපය (හදවතේ ලේ ඇසුරුකර සූක්ෂම කයේ පවතින සිත පහල කරන රූප කලාපයන්) යන කොටස් ඇසුරු කර ගෙන චක්ඛායතනය, සෝතායතනය, ඝානායතනය, ජිව්හායතනය, කායායතනය, මනායතනය ලෙස ආයතන හයක් ලබනවා. ඇස, කන...... ආදී ඉන්ද්‍රියන් ලෙස අපි සම්මත කරගෙන තියෙන්නේ ආයතනද? අපි ආයතනය කියන්නේ මොකටද? යම්කිසි නිෂ්පාදනාගාරයකට මේ වචනය සම්මතයක් ලෙස භාවිතා කරනවා.

උදහරණ විදිහට යම් ගොඩනැගිල්ලක කුමන හෝ නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යනව කියල හිතමු. යම් මුදල් ගනුදෙනු කරන බැංකුවක් සඳහා ඒ ගොඩනැගිල්ල පාවිච්චි කරනවනම් ඒක බැංකු ආයතනයක්. ගොඩනැගිල්ල, ඒ තුළ වන ක්‍රියාවලිය, දැන්වීම් පුවරු..... මේ ආදී අපේ ඇසට පෙනෙන දේවල් ද උපකාර කර ගෙන ඒක බැංකුවක් ලෙස සම්මත කර ගන්නවා. යම් කාලයක ඒ බැංකුව වෙනත් ගොඩනැගිල්ලකට ගෙන ගියා කියල හිතමු. ටික දිනකින් පසු බැංකුව තිබ්ච්ච ගොඩනැගිල්ලේ ඇඳුම් මහන වැඩ පලක් ආරම්භ කළා කියල හිතමු. දැන් අපි ඒකට බැංකු ආයතනය කියල කියන්නෙ නෑ. දැන් ඇඟලුම් ආයතනය කියල සම්මත කර ගන්නවා. නමුත් ගොඩනැගිල්ල එකමයි. ගොඩනැගිල්ල එසේම තිබියදී ආයතනයේ නම වෙනස් වූ බව පේනවා. මේ බව නොදන්නා අය පෙර තිබූ ගොඩනැගිල්ල දැකල බැංකු ආයතනය කියල හිතාගෙන ඉන්නවනම්, ඇතුළත වූ වැඩ කොටස තුළ වූ වෙනස්වීම් නොදැන හිටිය නම්, කවුරුන් හෝ බැංකු ආයතනය කොහේද කියල ඇහුවොත් ඒ ගොඩනැගිල්ලම පෙන්වනවා. නමුත් ආයතනය වෙනස් කළ බව දන්න කෙනා, දැන් ඒක ඇඟලුම් නිෂ්පාදන ආයතනයක් බවත්, එහි ගොස් බැංකු ගනුදෙනු කළ නොහැකි බවත් ප්‍රකාශ කරනවා. දැන් මේ දෙන්නගෙන් කාගෙ කීම හරිද? ආයතනයේ වැඩපිළිවෙළ වෙනස් කිරීම ගැන දන්න කෙනාගේ කීම පිළිගත හැකි බව පේනවා.

මිනිස් භවේ ආයතනයන්ට හිමිකම් කියමින් උපන් මිනිස් දරුවා, මිනිස් භව ඇති කරන්න හේතු වන නාම, රූප ධර්ම ඇසුරු කරමින් ඉන්නවනම්, ඒ තාක් මිනිස් චක්ඛායතන, මිනිස් සෝතායතන.... ආදී වශයෙන් මිනිස් ආයතනයන්ම පවත්වා ගන්නවා. උපතින් භවාංග (භවයට අංග වන) සිත සමග සම්බන්ධ, කර්ම ශක්තිය හා තවත් හේතූන් මගින් වෙනත් බාහිර සතර මහා භූත හා නාම ධාතූන් සම්බන්ධ කර ගනිමින් මිනිස් සළායතනයන්ට අවශ්‍ය නාම රූප ධර්ම නිපදවන්න මග පාදන නමුත්, මිනිසා ඊට හාත්පසින්ම වෙනස් වූ බලු ගතිය ගෙන දෙන, බලු බවට හේතුවන නාම රූප ඇසුරු කරන්න වුණා නම්, ඒ ඉන්ද්‍රියන් තුළින් දැන් පවත්වගෙන යන්නේ බලු වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන බලු සළායතනයි. ''නාම රූප පච්චයා සළායතනං'' කියන සිද්ධාන්තයට අනුකූලව ඒක සිද්ධ වෙනවා. දැන් ඔහු ලබන්නේ බලු ගතියට හේතුවන ස්පර්ශයන්. එහි ප්‍රතිඵල ලෙස බලු ගතියේ ස්පර්ශයේ වේදනා ඔහුට හිමි වෙනවා. බලු වේදනාවන්ට කැමති වන ඔහු ඒවා ප්‍රිය මධුර ලෙස ගනිමින් බලු තණ්හාවට පත්වෙනවා. ඒ ආස්වාදය නිසා ඒ ඒ බලු ආස්වාදයන්ට යොමු වෙමින් ඒ ස්වභාවය වැලඳ ගන්නවා, බඳා ගන්නවා, උපාදාන කරනවා. එමගින් ඔහුට බලු කර්ම භව ඇති වෙනවා. මෙසේ බලු නාම රූප ධර්ම ඇසුරු කරන තරමටම බලු කර්ම භව බලවත් වෙනවා. යම් භවයකට (ගතියකට) අනුකූල වුනානම්, පෙර උප්පත්ති භවය හෙවත් පෙර උපන් ගතියට අනුව පවත්වා ගෙන ආ මිනිස් හේතු ඵල ප්‍රවාහය කෙළවර වෙලා චුත වෙන මොහොතේ පටන් බලු උප්පත්ති භවයට පත්වෙලා, බලු ගතිය ක්‍රියාත්මක කිරීම අරඹන නිසා බලු උප්පත්ති භවට ඊට සුදුසු ජාති, සුදුසු තැන ඇති වෙනවා. ශක්තිය කියන්නේ ගතියට ආවේණික වන ගති රටා ගෙනෙන නාම රූප පහල කරන ශක්ති හැඩ ගැසීමයි.







මෙහිදී වැදගත් දෙයක් තේරුම් ගත යුතුයි. දැනට බොහෝ ප්‍රචලිත අදහසක් තියෙනවා. ඒ ද්‍රව්‍ය හා ශක්ති යනුවෙන් නවීන විද්‍යාවට අනුකූල යැයි කියමින් ගන්නා විපරීත අදහසක්. මේ විපරීත බව ඇති වෙලා විපරීත ජාති පහල වෙමින් ද පවතිනවා. මේකත් ''භව පච්චයා ජාති'' කියන සිද්ධාන්තයට අනුව කියන ප්‍රකාශයක්. ශක්තිය මොකක්ද? ද්‍රව්‍යය මොකක්ද? ද්‍රව්‍යය මෙසේ වෙනවා. අභ්‍යන්තර නාම රූපයන්ට හෙවත් මතක සටහන් යැයි අපට වැටහෙන මනෝ ලෝකයේ නැගෙන ආකාර (රූපාකාර, ශබ්දාකාර, ගන්ධාකාර....), ලිංග ☞

(පස්, ගඩොල්, සිමෙන්ති, ගිහි, ශ්‍රමන....... ආදී), නිමිති, උද්දේස (යමක් උදෙසා තැනූ), ප්‍රඥප්ති (පනවා ගත්)වලට අනුව හැඩ ගැසෙන, ක්‍රියාත්මක වන, ඊට අනුරූපව හැඩගැසුම් ක්‍රම රටා නැගෙමින් ද්‍රව්‍ය වස්තු ලෙස නිෂ්පාදන සැකසෙන ද්‍රව්‍ය වස්තුවල ධාතු මූලයක් තියෙනවා. ඒ ධාතු මූලයෝ ආපෝ, තේජෝ, වායෝ, පඨවි කියන ගති හතරකින් ද ඒවා සමග පවතින වර්ණ, ගන්ධ, රස, ඕජා කියන ගති ස්වභාව හතරකින් ද සමන්විතයි. මේ ගති අට අවිද්‍යා තණ්හා දෙකේ ස්වභාව අටක් බැගින් කර්මජ චිත්තජ වශයෙන් මේ අටට අනුකූලව රූප කලාප අටක මිටියක් එකින් එක වෙන් කළ නොහැකි ලෙස අවිනිර්භෝග (සම්භෝග-එකතුවීම, නිර්භෝග - වෙන්කිරීම, අවිනිර්භෝග - වෙන් කළ නොහැකි ) රූප කලාප යනුවෙන් පහල වෙනවා. මේ රූප කලාප ශුද්ධාෂ්ටක (ශුද්ධ වූ කොටස් අට) යන නමිනුත් හඳුන්වන අතර කර්ම චිත්ත බලයෙන් ගොඩනැගෙන මොහොතේ කල්ප ගාණක් භ්‍රමණ චක්‍රානුසාරයෙන් ක්‍රියාත්මක විය හැකි න්‍යෂ්ටික (අටකින් සකස් වූ න්‍යාය) බලයක් ශුද්ධාෂ්ටකය උරුම කරගෙන නිපදවෙනවා. ඒ උරුම කාලය ගත වෙලා වැනසෙන තුරු උපක්‍රමයෙන් බිඳ හරින්න බැරි මූලයක් ලෙස පෙනී සිටිමින් ලෝකයේ විවිධාකාර භූතයන් (මායා රූපයන්) මවනවා. ඒ නිසා මේවාට භූත රූප කියලත් කියනවා. (මෙහි රූප ගොඩනැගෙන ක්‍රමවේදය ලෙස පෙන්වා ඇත්තේ ධර්මානුකූලව බලන විට වැටහෙන ක්‍රමයයි.)

**බුදුරජාණන් වහන්සේ දේශනා කළ ශුද්ධාෂ්ටකය යන නමින් හඳුන්වන පරමාණුව කියන්නේ දැනට නවීන විද්‍යාවේ කියන පරමාණුව නෙවෙයි. එබඳු ශුද්ධාෂ්ටක අනන්ත අප්‍රමාණව තියෙනවා.** මේවා හැමවිටම මනෝ රටාවන්ට අනුව බල ලබා ඒ මනෝ ශක්තියේ බලය නිසා ආකර්ෂණය නම් ගුණයකට ගොදුරු වී තියෙනවා. මේ ශුද්ධාෂ්ටක, ඒ චිත්ත ශක්තියෙන් නැතහොත් ගති ශක්තියෙන් නිපදවූ, ගති ආකාර සකසවන ගති ශක්තියට ගොදුරු වී බල නැගී ඇති නිසා අනුරූප පරිදි ක්‍රියා කරනවා. පවතින ගතියට නැමී හිටපු ගතියෙන් නැගෙන ශක්තිය, ගතියේ යම් ආකාර පැවැත්මක් සඳහා නැම්ම ඇති කරනවද, ඊට අනුව නැමී ද්‍රව්‍ය වස්තු ලෙස රුප්පනය වෙනවා (රූ ඔප් නැංවීම රුප්පනයයි.) රුප්පනය සඳහා නිතරම සූදානම්ව සිටින ශුද්ධාෂ්ටක එසේ බල ගැන්වී සිටින්නේ ගතියේ ජීවිත බලාපොරොත්තුවේ හැටියටයි. මෙහිදී ශුද්ධාෂ්ටක කිව්වේ දැනට විද්‍යාඥයන් කියන සම්මත පරමාණුව නෙවෙයි, ඊට වඩා අති සූක්ෂමයක්. ඒ රූපයෝ අණ්වීක්ෂයකින් බලන්න බැරි තරමට අති සූක්ෂම නමුත් අනාගතයේදී මේවා තියෙන බව දැනගන්න උපකරණ නිපදවන්නත් පුළුවන්. මේවාම නැතත් අතීතයේ බැලිය නොහැකිය කියූ ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටෝන හා නියුට්‍රෝන කියන මේවා ඇති බව දැනගන්න උපකරණ සැදූ පරිදි අනාගතයේදීත් නිපදවන්න පුළුවන්. ඒ ඇයි? මේවා රූප ධාතුම වන නිසයි. එනම් විෂය (පෙනෙන) රූපයන්ට වඩා සියුම් අවිෂය රූප නිසයි. හයිඩ්‍රජන්, ඔක්සිජන් යන වායු ස්වභාවයේ බිඳීම් අවස්ථාවක් දැක, ඒක බිඳුණම නොපෙනී ගියා කියමින් ඒවා හිතේ කොටස් යැයි කියන වර්තමාන ඇතැම් මතවාදී පිරිස් ඇත්නම් මේ ගැනත්



හිතල බලන්න.

වායු පරමාණුවක් දකින අණ්වීක්ෂය නිපදවා නොතිබුණා කියල හිතන්න. නමුත් යම් පරීක්ෂණ බඳුනකට ජලය දමා එහි ස්කන්ධය, ධාරිතාව මැනීමට වෙනම බීකරයක් සකසා ඒ ජලය අධි තාපයට පත් කළ කාබන් සමග ගැටෙන්න බටයක් තුළින් යැව්වොත් එයින් ලැබෙන ප්‍රතිඵලය මොකක් වේද? කාබන්වල තිබූ බර අඩු වෙනවා. යළි වායු දෙකක් ලැබෙනවා (කාබන්ඩයොක්සයිඩ් හා හයිඩ්‍රජන්), ජලය අවිද්‍යමාන වෙනවා. දැන් සිද්ධ වුනේ මොකක්ද? වාතය දකින, නැතිනම් වාතයේ ඉතා කුඩා අංශුවක් දකින (මෙහි වාතය කිව්වේ වායු ගති ඔප් නැංවුණු රූප කොට්ඨාසයක්. ඔක්සිජන් ආදී වශයෙන් හිතාගෙන හිටියත් නියම පරමාණුව මීට වඩා සියුම්. එහි වායු ගතිය වෙන් කළ නොහැකි පරමාණු තියෙනවා. මේ වායු කියන්නේ සම්මත නමක් පමණයි) උපකරණය නොතිබුණා නම් හා ඉහත පරීක්ෂණය කරල තිබුණ නම්, දකින්න ලැබෙන්නේ දැකීමේ මට්ටම ඉක්මවා ගිය වායුවක් බවට පත් වූ බවයි.

මේ නිසා පෙනෙන කොටස හා නොපෙනෙන කොටස කියල දෙකක් එදාට නිගමනය කරාවි. ඉන් එහා බලන්න පුළුවන් පරමාණුව කියල කියන වායුවේ ඉතා කුඩා අංශුව දකින ක්‍රමය දැන් තියෙන නිසා, ඒක පේන නිසා වායුවත් රූපයක්ය කියන සම්මතයේ ඉන්නවා. නැවත ඉන් පහල සියුම් කොටස දකින ක්‍රමයක් සොයා ගත්ත දවසට ඒවාත් රූප බව දැන ගන්න පුළුවන් වේවි. එදාට අවිද්‍යාව වැටහේවි. ඒක අවිද්‍යාවක් කියල කියන්න කරුණු දෙකක් පෙන්වන්න පුළුවන්.

යමකට ආවේණික ක්‍රියා රටාවක් කියල කිව්වනම්, හේතුවක් නැති ඵලයක් ඇති බවත් ඒ ඵලය ලෙස ක්‍රියාකාරිත්වයක් පෙන්වන නිසා අහේතුකවාදී ආකාස්මිකවාදී (ඉබේ හෙවත් හේතුවක් නැතිව පහළ වෙන හා හේතුවක් නැතිව වැනසෙන) වෙනවා මිසක් හේතු නොපෙන්වන නිසා හේතුඵල දහම අත් හැරෙන බව එක කරුණක්. දෙවැනි කරුණ තමයි ඇතැම් මතවාදීන් විසින් දැනට විද්‍යාඥයින් කියන පරමාණුව නමින් හඳුන්වන තැනට එනතුරු රූප යැයි සම්මත කිරීමත්, ඉන් බිඳුන කොටස තුළ ශක්ති ක්‍රියාවක්, ශක්ති ප්‍රතිචාරයක් දැක නාමය යැයි සම්මත කිරීමත් යමෙක් තමා දැක ප්‍රත්‍යක්ෂ කළා කියල කියනව නම් මින් හඟවන්නේ (ප්‍රත්‍යය යන වචනයට අත්දැකීම් සහිත දැනගැනීම යැයි කියනව නම්) තමා හරියටම දැනගත් බව නම්, **කවුරුන් හෝ අන්තිමට දුටු පරම සත්‍යයකින් බසින නිගමනය එකක්ම විය යුතුයි. මොකද පරම සත්‍ය දෙකක් එකම** කාරණය සම්බන්ධයෙන් තියෙන්න බෑ. නමුත් බුදුරජාණන් වහන්සේ ද්‍රව්‍ය මූල ගැන දේශනා කළ පරම සත්‍යයට බැස වටහාගත් කෙනෙකුගේ අදහසක් කියා ඉහත කී මතය පිළිගන්න බෑ. මීට හේතු මොනවද?

ආලෝකය කියන්නේ පරමාණුවලට වඩා කුඩා දෙයක්ද? (මෙහිදී පරමාණු කියල කිව්වේ දැනට ලෝකයේ සම්මත අර්ථයෙන්) ඊට වඩා ලොකු හෝ ඊට සමාන දෙයක්ද? මේ ආලෝකය අතර සූර්යාලෝකය අරගෙන බැලුවොත් නවීන විද්‍යා මතය අනුව සම්මත පරමාණුවටවඩා බොහෝ කුඩායි. ඒ ආලෝක කිරණ ☞

තවත් බෙදී ගියාම රතු, කහ, නිල් යන මූල වර්ණ ආලෝක කිරණ ලෙසත් අද නවීන විද්‍යාව ගණන් ගන්නවා. ආලෝකය නැතිනම් යම් වස්තුවක් අපට පේන්නෙ නෑ. නමුත් සූර්යාලෝකය යම් වස්තුවක් මත පතිත වීමේදී ඒ ආලෝක කිරණයේ කොටස් වූ වර්ණ කිරණ ඒ වස්තුවට උරා ගනිමින් ඉන් පරාවර්තනය කරන වර්ණ කිරණ ධාරාව ඇසේ ස්පර්ශ වුණාම අපට වර්ණ පෙනෙන බව නවීන විද්‍යා මතයයි. සම්මත පරමාණුවේ බිඳීමෙන් ඇති වූ ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටෝනවලටත් වඩා අති සියුම් ආලෝක කිරණත්, ඊටත් වඩා සියුම් වර්ණ කිරණත් තේරුම් ගත්තම කතාවේ ඇති පරස්පර විරෝධයත්, අන්ධ විස්වාසයකට බැස ඇති නිගමනයක කතාවත් මෙතනදී ඒ කතාව තුළින්ම හෙළි වන බවත් පෙනී යනවා.(ඇල්ෆා, ගැමා, බීටා, ලේසර් ආදී නම්වලින් හඳුන්වන්නෙත් අති සූක්‍ෂම රූප කලාපයෝමයි.)

කෙනෙකුගේ මතයක් මෙසේය. ''රූපයෝ ඇසෙහි ගැටීමෙන් රත්වීමක් වෙනවා. පරමාණුව බිඳෙනවා. එහි තේජෝ හෙවත් උෂ්ණ ගතිය, දැනීම ගෙන දෙනවා. දැනීම එයයි" දැන් මෙතැනදී කියන්නේ රූපයක් ඇසට ගැටීමෙන් පෙනීම ආපු හැටියි. ඇසේ වදින්නේ වර්ණ ආලෝක කිරණ මිසක් පරමාණු යැයි සම්මත ද්‍රව්‍ය නෙවෙයි. අලුත් මතයේ එන හැටියට නම් නාම ධර්මයි. අලුත් මතය අනුව බුද්ධ වචනය මෙසේ වෙනස් විය යුතුයි. ''චක්ඛුංච පටිච්ච නාමේච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං'' කියල අලුත් විය යුතුයි. මේ අනුව නම් චක්ඛු විඤ්ඤාණය හටගත්තේ ඇසේ නාමයක් කැමැත්තෙන් (ගැලපීමෙන්) බැඳීම නිසයි. නමුත් බුද්ධ වචනය නම් මෙහි නාමේච යන්නට රූපේච විය යුතුයි. එනම් චක්ඛු විඤ්ඤාණය හට ගන්නේ ඇසෙහි, රූපයක් කැමැත්තෙන් බැඳීම (මිතුරු දෙය මිතුරු දෙයට ඇදී බැඳී සිදුවන ක්‍රියාවලියයි මෙහි පටිච්ච කිව්වේ) නිසයි. කාලයේ හැටියට හෝ එකිනෙක්කෙනාගේ මුළාවන්ට වැටහෙන ආකාරයෙන් නිර්මල බුද්ධ වචනය වෙනස් නොකර සිටීම ධර්ම මාර්ගය නිරුපද්‍රිත වී නිවන් මගට හේතුවන බවත්, ඒ ධර්ම රත්නය ආරක්ෂා කිරීම ලෝකයාට වැඩ සහිත බවත් තේරුම් ගත යුතුයි. **බුදුරජාණන් වහන්සේ මේ අති සියුම් රූප කොටස් පවා රූප හෙවත් රූප කලාප කියල දේශනා කළා මිසක් නාම කියල දේශනා කර නැති බව පේනවා. ඒ නිසා කිරණ වර්ග පවා රූප බව ඔප්පු කරමින් බුද්ධ වචනය සනාථ කරමින් දැනටමත් විද්‍යාඥයින් විසින් කිරණ වර්ගත් දකින මගක් නිපදවා තියෙනවා.** ඒක දැනටත් ඔප්පු කරල තියෙනවා. සත්‍ය ක්‍රමය බුදු බසට අනුව මෙසේ තේරුම් ගත යුතුයි.

ලෝකයේ පවතින ධාතු කියන්නේ යම් ද්‍රව්‍යයක මූලයන්. ඒ ඒ වර්ගයේ ධාතු මූලයෝ තියෙනවා. ගස්, ගල්, වායු වර්ග, සත්ත්ව, පුද්ගල ආදී සෑම





දේකටම ධාතුවක් හෙවත් ඒ වර්ගයේ අද සම්මතය අනුව නම් අංශුව හෝ අංශු තියෙනවා. ජලය, වායුව, ගින්න, තද ද්‍රව්‍ය කියන මේවා එකට එකතු වෙලා සිරුරක් නිපදවෙලා තියෙනවා. මේ එක ධාතුවක්. මෙහිදී එකිනෙක බැඳී රැඳී තියෙන නිසා ශරීරය නමැති මහ ද්‍රව්‍ය විද්‍යමාන වෙනවා. ගස් වැල්වලත් මෙසේ කොටස් හතරක් යම් යම් ආකාරවලින් බැඳී රැඳී පැවතෙමින් රූප විද්‍යමාන වෙනවා. ජලය අරගෙන ඒකෙත් ධාතුව හෙවත් ඒ ආකාරයේ කුඩාම කොටස බැලුවම එකට බැඳී රැඳී වෙළී ඇති හයිඩ්‍රජන් වායු කොටස් දෙකකුත් ඔක්සිජන් වායු අංශුවකුත් තියෙන බව සොයා ගන්නවා. ඒක වෙන් කළොත් ජලය කියන සම්මතය නැති වෙනවා. ඒ එක වායු අංශුවක් අරගෙන බින්දොත් ඉලෙක්ට්‍රෝන, ප්‍රෝටෝන, නියුට්‍රෝන ආදී පරමානු කියල වෙන් කරනවා. **මෙතෙක් කොච්චර බිඳුනත් රූපම සියුම් වුණා මිසක් එකම බිඳීමකින්වත් නාම වුනේ නෑ.** එක එක ද්‍රව්‍ය වස්තුවලට අයිති ක්‍රියා ශක්තියක් තියෙනවා. මේවා මනෝ ශක්තියෙන් නිර්මාණය වෙලා තියෙන නිසා ඊට අනුව ක්‍රියා කරනවා මිසක් එසේ නොවුන නම් අක්‍රිය වස්තු වශයෙන්, ක්‍රියා කිරීම නවතිනවා. නැතිනම් රූපයන්ගේ මූලය වනතුරු ලිහී ගිහින් අක්‍රියව සිටිනවා. රූපයත් නාමයේ නිර්මාණයක් නිසා, ගොඩනගපු ආයු කාලය කෙලවර වී වැනසෙන්නෙත්, නැවතත් රූප මාත්‍ර ගොඩනැගීම වෙන්නෙත් සත්වයාගේ පැවැත්මේ බලාපොරොත්තුව අනුවයි. එසේ වන බව නොපෙනෙන්නේ අනන්ත ලෝක සත්ත්වයින්ගේ පැවැත්මේ බලාපොරොත්තුව නිසා ඇති වන ක්‍රියාවට ගෝචර වෙලා ඒ බලාපොරොත්තුව මූලය කරගෙන හටගත් ශක්තිය ඒ ඇසුරේ ක්‍රියා කරන නිසයි.

**නැසී ගිය චක්‍රාවාට නැවත පහල වෙන කොට සම්පත්තිකර මහා මේඝය සත්ත්වයන්ගේ පුණ්‍ය බලයෙන් හට ගන්නා බව බුදු දහමේ පෙන්වා තියෙනවා. සත්ත්වයා යම් විටෙක ලෝක ධාතුව ගෝචර කරගෙන එහි බසිමින් දූෂිත තත්ත්වයට පත් වෙනවද, ඉහත කී නිෂ්පාදන ශක්තිය නිකුත් කරන මහ බලය අඩු වෙනවා.** යම් කාලයක පවිත්‍රව ඉන්න කොට පැවැත්මේ බලාපොරොත්තුව මත ඉන්නව නම් මේ ශක්තිය ප්‍රබල වෙලා මහා විපර්යාසයක් ඇති කරනවා. මහා කාලයක් ඒක හට ගන්වන්න ගත වෙනවා. මහා කාලයක් ඒ හට ගැන්වූ සම්මතය විනාශ වෙන්නත් ගත වෙනවා. චිත්ත ශක්තිය හෙවත් ගති ශක්තියට මේ පරමාණු එක්වෙන හැටි බලන්න අදත් පරීක්ෂණ කරල බලන්න පුළුවන්. **සාමාන්‍යයෙන් චිත්ත ගති බලවත් කෙනෙක් තමාගේ අතේ යම් ද්‍රව්‍යයක් ඇති සේ චිත්ත ගති මවාගෙන සිටියදී, මිග් වර්ගයේ සියුම් ද්‍රව්‍ය ඡායා රූපයට ගන්නා කිරිලියන් කැමරාවකින් ඒ පුද්ගලයාගේ අත ඡායාරූපගත කළා නම්, ඒ පුද්ගලයා හිතාගත් ගති රූපය ඒ ඡායාරූපයට වැටෙනවා. ගති ශක්තිය බලය දෙන බව හා රූප මවන බව එයින් ඔප්පු වෙනවා.**

**(ඉතිරි කොටස ලබන කලාපයෙන්)**

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# අපට නොපෙනෙන ලෝකය දහම් ඇසින්...

**7 වන කොටස**

එක් කාන්තාවක් එක් එළිච්චියකගේ හිස සිඳපු පාපයට නිරයේ ගිනි දැල් මැද අපා දුක් විඳල, නැවතත් එළිච්චියකගේ ඇගේ ලෝම ගණනට හිස් කැපුම් කෑමේ සිද්ධියක් මුල් කරගෙන කරපු දහම් විග්‍රහයක් පසුගිය කලාපයෙන් ඉදිරිපත් කළා. දැන් මෙතනදී කෙනෙකුට ප්‍රශ්නයක් එන්න පුළුවන්, බුදු දහමේ පෙන්වන හේතුඵල න්‍යාය ධර්මයට අනුව හේතුවට අනුකූල නම් ඵලය, මෙතනදී ඒ හේතුවටත් වඩා වැඩි ඵල විපාකයක් ලැබිල තියෙන්නෙ කොහොමද කියල. මොකද එළිච්චියකගේ හිස සිඳපු වරදට ඊට කෝටි වාරයක් වැඩි විපාකයකට ඒ පුද්ගලයාට මුහුණ දෙන්න සිද්ධ වුණා. පිටින් බැලුවම එහෙම වෙන්න පුළුවන්ද කියන ප්‍රශ්නයක් මතු වුනාට මේ කාරණය මීට වඩා ගැඹුරින් සලකා බලන කොට ඊට හේතුව හොයා ගන්න පුළුවන්. මෙතනදී හේතුව කියල කිව්වට එක් හේතුවක් නෙවෙයි, හේතු කිහිපයක්ම මේකට මුල් වෙනවා. ඒ සම්බන්ධ දහම් විග්‍රහයක් තමයි මේ ඉදිරිපත් කරන්නෙ.

**යම් කිසි කෙනෙක් ප්‍රාණඝාත චේතනාවක් පහළ කළොත්, ඒ මොහොතෙදි ඒ පුද්ගලයාගෙන් විහිදෙන දූෂ්‍ය කිරණ ශක්තිය දසදහසක් සක්වලටත් විහිදෙනවා.** ඒක පොඩි සීමාවක් නෙවෙයි. ඒ දසදහසක් සක්වල ඉන්න සත්වයින්ටම ඒ චේතනාව නිසා හටගන්නා දූෂ්‍ය කිරණ ශක්තිය බලපානවා. එක සතෙක් මැරුවට සතාගෙන් නෙවෙයි මෙතනදී ප්‍රශ්නය එන්නේ. ප්‍රාණඝාත චේතනාව නිසා විහිදෙන විස කිරණ ශක්තිය තමයි බලවත් වෙන්නෙ. ඒක එච්චරටම බලවත්. යමෙක් මේ කාරණය අවිද්‍යාව නිසා දන්නෙ නැතිව හෝ ගණන් ගන්නෙ නැතිව හෝ සතෙක් මැරුවට, එතනින් හට ගන්න දූෂ්‍ය ශක්තිය මහා බලවත්ව නැගී සිටිනවා. පරිසරය දූෂ්‍ය වෙලා සත්වයින්ගේ ආයුෂ අඩු වෙන්න මේක බොහෝ කොට උපනිශ්‍රය වෙනවා. **බාහිර පරිසරය දූෂ්‍ය වෙන්න, ක්‍ෂාර බවට පත්වෙන්න, ඊට හේතුකාරක වන්නා වූ පරිසරයක් හැදෙන්න මේ කාරණය හේතු වෙනවා.** ඒ නිසා ඒ පුද්ගලයාට අනන්ත කාලයක් විපාක විඳින්න සිද්ධ වෙනවා.

ඒ වගේම **සතා මරණ අවස්ථාවේදී තියෙන බාහිර සමාජය පිරිසිදු බවින් වැඩි, දූෂිත බවින් අඩු සමාජයක් නම් එතකොටත් ලැබෙන විපාකය බලවත් වෙනවා.** මොකද ඒකෙන් යහපත් සමාජයක් දූෂිත බවට පත්වෙන්න මූලාරම්භය සපයනවා. සමාජයේ ඉන්න අනිත් අය ඒ සිද්ධිය දැකල



දූෂිත බවට පත්වෙන්න, ඒ කාරණය උපනිශ්‍රය වෙන්න පුළුවන්. මෙතනදී ඒ පුද්ගලයාට පාප විපාක වශයෙන් ක්‍රම දෙකක් ක්‍රියාත්මක වෙනවා. එකක් තමයි ඔහු ලෝකයාට පොදුවේ කරපු අවැඩ අසාධාරණයට විපාක විඳින්න සිද්ධ වීම. අනෙක් කාරණය සතාට පුද්ගලිකව කරපු අසාධාරණයට වන්දි ගෙවන්න සිද්ධ වීම. මෙතනදී දසදහසක් සක්වලට පතුරපු දූෂ්‍ය ශක්තිය කපන්න නම් ඒ බව දැනගෙන ඒ දසදහසක් සක්වලටම මෙත් වඩන්න ඕන. එහෙම වුනොත් ඒ පුද්ගලයාට විපාකය ගෙවිල යම් ගැලවීමක් ලැබෙනවා. නමුත් ද්වේශ සහගත පුද්ගලයා ඒක කරන්නෙ නැතිව විෂම පතුරුවනවා. මේ නිසා ඒ පුද්ගලයාට මෙත් වඩල ගෙවා ගන්න තියෙන ක්‍රමය නැති වෙලා, ඒ විපාකය විඳලම ගෙවන්න සිද්ධ වෙනවා. එහෙම විපාක විඳින්න ගියොත් අනන්ත කාලයක් ගෙවන්න වෙනවා. මොකද මාත්‍රයක් ගානේ විශ්වයට පිට කරපු විෂ කිරණ ඒ තරම් බලවත්. එක මාත්‍රයකට කරපු පාඩුවත් ඔහු විඳින්න ඕන. එතකොට නැවත වාරයක් පාසා විපාකය ගෙවෙන කල්, ලෝකයට විවිධ ක්‍රමවලින් ඒ වන්දිය ගෙවන්න වෙනවා.

ඊළඟ කාරණය තමයි යමෙක් ප්‍රාණඝාතයක් කළොත් ප්‍රාණඝාත නොකරන පිරිස්, ඒවගේම ඒ ප්‍රාණියාට පක්ෂපාතී පිරිස් ඒකට සාප කරනවා. ඒ කියන්නෙ සමාජයේ සත්ව ඝාතනයට විරුද්ධ පිරිස් ඉන්නවා. ඒ වගේම සතුන්ගෙන් වැඩ ගන්න, උන් දේවත්වයේ ලා සලකන පිරිස් ඉන්නවා. මේ විදියට ඊට විරුද්ධ පිරිස ''මේක හෙණ ගහන අපරාධයක්'' කියල සාප කරනවා. ඒකෙන් විපාකය තවත් බලවත් වෙනවා. ඒ වගේම ඒ සතාගෙන් යැපෙන පිරිස් ඉන්නවා. යැපෙන පිරිස් කිව්වමත් කොටස් 2 ක්. එකක් ඒ සතාගෙන් වැඩ කරගන්න මනුස්ස පිරිස. අනෙක ඒ සතාගෙන් යැපෙන පැටව් ආදී ඥාති කොටස්. මේ කොටස්වල සාපයත් වදිනවා. මනුස්ස ලෝකයේ වුනත් යම්කිසි සමාජයක පුද්ගලයෙක් මැරුවොත් ඒ පුද්ගලයාගෙන් යැපෙන, ඔහුට පක්ෂපාතී කොටස් අර මිනීමරුවන්ට සාප කරනවා. මේක අපිට අදත් දකින්න ලැබෙන කාරණයක්. මේ වගේ තමයි සතෙක් මැරුවමත්, අපිට පේන්නෙ නැතිවට ඒ සාපය වදිනවා.

ඊළඟ කාරණය තමයි මේ **සත්තු අතරත් පාරමිතා පුරන බෝසත්වරු ඉපදිල ඉන්නවා.** ඒ කියන්නෙ ගුණ මහත්වයෙන් වැඩි සත්තු ඉන්න පුළුවන්. ඒක අපිට තේරෙන්නෙ නෑ. සතෙක් වුනත්

සංසාරේ පුරපු පාරමිතා ශක්තීන් අනුව, ගති ලක්‍ෂණ අනුව ගුණ මහත්වය කියන එක පිහිටනවා. සමහර සතුන්ට ගහනකොට උන් අතරත් තියෙන ඒ ගති ලක්‍ෂණ අනුව අපි කියනවා ''මේක අහිංසක සතා .... අනේ මූට ගහන්න එපා ....'' ආදී වශයෙන්. සමහර බල්ලො ඉන්නවා බුරාගෙන නැට්ට වනාගෙන බොහොම ගරුත්වයෙන් එනවා. සමහර වෙලාවට ඇවිත් ඉස්සරහ කකුල් දෙක දණ ගහල යම් කිසි ලෙන්ගතු බවක් දක්වනවා. එතකොට ඌට ගහන්න හිතෙන්නෙ නෑ. ඒ වගේම සමහර සත්තු මිනිස්සුන්ට රැකවරණ සලසනවා. බල්ලන් අතර ඒක විශේෂයෙන් දකින්න පුළුවන්. සමහර එවුන් හපාකන්න පනිනවා. තවත් සමහරක් එවුන් රැකවරණ සලසනවා. මේ ක්‍රම 2 ක්. හපාකන්න පනින එකාට ගහන්න හිතෙනවා. රැකවරණ සලසන එකා ගැන අනුකම්පාවක් ඇති වෙනවා. මේ වගේ **යම්කිසි ගුණයක් වඩපු, මිනිස්සුන්ට උදව් කරන විවිධාකාර සත්තු ඉන්නවා.**

මේ වගේ සිද්ධියක් මේ ළඟදී අහන්න ලැබුණා. එක්තරා ස්වාමීන් වහන්සේ නමක් වැඩ ඉන්න පන්සලක හිටපු බල්ලෙකුට කකුල්වල ප්‍රධාන ඇඟිලි 5 බැගින් තිබුණා. ඒ වගේම ඒවා මහ ලොකු කකුල්. සාමාන්‍යයෙන් බල්ලෙකුට ප්‍රධාන ඇඟිලි 4 යි තියෙන්නේ. මේ නිසා මූ බැලු බැල්මට විශේෂ බල්ලෙක්. මේ පන්සලේ ඉන්න ලොකු හාමුදුරුවො දවසක් පන්සල් වත්තට සම්බන්ධ පාලමක් ළඟ කරපු ඉදිකිරීමක් බලන්න ගියා. කොන්ක්‍රීට් එකක් දාල තිබුණු තැනින් වතුර පාර ගලාගෙන යනවද කියල බලන්න උන්වහන්සේ පාලම අද්දරට අඩිය තියන කොට මේ බල්ලා එක පාරටම දුවගෙන අස්සෙන් ඇවිත්, උන් වහන්සේ කකුල් ලිස්සල වැටෙයි කියල ඇඟට හේත්තු වෙලා එහාට තල්ලු කළාලු. මේ විදියට ඌ ඒ ස්වාමීන් වහන්සේගේ ඉස්සරහින් ගිහින් හරහට ඉඳගෙන ආරක්‍ෂාව සපයල තියෙනවා. ඌට කියල දීලත් නෙවෙයි. එතනදී සතාටත් ඇතිවෙච්ච හැඟීමක හැටි.

ඒ වගේම මීට බොහෝ ඉස්සර කාලයක එක්තරා ගමක ඇත්තු ඇති කරන ගෙදරක වෙච්ච සිදුවීමක් තමයි මේ. ඒ ඇත් ගොව්වා මත්පැන් පානය කරල ඇතාගෙ පිටේ ගිහින් ඌ නාවන ලොකු වලක් ළඟකදී වළට වැටුණා. මේ වෙලාවෙදි ඇතා හොඬ වැල දාල ඇදල ගන්න බැලුවත් අහුවෙලා නෑ. පස්සෙ මේ ඇතා විගහට පැනපු ගමන් මහ අත්තක් කඩාගෙන ඒ අත්ත අර වළට දාල කැලතෙව්වා. ඇත්ගොව්ව කොහොම හරි දඟලන කොට අත්ත අහුවුණාම ඒක පිටින්ම ඇතා ඔහුව ඇදල ගත්තා. ඌ එහෙම අරගෙන නිකන් හිටියෙ නෑ. හොඬවැලින් මේ ඇත්ගොව්වව උස්සගෙන එක දිගට ඇතා හිමිකරුගෙ ගෙදරට දුවගෙන ආවා. ඇවිත් ඇතා හිමිකරු ළඟ බිමින් තිව්වා. මේ සිද්ධිය දැකපු වටේ හිටපු මිනිස්සු ඇතාට පිස්සු හැදිල ඇත් ගොව්වා මරල ගෙනාවයි කියල හිතන් බයේ පැනල දිව්වා. නමුත් පස්සෙ තමයි ඇත් ගොව්වට සිහිය ආවේ.

ඒ වගේම අපි අහල තියෙන පනාමුරේ ඇතා ගත්තොත් උගෙත් විශේෂත්වයක් තිබුණා. ඌ අනෙක් ඇතුන්ට මෙල්ල කරන්න බැරිවුණා. මේ ඇතාගේ රැකවරණය යටතේ තවත් අලි ඇත්තු විශාල සංඛ්‍යාවක් හිටියා. නමුත් මිනිස්සු උන් හීලෑ කරගන්න අල්ලන්න හදනකොට මේ පනාමුරේ ඇතා උන්ට රැකවරණ දීලා ආරක්‍ෂා කළා. පස්සෙ වෙනත් කීකරු ඇත්තු දාලා මේ ඇතා මෙල්ල කරල අල්ලන්න හැදුවත් ඒත් බැරිවුණා. ඒ තරම් ශක්තිමත්. ඒ වගේම ගජමුතු තිබිච්ච මහ සද්ධන්ත කුළයේ ඇතෙක්. කොහොම හරි ඌ අනෙක් අලි ඇතුන්ගෙන් වෙන් කරන්න මිනිස්සු උපක්‍රම යොදල අන්තිමට ඌට විතරක් යන්න කඩුල්ල ඇරියා. නමුත් ඌ උපක්‍රමශීලීව අනෙක් අලි ඇත්තුත් හොඳින් වටකරගෙන එතැනින් ඉවත් කරගත්තා මිසක් තමන්ගෙ රැළේ එවුන් දාල ගියේ නෑ. ඒ වගේම මිනිස්සුන්ට පහර දෙන්න ගියෙත් නෑ. මේ නිසා මිනිස්සුන්ට අනෙත් ඇත් පැටවු ටික අල්ලගන්න බැරුව ගියා. මේ විදියට ඇත්තු මෙල්ල කරන සියලු තාක්‍ෂණික උපක්‍රම දාලත් අල්ලගන්න බැරි වෙච්ච තැන අවසානයේ මේ ඇතා වෙඩි තියල මරල දැම්මා. ඒ මරපු එකේ සාපය කොච්චරද කියනව නම් වෙඩි තියපු කෙනාගෙ පරම්පරාවම වැනසිලා ගියා. මේ ඇතාගෙ ගති ලක්‍ෂණ හා ශරීර ලක්‍ෂණ දිහා බැලුවම බොහෝ විට බෝසත් ඇතෙක් කියල නිගමනය කරන්න පුළුවන්. එහෙම ඇතුන්ගෙ විශේෂ ලක්‍ෂණ තියෙනවා. ගජමුතු තියෙන මහ සද්ධන්ත කුලවල ඉන්න ඇත්තු වීම, අනෙක් සතුන්ට වඩා ශක්තිමත් වීම, තමන්ගේ රැළ රැකීම, තීක්‍ෂණ නුවණ පැවතීම කියන කාරණා මේ අතර විශේෂයි. ඒ වගේම තමන්ගෙ රැළේ එවුන් තනිකරල ඌ තනියම බේරෙන්නෙ නෑ. මේ තමයි බෝධිසත්ව ඇත්තුන්ගෙ හැටි.

මේ වගේ **අපේ මහ බෝසතාණන් වහන්සේ පාරමිතා පුරන කාලයේ නොයෙක් තිරිසන් අත්බැව්වල ඉපදිලා තමන්ගේ රැළට නායක වෙලා උන්ව රැකගෙන, අනෙක් සතුන් අතරින් නොයෙක් කැපී පෙනෙන විශේෂ ලක්‍ෂණ පෙන්නුම් කරල තියෙනවා.** ඒ විදියට බෝසත් වඳුරෙක් වෙලා තමන්ගෙ රැළ බේරගත්තු හැටි, විලට නොබැස දිය රකුසාගෙන් බේරී බට පුරුක්වලින් වතුර බීපු හැටි .... ආදී කතා ගොඩක් තියෙනවා.

ඒ වගේම සමහර දඩයම් කරන වර්ගයේ සත්තු අතර එසේ නොකරන සත්තුත් ඉන්නවා. උදාහරණ විදියට සමහර බල්ලො බළල්ලු දඩයම් කරන්නෙ නෑ. උන්ට මොනව හරි ලැබිච්ච දෙයක් කනව මිසක් සත්තු පෙනී පෙනී ගියත්, ඇඟ උඩින් පැනල ගියත් දඩයම් කරන්නෙ නෑ. මේ වගේ දේවල් අදත් අපිට දකින්න ලැබෙනවා. සමහර විට ප්‍රතිවිරුද්ධ සත්තු බොහොම සමගියෙන් සමාදානයෙන් එකට ජීවත් වෙනවා, එකට බෙදාගෙන කනවා. මේ මෑත කාලයේදී ගිරවෙකුයි බළලෙකුයි එකට හිටපු කතාවක් අහන්න ලැබුණා. ගිරව බළලගේ ඔළුව කකුලෙන් හිමිහිට කහනවා, පහුරු ගානවා. ඊට පස්සෙ බළල ගිරවගෙ කකුල් ලෙව කනවා. නමුත් මේවා සාමාන්‍යයෙන් සිද්ධ වෙන දේවල් නෙවෙයි. සසරදී වඩපු සමගි සම්පන්න බව මේ විදියට තිරිසන් වෙලත් ක්‍රියාත්මක වෙනවා.

මේ වගේ සත්තු වෙලත් මිනිස්සු එක්ක බොහොම ළඟින් ඇසුරු කරන සත්තු ගැනත් අහන්න ලැබෙනවා. එක් අවස්ථාවක බෝසතාණන් වහන්සේ නමක් බමුණෙක් වෙලා අත්බැව් ගතකරපු කාලයක රත්රන් පාට කකුළුවෙක් බොහොම ලෙන්ගතුව ඇසුරට වැටිච්ච සිද්ධියක් අපේ පැරණි දහම් කතාවක සඳහන් වෙනවා. මේ කකුළුවා බමුණා බලන්න හරි ආසයි. ඌ ඉන්න විල දිහාවට බමුණා එනකොට කකුළුවත් එතැනට එනවා. බමුණත් ඌට බොහොම ලෙන්ගතුකමින් කෑම ගෙනත් දෙනවා, අත දුන්නම ඌත් අත දෙනවා. බමුණා ඌ අරගෙන ඔඩොක්කුවේ දාගෙන කුඹුර වටේ ගිහින් අර විලට නැවතත් ගෙනත් දානවා. මේ විදියට කරන පුරුද්දක් තිබුණා. දවසක් නයෙක් ඇවිත් මේ බමුණට දෂ්ඨ කරල සිහි නැතිවුණාම, කකුළුවා නයාගේ බෙල්ලට පැනල නයා ලවා ඒ නයි විස ඉරෙව්වම බමුණට නැවතත් සිහිය ආවයි කියලත් සඳහන් වෙනවා. මේවා අද අපට සුරංගනා කතා වගේ පෙනුනට, අද රටේ ලෝකෙ සත්තු අතර සිද්ධ වෙන අසාමාන්‍ය ගණයේ සිදුවීම් දිහා බැලුවම වෙන්න බැරි දේවල් නෙවෙයි.

**එහෙනම් මේ වගේ ගුණ වඩපු, අපට රැකවරණ සලසන සතෙකුට ගහන්න රිදවන්න නම් මනුස්සයෙකුගේ හිතක් කොච්චර දරුණු වෙන්න ඕනද? දෙමව්පියො දරුවන්ට කන්න බොන්න දීලා තමන්ගේ ජීවිතත් පරදුවට තියල**

**ඔක්කොම රැකවරණ සලසනවා. ඒ වගේ දෙමව්පියන්ට ගහන්න බනින්න නම් දරුවො කොච්චර රෞද්‍ර වෙන්න ඕනද ? සාමාන්‍ය දරුවෙකුට කරන්න පුළුවන් දෙයක්ද ? විශාල රෞද්‍රකමක් නැත්නම් ඒ වැඩේ කරන්න බෑ.** මේ වගේ යමෙකුගේ තියෙන අධික රෞද්‍රකම නිසා තවත් කෙනෙකුගේ ගුණ හඳුනන්නෙ නැතිව යනවා. ඒ නිසා ඒ පුද්ගලයා ගුණ මහත්වය නොතකා තමන්ට රැකවරණ සලසන අයටත් හිංගි හිංසා කරනවා. ඒ නිසා සාපය වැඩි වෙලා ඒ පුද්ගලයාට එන විපාකයත් වැඩිවෙනවා.

සත්තු ගත්තමත් විවිධාකාරයි. උන් අතරත් මේ විදියට ගුණ හීන, ගුණ මහත් කියන එක තියෙනවා. හැබැයි ඒක පිටින් බැලුවට එක පාරට පේන්නෙ නෑ. ගති ගුණ යම් සේද ගති රුව හා ගති හඬ ඊට අනුකූලයි. සත්තු අතරත් මේ වෙනස තියෙනවා. ගති රුව දැක්කම ගති ගුණ එතැනින් මතු වෙනවා. ඒක විපාක ගතිය. **මේ වගේ ගුණ වඩපු සත්තු අතර මතු බුදුවරයන් වහන්සේලාගේ අග්‍ර ශ්‍රාවිකාවන්, මහා ශ්‍රාවිකාවන් වෙච්ච අයත් ඉඳල තියෙන බව ධර්මයේ සඳහන් වෙනවා.** නමුත් අනන්ත සංසාරයේ කරපු යම් යම් අවැඩ අසාධාරණකම් නිසා ඒ අයත් තිරිසන් ගෝත්‍රවල ඉපදෙනවා. එහෙම වුනත් අර වඩපු ගුණ නැති වෙන්නෙ නෑ, යටපත් වෙලා තියෙනවා. මේ වගේ පෙර බුදුවරයන් වහන්සේ නමක් වඩින කොට එක්තරා ඊරියක් දැකල උං පෙන්නල, අනාගත බුදුවරයන් වහන්සේ නමකගේ ශාසනයේ අග්‍ර ශ්‍රාවිකාවක් වෙනවයි කියල දේශනා කරල තිබුණා. ඉන්පසු අත්බවයක ඒ ඊරිය කිකිළියක් වෙලා එතකොටත් ඒ වගේ බුදුවරයන් වහන්සේ නමක් දැකල, අනාගතයේදී බුදුවරයෙකුට අග්‍ර ශ්‍රාවිකාවක් වෙනවයි කියල දේශනා කරල තිබුණා. ඒ සියලු කාල වකවානුවන් පසු කරමින් මේ තිරිසන් වෙලා ඉපදිච්ච තැනැත්තිය ඒ කියපු විදියට ගෞතම බුද්ධ ශාසනයේ අග්‍ර ශ්‍රාවිකාවක් වෙලා ඉපදිලා දිවැස් පහළ වුණාට පස්සෙ, අර පෙර අත්බැව්වල කතාවන් ඒ තෙරණින් වහන්සේ විසින්ම විග්‍රහ කළා. දැන් එතකොට බැරිවෙලාවත් එදා ඒ ඊරිය හෝ කිකිළිය යම් කෙනෙක් මරාගෙන කෑවනම් සාමාන්‍ය වෙනත් සතෙක් මරාගෙන කනවට වඩා විපාකය බලවත් වෙනවා. මේ වගේ ඒ කාලෙත් එහෙම සත්තු හිටියා. අදත් ඉන්නවා. ඒ කාරණය අපට පේන්නෙ නැති වුණාට ලොව්තුරා බුදුපියාණන් වහන්සේලාට කෙස් ගහටම දකින්න පුළුවන්.

ඉතින් මෙන්න මේ වගේ කාරණා නිසා කිසිම සතෙකුටවත් ගහන්න මරන්න යන්න හොඳ නෑ. බැරිවෙලාවත් ඒ අය අතරෙත් ගුණ යහපත් සත්තු හිටියොත් මහා විපාකයන්ට මතු අත්බැව්වලදී තමන්ට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ වගේම මහ බෝසතාණන් වහන්සේ නමක් වුණත් නියත විවරණ ගත්තට පසුවයි වටුවෙකුට වඩා කුඩා සතෙක්වත්, අලියෙකුට වඩා විශාල සතෙක්වත් වෙලා ඉපදෙන්නෙ නැත්තෙ. එහෙනම් නියත විවරණ ගන්න පෙර බෝසත් පාරමිතා පුරන අය අදත් සත්තු වෙලා අපි අතර ඉන්න පුළුවන්. ඒ අය වටුවෙකුට වඩා කුඩා සත්තු විදියටත් අලියෙකුට වඩා විශාල සත්තු විදියටත් උපදින්න පුළුවන්. බෝසත්වරු නමුත් තිරිසන් වෙනවා. මේ නිසා සතෙකුට වුනත් හිංගි හිංසා කළාම විපාකය වැඩිවෙන්න මේ කාරණයත් හේතුවක් වෙනවා.

මීට අවුරුදු කිහිපයකට උඩදී එක්තරා ප්‍රදේශයක හිටපු පුද්ගලයෙක් බැල්ලියෙකුට ඇඟිල්ලෙන් ඇනලා ඒ පුද්ගලයාගේ ඇඟිල්ල උළුක් වුණා. ඊට පස්සෙ ඒ ඇඟිල්ල නවන්න බැරිව ගියා. ඒකට බෙත් හේත් කළත් හොඳ කරන්න බැරිව ගියා. මැරෙනකල්ම ඒ විදියට ඇඟිල්ල උළුක් වෙලා තිබුණා. මේ තමයි විපාකයක හැටි. කරන කලට පව් මිහිරිය මීසේ - විඳින කලට දුක් දැඩි වෙයි ගිනි සේ කියල කිව්වෙත් මෙන්න මේ කාරණා නිසා තමයි. සතෙකුට වද දෙන කොට, ගහන කොට, මරණ කොට අපට පේන්නෙ නැති පැතිකඩවල් කිහිපයක් මේ විදියට ක්‍රියාත්මක වෙනවා. මේ නිසා මේ සැඟවිච්ච කාරණාවන් ධර්මානුකූලව දැනගෙන මේ සංසාරයේ තියෙන භයානකත්වය වටහා ගන්න උත්සාහ කිරීම වැදගත්. දැන් එහෙනම් අර එළිච්චියකගේ හිස සිඳපු එකට ඒ තැනැත්තියට ඒ වගේ විපාකයන්ට මුහුණ දෙන්න සිද්ධ වුනේ ඇයිද කියන කාරණය පැහැදිලි වෙනවා.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# හෙළ බොදු පියුම දහම් සඟරාවේ 18 වන කලාපය සඳහා ශ්‍රමය හා මූල්‍යමය දායකත්වය සැපයූ පිංවතුන්

**ශ්‍රම දායකත්වය** ♦ ධම්මික සේනාධීර මහතා - නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ ♦ අසංග මංජුල කුමාර මහතා - හෝමාගම ♦ සමන් සිල්වා මහතා - කළුතර ♦ ඩී.සී.ආර්. ඇක්සස් මුද්‍රණාලයේ චන්දිම පෙරේරා මහතා ඇතුළු කාර්ය මණ්ඩලය - පිටකෝට්ටේ ♦ එස්.එම්. ජයසේකර මහතා - මාලබේ ♦ චන්දන සිරිවර්ධන මහතා - අලපලාදෙනිය ♦ ඩබ්.ඒ. තිළිණවතී මහත්මිය - කඩවත ♦ අමිත් හඳුගොඩ මහතා - අත්තිඩිය ♦ ඉමාෂි මුද්‍රණාලයේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ♦ නන් අයුරින් දායක වූ පින්වතුන්

**මූල්‍යමය දායකත්වය** ¤ ප්‍රියනාත් ආරියරත්න මහතා ඇතුළු පවුලේ සැම - කුරුණෑගල - රු. 20,000/- ¤ සමන් සිල්වා මහතා - කළුතර - රු. 15,000/- ¤ ඩබ්. ඒ. තිළිණවතී මහත්මිය ඇතුළු පවුලේ සැම - කඩවත - රු. 10,000/- ¤ බිනග සමාධිත් සිල්වත්ගෙ පුතා ඇතුළු පවුලේ සැම - බත්තරමුල්ල - රු. 6,000/- ¤ අමිත් හඳුගොඩ මහතා - අත්තිඩිය - රු. 5,000/- ¤ චරිත් ඉන්දික මහතා - ඉතාලිය - රු. 5,000/- ¤ ස්වර්ණා සෝමරත්න මහත්මිය ඇතුළු පවුලේ සැම - දඹුටුව - රු. 5,000/- ¤ මාලනී මාභරණ මහත්මිය ඇතුළු පවුලේ සැම - මෙල්බන් නුවර - ඕස්ට්‍රේලියාව - රු. 5,000/- ¤ ඔස්ටින් ප්‍රනාන්දු මහතා සහ සිසිර සිරිවර්ධන මහතා -පොල්ගහවෙල - රු. 5,000/- ¤ ජෙරාඩ් ප්‍රනාන්දු මහතා - පිළියන්දල - රු. 5,000/- ¤ තුසිත නාකන්දල මහතා - ගල්කිස්ස - රු. 5,000/- ¤ ගයාන් ගුණරත්න මහතා ඇතුළු පවුලේ සැම- ගොතටුව - රු. 3,000/- ¤ බිහාන් සුදුසිංහ පුතා ඇතුළු පවුලේ සැම - පානදුර - රු. 2,500/- ¤ සුජීවනී ජයවර්ධන මෙනෙවිය - පාදුක්ක - රු.2,500/- ¤ කේ. ඒ. ජයරත්න මහතා - හොරතුඩුව - රු. 2100/- ¤ චන්ද්‍රකුමාර මෙන්ඩිස් මහතා - අහුන්ගල්ල - රු. 2,000/- ¤ පුබුදු ශ්‍යාමික මහතා -

☞

නිට්ටඹුව - රු. 2,000/- ¤ ඩී. කේ. විජේසූරිය මහතා - අළුබෝමුල්ල - රු. 2,000/-¤ ඩැනී වර්ණසූරිය මහතා - ගම්පහ - රු. 2,000/-¤ සාලින්ද ජයවර්ධන මහතා - මාලබේ - රු. 2,000/-¤ රේණුකා ගුණරත්න මහත්මිය සහ චතුරිකා ගුණරත්න මහත්මිය ඇතුළු පවුලේ සැම - ගොතටුව - රු. 2,000/-¤ මානෙල් කටුගම්පල මහත්මිය - මහරගම - රු. 2,000/- ¤ කෝෂලා සිරිවර්ධන මෙනෙවිය - ගාල්ල - රු. 2,000/- ¤ අයිරාංගනී තිලකරත්න මහත්මිය - නාවල - රු. 1,500/-¤ එන්.ටී.එන් නන්දිම ප්‍රියලාල් මහතා ඇතුළු පවුලේ සැම - වඳුරඹ - රු. 1,500/- ¤ රංජනී සුගතපාල මහත්මිය - බත්තරමුල්ල - රු. 1,100/-¤ ඉන්ද්‍රානි විශාකා ජයසිංහ මහත්මිය - බොරලැස්ගමුව - රු. 1,000/- ¤ එම්. කේ. ඥානවතී මහත්මිය - කොට්ටාව - රු. 1,000/- ¤ එම්. එස්. ගලප්පත්ති මහත්මිය - මාලබේ - රු. 1,000/- ¤ එච්. පී. විජේරත්න බෝයගොඩ මහතා - කිරුලපන - රු. 2,000/- ¤ ප්‍රසන්න සිල්වා මහතා - ගල්කිස්ස - රු. 1,000/- ¤ එච්.ඒ.ඩී.සී. කුමාර මහතා - ඇස්වත්ත - රු. 1,000/- ¤ වාසනා වීරසිංහ මහත්මිය - බියගම - රු. 1,000/- ¤ ප්‍රියන්ත වාහලවත්ත මහතා - කළුබෝවිල - රු. 1,000/- ¤ අසංක ප්‍රේමතිලක මහතා - මරදගහමුල්ල - රු. 1,000/- ¤ ජාලිය ගොඩගේ ධර්මදාස මහතා - බැදිගම - රු. 1,000/- ¤ සී. එම්. පී. සී. ලක්රුවන් මහතා - කළුතර - රු. 1,000/- ¤ ඩබ්. මාග්‍රට් මහත්මිය සහ කේ. එල්මෝනිස් මහතා - වරකපොල - රු. 1,000/- ¤ මනෝජ් ජයසූරිය මහතා - මහරගම, රංජිත් වික්‍රමසිංහ මහතා - කඩිගමුව, උපුල් විජේනායක මහතා - මාවනැල්ල, ඉසුරු සම්පත් මහතා - කළුතර, කුමාරි ගොඩවිට මහත්මිය - කුරුණෑගල, පතිරණ විජේතිලක මහතා - හෝකන්දර, සුජාතා දසනායක මහත්මිය -දෙහිවල, රංජිත් සමරකෝන් මහතා - මත්තේගොඩ, චන්දිම ගුණදාස මහතා - මොරටුව, ශාන්ත මාරසිංහ මහතා - මහනුවර, දුමින්දා සංජීවනී මහත්මිය - නිට්ටඹුව, සුභාෂිනී අබේරත්න මහත්මිය - වත්තල, ජිනදාස පටබැඳිගේ මහතා රු. 9,000/- ¤ වෙනත් පිංවතුන්ගෙන් ලද මුදල - රු. 275/- ¤ එකතු වූ සියළු මුදල් පරිත්‍යාග රු. 138,475/- ¤ පළමු පිටපත් 7000 සඳහා මුද්‍රණ වියදම රු. 154,000/- ¤ අනෙකුත් වියදම් - 11,050/- ¤ සම්පූර්ණ වියදම - රු. 165,050/- මුද්‍රණ කටයුතු සඳහා ගිය හිඟ මුදල සඟරා අලෙවියෙන් පියවා ගන්නා ලදි.

**ඉහත නම් සඳහන් පිංවත් පිරිස ඇතුළු ආධාර උපකාර කළ සියලු දෙනා සිදු කරගත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද හේතු කොටගෙන, අනන්ත සසරේ පටන් මේ දක්වා තම තමන් අතින් අවැඩ, අසාධාරණ, වැරදි, ප්‍රමාද දෝෂවලට ලක් වූ සියලු දෙනාට මෙන්ම උදව් උපකාර කළ සැමටත්, මියගිය සතර වර්ගයක ඥාති මිත්‍රාදීන්ටත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද විහිදී පැතිරී පිහිටා සුඛිත මුදිත වෙත්වා, සුගතිගාමීව තම තමන්ගේ පැතුම් පරිදි නිර්වාණාවබෝධයටද හේතු වාසනා වේවා!**

**එම ආධාර උපකාර කළ පිංවත් පිරිස් ඇතුළු සිය පවුල්වල සැමටත්, කරන කියන යහපත් රැකී රක්ෂා ව්‍යාපාර ආදියෙන් සියලු ජයග්‍රහණයන් අත් වේවා. දූ දරුවන්ගේ අධ්‍යාපන ආදී කටයුතුවලින් විශිෂ්ඨ ජයග්‍රහණ අත් වී සුචරිත පිරිසක් වී සියලු අභිවෘද්ධිය උදා වේවා!**

**සියවස් ගණනාවකට පෙර සැඟව ගිය නිමල බොදු මග යළි පුබුදුවමින්,**
**හෙළ බොදු පියුම දහම් කරුණු ඔබ වෙත රැගෙන එන්නේ, බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළ,**
**අග්ගඤ්ඤ සූත්‍රය, නිරුක්තිපථ සූත්‍රය සහ අරණවිභංග සූත්‍රය යන සූත්‍රාන්තයන්ට අනුව,**
**දහම් පදවල සැඟවුණු දහම් අරුත් මතු කරන පද නිරුක්ති සහ**
**අතීතය, වර්තමානය, අනාගතය හඟවන තුන්කල් නිරුක්ති සහිත ව්‍යවහාර ශබ්ද**
**නිරුක්ති ක්‍රමවේදය අනුව මිස, උන්වහන්සේ අනුමත නොකළ ලිඛිත භාෂා රීති සහිත**
**බමුණන්ගේ ත්‍රිවේද නිරුක්ති මත නොවන බව සලකන්න.**

**පින්වත් ඔබ වෙනුවෙන් එළි දැක්වූ දහම් ගබඩාවන්...**

www.hiddendhamma.net mp3.hiddendhamma.net www.helabodhupiyuma.net www.aaryadharma.org
විද්‍යුත් ලිපිනය: webmaster@helabodhupiyuma.net දු.අ:- 071 3046895

**සැඟවුණු බොදු මග යළි විවර කරමින් වහරක අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානයේ සදහම් වැඩසටහන් පැවැත්වෙන කාල හෝරාවන්:**

සැම පුන් පොහෝ දිනකම සහ සැම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා - පෙහෙවත් සමාදානය, දහම් සාකච්ඡා සහ විශේෂ පුණ්‍යානුමෝදනාව.

ගමන් මාර්ගය: නිට්ටඹුව - රුවන්වැල්ල ප්‍රධාන මාර්ගයේ ගෝණගල්දෙනිය හන්දියේ සිට වහරක අතුරු මාර්ගයේ මීටර 350 ක් පමණ දුරින් දකුණු පස.




**සැම පුන් පොහෝ දිනකම සහ සැම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා පැවැත්වෙන සදහම් වැඩසටහන් මාලාව සජීවීව විකාශනය කෙරෙන අන්තර්ජාල ගුවන් විදුලි සේවාවට සවන්දීම සඳහා www.waharaka.com වෙබ් අඩවිය ඔස්සේ ''දම් සභා ගුවන් හඬ''ට පිවිසෙන්න.**



# තැනේ හැටියට ඇණේ ගැසීම

පසු පස පන්නමින් කෙනෙකුට කියන බණ
නුසුදුසු වෙමැයි නියමෙට බුදු දහමෙ එන
විසුවද තමන්ගේ නෑ හිතවතෙකු මෙන
අසුවෙන විටදී තැන නොතැනද බලනු මැන

අල්ලපු වැටේ හිටියත් සූකර චුන්දා
දල්වපු පහන බුදු හිමි නොදුනේ මන්දා
හොල්ලපු ගමන් කට නිරයට යන හින්දා
ඉල්ලපු විගස හිමි එහි නොවැඩම ඉන්දා

මග තොට යනෙන අය නවතා බණ කීම
වගතුග නොදැන ලොව තතු ගෙන හැර පෑම
අග මුල මැද නැතිව දම් පහදා දීම
ගඟකට කැපුව ඉනි මෙනි අපතේ යෑම

තමනට ඇති උගත්කම හා දැනුම කියා
හැම තැන බණ කියන්නෝ නොම දනිති නියා
හමනට මිසක් තම අණසට නිවන සොයා
නොම යන දනන් නැත හරයක් ලොවට තියා

නියම කල නියම කෙනෙකුට නියම තැන
ජයම ගෙනෙන දම් බිඳකද අගය ගැන
කියන විටදී වැටහෙන්නට කරුණු දෙන
අයම තමයි ලොව දල්වන පහන නැණ

බණේ එන භවය නසනා කියන ගුණේ
දැනේ නම් එයයි බුදු බණ අසන සැණේ
තැනේ හැටි බලා කියනා සුදුසු බණේ
ගෙනේ නිවන් සුව ලොව බොහො කල්ද දිනේ

යන එන ගමන මුත් ලොව පැසසුම් නොබලා
දැන ගෙන සතගෙ සිත යන ගුණයට තබලා
බණ ගැන කියන විට අවබෝධය ලබලා
නැණ ගුණ වැඩේ නම් දම් මග යයි ඔබලා

නෙක සව් සතන් හට ඇති නෙක නෙක නුවණ
දැක දැන කිවොත් බණ හැඟවෙනු වස් නිවන
දුක නැති තැනක් ඇති බව වැටහුම් දෙවන
සැක නැත බණක් වෙයි එය සුමගට යවන

පබැඳුම - හිනිඳු වන්දන සිරිවර්ධන

# ශුභ අලුත් අවුරුද්දක් ?

තුන්සිය හැටපස් දිනකට සැරයක් සමරන බක් මහ අවුරුද්දේ
උන් හැම එකතුව අසිරි පතාගෙන දින දෙකකට දැමුවද සද්දේ
දුන් දෙය යට ගොස් තිරිසන් ගතියට පෙර ලෙසටම මනු සිත ඇද්දේ
ගෙන් ගෙට අවුරුදු කුමරු වඩිනවලු මනු ලොව දුසිරිත් හඬ මැද්දේ


හෙළ සිරිතට පෙර සිට පැවතෙන නව අවුරුදු සිරිතෙහි අරුත වසා
මිලයට හැඩයට යන පර සිරිතට වැලට බලටු ලෙස අසුරු ගසා
මළ පිඬකට බට නිල මැසි කැල ඉන් රසය ලෙසට කුණු අදින ලෙසා
කල එන තෙක් නව බක් මහ නැකතට සුබයි කියයි හිස් රසය නිසා

රහ මෙර සුදුව මුල් තැන කරගෙන සමරන බක් මහ නැකත බලා
වහගෙන ඇස කන යළි නොවඩින ලෙස යනවලු අවුරුදු කුමරු පලා
දහමට සරිකොට පෙර කල සැමරුව අවුරුදු සිරිතෙහි ගුණය හලා
අහනට සිදුවන දුක් සෝ සුසුමන් පෙර නැති ලෙස අද වැඩිම වෙලා

යල මහ කන්නය ගොවිතැන් බත් කර අටු කොටු පිරවූ පෙර දවසේ
බල වැඩි තුන් සරණය මුල් කරගෙන සියලු සතට දුන්නයි සුව සේ
කලකදී එසිරිත් ඉවතට දා ගුණ වැනසෙන පර සිරිතෙහි ගැවසේ
පැලට ද සාමය සතුට ගෙනා පෙර අවුරුදු සිරි අද නැත නිවසේ

එදා මෙදා තුර සුබ නව වසරක් වේවා යනුවෙන් පැවසූ වරේ
හදා බලොත් කොපමණ සැරයක් දෝ දහස් වරකි ඒ අතර තුරේ
මෙදා නමුත් කාටද සුබ වූයේ අසාර වූ මේ සසර තෙරේ
විදා නොබැලුවොත් සුබ අසුබය ගැන පද වැල් පමණකි නොමැත හරේ

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන



නීතිඥ චන්දන සිරිවර්ධන විසින් නුගේගොඩ ගංගොඩවිල වනාත පාරේ අංක 96/A දරණ ස්ථානයේ පිහිටි ඉමාෂි මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.